# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් www.budusarana.lk email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ක් වූ පොසොන් අමාවක පෝ ද, 2021 ජූලි 09 සිකුරාද BUDUSARANA FRIDAY JULY 09, 2021

56 කාණ්ඩය, 03 පත්‍රය, ආරම්භය 1965 - 06 - 13 , ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. පිටු 20 මිල රු. 40.00




ඛේමා බිසව බුදුරදුන් මුණගැසීම

# ඔබ සැබෑ උපාසකයෙක් ද?



**‘උපාසක‘ යන්නෙහි වචනාර්ථය ‘ළඟ හෝ සමීපයේ හිඳින්නා‘ යන්නයි. සමීප වනුයේ ධර්මයටයි. ඒ අනුව ධර්මයෙහි හැසිරෙන පුද්ගලයා උපාසක හෝ උපාසිකා යන්නෙන් දැක්වේ.**

පන්සලකට පැමිණෙන ඕනෑම පුද්ගලයකු උපාසකත්වය ලබන්නේ ද? බෞද්ධයකු වනුයේ උප්පැන්න සහතිකයට අනුව ද? යන ප්‍රශ්නයන්ට ‘නැත‘ යන්න පොදු පිළිතුරයි. තවද, උපාසකත්වය ලැබීම හා බෞද්ධයකු වීම යනු දෙකක් නොව එකක් ම වනබව මෙන්ම එය ධර්මයට අනුව ජීවත් වීමෙන් පමණක්ම ලැබිය හැකි බව ද මූලිකව ම දැක්විය යුතු ය.

බුදුන් වහන්සේ ජීවමාන අවධියේදී ම උපාසකත්වය ඉල්ලා සිටි බොහෝ දෙනෙක් වූහ. මහාවග්ග පාලියට අනුව සත්සතියෙන් අනතුරුව බුදුන් සමීපයට පැමිණි තපස්සු හා භල්ලුක යන වෙළෙඳ දෙබෑයෝ බුදුරදුන්ට විළඳ හා මී පැණි පූජාකොට බුදුන් වහන්සේ සහ ධර්මය පමණක් සරණ ගොස් ශාසනයේ ප්‍රථම ද්වේවාචික උපාසකයන් බවට පත්වූහ.

තම පුත්‍රයා වූ යස නිවසෙහි නොසිටිනා බව දැනගත් පියා ඔහු සොයමින් යන අතරතුර ඔහු බුදුන් සමීපයෙහි පැවිදි වූ බව දැන ගත්තේ ය. යසකුල පුත්‍රයා පැවිදි ව රහත් බවට පත් වූ අයුරු දැක්වූ බුදුහිමියෝ ඔහුට චතුරාර්ය සත්‍ය දේශනාව ඇසුරෙන් ධර්මය දෙසූහ.

”භගවන්තං සරණං ගච්ඡාමි, ධම්මං ච භික්ඛු සංඝංච, උපාසකං මං භන්තේ ධාරෙතු” වශයෙන් පැවසූ හෙතෙම ශාසනයේ තෙරුවන් සරණ ගිය ප්‍රථම උපාසකයා බවට පත්විය.

නිගණ්ඨනාථපුත්තගේ මෙහෙයවීමෙන් බුදුරජාණන් වහන්සේ සමග වාදකොට පරාජය කිරීමේ අරමුණින් පැමිණි අභයරාජ කුමාරයා වාදයෙන් පැරදී ධර්මය අසා උපාසකයකු බවට පත්විය.

අජාසත්ත රජතුමා සැබෑ උපාසකයකු බවට පත්වූයේ සාමඤ්ඤඵල සූත්‍ර දේශනාවෙන් අනතුරුව වේ. කොතරම් වෙහෙර විහාරස්ථාන ඇසුරුකළ ද ධර්මය පිළිපැදීමකින් තොරව ලැබිය හැකි උපාසකත්වයක් නොමැති බවට එය කදිම නිදසුනකි.

සීහසේනාපති සූත්‍රයෙහි දැක්වෙනුයේ නිගණ්ඨනාථපුත්‍රගේ අග්‍ර ශ්‍රාවකයකු වූ සීහසේනාපතිතුමා බුදුන් වහන්සේගෙන් ධර්මය අසා තමාට ශාසනයෙහි උපාසකත්වය ලබාදෙන මෙන් තෙවරක් ඉල්ලාසිටි ආකාරයයි. එහිදී බුදුරජාණන් වහන්සේ ඔහුට උපාසකත්වය ලබාදුන් අතර නිගණ්ඨනාථපුත්තගේ ශ්‍රාවකයකු ලෙස සිටිමින් ම කටයුතු කරන ලෙස දැක්වූහ. ‘බෞද්ධ‘ යන්න හුදු ලේබලයක් පමණක් බවත් ධර්මය අනුව ජීවිතය සකසා ගනිමින් උපාසකත්වයට පත් වූ විට සැබෑවට ම බෞද්ධයකු වන බවත් මින් තහවුරු වේ.

අංගුත්තර නිකායේ මහානාම සූත්‍රයට අනුව ‘තෙරුවන් සරණ යන්නා‘ උපාසකයකු බව දක්වයි.

අවබෝධයෙන් යුක්තව තෙරුවන් සරණ ගොස්, උපාසකයකු බවට පත්වන පුද්ගලයකුගේ මූලිකම ලක්ෂණය පංචශීලය ආරක්ෂා කිරීම තුළින් සිල්වතකු බවට පත්වීම බව මහානාම සූත්‍රයෙහි ම දැක්වේ.

අංගුත්තර නිකායෙහි වණිජ්ජා සූත්‍රයට අනුව උපාසකයකු විසින් සිදු නොකරනු ලබන වෙළෙඳාම් පහකි. එනම් ආයුධ වෙළෙඳාම,විෂ වෙළෙඳාම, සත්ව වෙළෙඳාම, මාංශ වෙළෙඳාම හා මත්පැන් වෙළෙඳාම යන පහයි.

අංගුත්තර නිකායාගත උපාසක චණ්ඩාල සූත්‍රය තුළ උපාසකයකු හා උපාසකයකු නොවන පුද්ගලයන් පිළිබඳ ලක්ෂණ වෙන වෙනම දක්වා ඇත.

ඒ අනුව සැබෑ උපාසකයා ආකාරවතී ශ්‍රද්ධාවෙන් යුක්ත වන අතර චණ්ඩාල උපාසකයා (සැබෑ උපාසකයකු නොවන්නා) අමූලිකා ශ්‍රද්ධාවෙන් කටයුතු කරයි.

බොහෝ මිනිස්සු ශ්‍රද්ධාව පදනම් කොට ගන්නේ පුද්ගලයන් අනුව ය. උදාහරණයක් ලෙස පුද්ගලයකු විසින් එක්තරා පන්සලක හිමි නමක් සමඟ දැඩිව සහයෝගයෙන් ඇසුරුකොට උන්වහන්සේගේ අඩුපාඩුවක් දැක කලකිරීමක් ඇතිවුවහොත් එදායින් පසු කිසිදා පන්සලකට නොයන, භික්ෂූන් වහන්සේලා දුටු තැන අවමන් කරන හෝ ගරු නොකරන එහෙත් බෞද්ධයකු වශයෙන් පෙනී සිටින අවස්ථා සමාජයේ සුලභ ය.

ඔවුන් බුදුරජාණන් වහන්සේට අනුව සැබෑ උපාසකයෝ නොවෙති. අවබෝධයෙන් තෙරුවන් සරණ ගිය පුද්ගලයකුගේ ශ්‍රද්ධාවේ පදනම පුද්ගලයන් මත නොයැපේ. යම් වරදක් දුටුවහොත් පුද්ගලයකු කෙරෙහි අපැහැදීම් ඇතිවුවත් සමස්තය කෙරෙහි අපැහැදීමක් ඇතිවන්නේ නම් එය සැබැවින්ම එක ජල බිඳක අපිරිසුදුතාවය ඔස්සේ සමස්ත මුහුදටම බැන වදින්නාක් මෙන් අනර්ථ ය.

එකී ශ්‍රද්ධාව පුද්ගලයන් මත නොයැපෙන එහෙත් නිවැරැදි අවබෝධයෙන් ඇති කර ගත්තක් වූ කල එය තමාගේ මෙලොව හා පරලොව සුභසිද්ධිය පිණිස ම වන්නේ ය.

සැබෑ උපාසකයා සිල්වත් බවින් යුක්ත ය. එනම් එම සීලය ආරියකාන්ත සීලයක් බවට පත්කොට රැකීම පිණිස ඔහු කැප වේ. නොකඩවා දිවි ඇතිතෙක් එකදිගට රකින සීලය මෙනමින් හැඳින්වේ. කෙසේ වුවද, ආයති සංවරය එනම් තමා අතින් සිදුවන වැරැදි නිවැරැදි කර ගැනීම උදෙසා හික්මීම,අධිෂ්ඨානශීලී වීම හා නිවැරැදිකරගැනීමෙන් යුක්තව සිල් ආරක්ෂා කර ගනිමින් වාසය කිරීම සැබෑ උපාසකයකු සතු ලක්ෂණයකි. එහෙත් සැබෑ උපාසකයකු නොවන්නා එසේ සිල් නොරකී.

සැබෑ උපාසකයා දිට්ඨ, සුත හා මුත යන මංගල කරුණු පාදක කොටගෙන ජීවත් නොවේ. එකී කරුණු තුන මෙසේ විමසිය හැකි ය.

## දකින දෙය

ගෙදරින් එළියට එනවිට ඇතැම් සතුන් දැකීම සුබයැයි කල්පනා කිරීම, ඇතැම් සතුන් හෝ වස්තූන් හෝ පුද්ගලයන් දැකීම අයහපත් යැයි ආදී වශයෙන් දකින දේ තුළ කටයුත්තක ශුභාශුභ තීරණය කිරීම.

## අසන දෙය

හූනන් ආදී සතුන්ගේ හඬ ඇසීම අසුභ යැයි සිතීම කටයුත්තක් ඇරඹීමේ දී මඟුල් බෙර හඬ ඇසීම ඇතැම් සතුන්ගේ හඬ ඇසීම සුබ යැයි ආදී වශයෙන් හඬ අනුව කටයුත්තක සුබ අසුබ තීරණය කිරීම.



පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ
සහකාර කථිකාචාර්ය
**මොරවක ධම්මරක්ඛිත හිමි**

## ස්පර්ශ වන දෙය

උදෑසනට විවිධ මල්වල සුවඳ ආඝ්‍රාණය කිරීම, කිරිදෙනුන් අතගෑම ආදී දේ තුළ කටයුත්තක් සුබ යැයි සම්මත කිරීම,රෙදිවැල් යටින් යෑම් හා විවිධ දෑ ස්පර්ශ වීම අසුභ යැයි සිතීම් ආදී වශයෙන් ස්පර්ශය අනුව කටයුත්තක සුබ අසුබ තීරණය කිරීම.

ඒ අනුව සැබෑ උපාසකයකු නොවන්නා මෙවැනි කරුණු මත යැපෙමින් කර්මය හා කර්ම ඵලය පිළිබඳව විශ්වාසය නොතබමින් ජීවත් වේ. සැබෑ උපාසකයා එවැනි මිථ්‍යා මත ප්‍රතික්ෂේප කරමින් යතාර්ථවාදී ව ජීවිතය දකිමින් ජීවත් වේ.

දක්ෂිණාව යන්නෙහි අදහස නම් තව කෙනකුට පින් දීමේ අරමුණින් යමක් පිදීමයි. සංඝ රත්නයේ ගුණයන් තුළ දක්ඛිණෙය්‍ය යන ගුණය ද ඇතුළත් කොට ඇත්තේ එසේ කෙනකුට පින් පැමිණවීමට දෙනු ලබන දානයක් පිළිගැනීමට සංඝයා සුදුසු බව දැක්වීමටයි. සැබෑ උපාසකයා මේ ශාසනය තුළම එවැනි උතුම් පුද්ගලයන් සොයන අතර, සැබෑ උපාසකයකු නොවන්නා ඒ සඳහා වෙනත් ශාසනයන් හෝ පුද්ගලයන් ද සොයයි. එනම් සැබෑ උපාසකයා කිසිවිටෙක යාගහෝම හෝ මිථ්‍යා දෘෂ්ටික ක්‍රමයන් සෙවීම නොකරයි.

එසේම සැබෑ උපාසකයා මිථ්‍යාදෘෂ්ටික ක්‍රම තුළ දන් නොදෙයි. හේ සැබෑවටම බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරිදි දන්දීම් කරයි. දේවාල පසුපස ගොස් දෙවියන් නොයදී. සැබෑ උපාසකයා ”නත්ථි මේ සරණං අඤ්ඤං බුද්ධෝ,ධම්මෝ,සංඝෝ මේ සරණං වරං” යැයි පවසමින් වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම තෙරුවන් සරණ ගොස් ඒ තුළ කුසල් වඩා නිවන් අවබෝධය කෙරෙහි කැප වේ.

අංගුත්තර නිකායාගත උපාසක පරිහානිය සූත්‍රය තුළ ද උපාසකයකුගේ පිරිහීමට හේතුවන කාරණා හතක් පිළිබඳව දක්වා තිබේ. භික්ෂූන් වහන්සේලා දැකීමට අප්‍රිය කිරීම, දහම් ඇසීම පමා කිරීම, උසස් සීලයක් රැකීමට අකමැති වීම, භික්ෂූන් කෙරෙහි අප්‍රසාදය දැක්වීම ආදිය උක්තව දැක්වූ උපාසක චණ්ඩාල සූත්‍රයෙහි කරුණුවලට අමතරව දැක්විය හැකිය.

උපාසකත්වය ස්ත්‍රී හා පුරුෂ දෙපාර්ශවය කෙරෙහි ම පොදු වූවක් බැවින් පෙර දැක්වූ සියලු කරුණු උපාසිකාවන් කෙරෙහි ද එලෙසම පවතින බව කිවයුතු ය.

> ‘සැබෑ උපාසකයා සිල්වත් බවින් යුක්ත ය. එනම් එම සීලය අරියකාන්ත සීලයක් බවට පත්කොට රැකීම පිණිස ඔහු කැප වේ. නොකඩවා දිවි ඇතිතෙක් එකදිගට රකින සීලය මෙනමින් හැඳින්වේ.’

# ප්‍රඥා ඇසින් ලෝකය දකින්න



පොසොන් අමාවක පෝදා

## දම් දෙසුම



**අන්ධභූතෝ අයං ලෝකෝ
තනුකෙත්ථ විපස්සති
සකුන්තෝ ජාල මුත්තෝහි
අප්පොස්සග්ගාය ගච්ඡති.**

මේ පුහුදුන් ලෝකයා පැණැස (පඤ්ඤා චක්ඛු) නැතිහෙයින් අන්ධ ය. මේ ලෝවැසියා අතරෙහි ස්වල්ප දෙනෙක් පංචස්කන්ධය අනිත්‍ය ආදී වශයෙන් වෙසෙසා දකියි. ලිහිණි වැද්දකුගේ දැලින් මිදුණු වටුවෙකු මෙන් ස්වල්ප දෙනෙක් මාරයාගේ පංචකාම නමැති දැලින් මිදී නිර්වාණයට යන්නේ ය.
ධම්මපදය - 13 වැනි ලෝක වර්ගයේ 7 වැනි ගාථාව

**ශ්‍රද්ධාවන්ත පින්වත්නි,**

සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් මෙම ගාථා ධර්මය දේශනා කළේ අලවි නුවර අග්ගාලව චෛත්‍ය නම් විහාරස්ථානයෙහි වැඩවසන සේක් එක්තරා පේසකාර දියණියක් අරභයා ය.

### මරණ සතිය

එක් දිනක් ජනපද චාරිකාවේ වඩින බුදුරජාණන් වහන්සේ ආලවි නුවරට වැඩම කළ විට එනුවර වැසියෝ දන් පිළිගැන් වූ අතර බත්කිස නිම කළ උන්වහන්සේ මෙසේ අනුමෝදනා ධර්මයක් දේශනා කළහ.

ජීවිතය අනිතය, මරණය ඒකාන්තය, මම මරණයට පත්වන්නේ වෙමි. මාගේ ජීවිතය මරණය කෙළවර කොට සිටී. යන අයුරින් මරණ සතිය වඩන්න. යමෙක් මරණසතිය මෙසේ නොවඩන ලද නම් ඔවුහු පසුකලෙක නයකු දැක බිය වූ තැනැත්තෙක් සන්තාපයටසේ පැමිණෙන්නාහ. මර හඬ දෙමින් කලුරිය කරත්.

යම් කෙනෙක් මරණසතිය වඩන ලද්දේ නම් ඔවුහු දුරදීම නයකු දැක කෝටුවකින් ගෙන විසි කොට සිටි අයෙක් මෙන් නිර්භීතව සිටිත්. ඒ නිසා මරණසතිය වැඩිය යුතු යැයි පැහැදිලි කරමින් ධර්මදේශනා කළ සේක.

### පේසකාර දියණිය.

එම ධර්ම දේශනාව ඇසූ සොළොස් හැවිරිදි පේසකාර දියණියක් වූවා ය. ‘අහෝ, බුදුරජාණන් වහන්සේගේ ඉගැන් වූ මේ ධර්මය කොතරම් ශ්‍රේෂ්ඨ දැයි සිතූ ඇය බුදුරජාණන් වහන්සේගේ දේශනාව අනුව එතැන් පටන් දිවා රෑ දෙක්හිම “මරණසති” භාවනාව තුන් අවුරුද්දක් තිස්සේ ම නොකඩවා වැඩුවා ය. එක් දිනක් අලුයම් කාලයෙහි මහා කරුණාවෙන් ලෝකය දෙස බලන බුදුරජාණන් වහන්සේ ආලවි නුවර පේසකාර දියණියට පිහිට විය යුතු යැයි සලකා පන්සියයක් භික්ෂු සංඝයා පිරිවරා දෙව්රම් වෙහෙරින් නික්ම යොදුන් තිහක් වූ මග අනුපිළිවෙලින් ආලවි නුවර අග්ගාලව විහාරයට වැඩම කළ සේක.

ආලවි නුවර වැසියෝ ද බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයාට දන් පිළිගන්වා අනුමෙවෙනි බණ ඇසීමට සූදනම් වූහ. මේ අතර බුදුරජාණන් වහන්සේගේ වැඩම වීම අසා ප්‍රීතියට පත්ව බුදුන් දැක බණ අසන්නට සිතා ගත්තා ය. නමුත් පේසකාර දියණියගේ පියා රෙදිවියන තරස් දණ්ඩෙහි නූල් වියා පේසකාර ශාලාවට ගෙනැවිත් දෙන ලෙස නියම කළේ ය. කිම? බණ අසම්ද? නැතනම් පියා පැවරුම් මෙහෙය කරම් දැයි විමතියට පත් වූවත් බණ අසා ම පේසකාර ශාලාවට යාමට තීරණය කළා ය.

බුදුරජාණන් වහන්සේ ද ධර්මාසනයේ වැඩහුන් සේක. ජනතාව ද ධර්මශාලාවේ බණ ඇසීමට සූදනම්ව සිටියත් පේසකාර දියණිය එනතුරු ධර්ම දේශනාව ආරම්භ නොවීය. දැන් පේසකාර දියණිය ධර්ම ශාලාවට ඇතුල් වී බුදුරජාණන් වහන්සේ වෙත එළඹ දෙහොත් මුදුන් තබා වැඳ එකත් පසෙක සිටිකල්හි මෙබඳු අපූර්ව සංවාදයක් ඇති විය.

දියණිය, ඔබ කොහිසිට ආයෙහි ද?

ස්වාමීනි, මම කොහිසිට ආයෙම්දැයි නොදනමි.

දියණිය, ඔබ කොතැනක යන්නෙහිද?

ස්වාමීනි, මම කොතැනක යන්නේ දැයි නොදනිමි.

නොදනිහිද?

දනිමි. ස්වාමීනි,

දනිහිද?

නොදනිමි ස්වාමීනි,

මේ ප්‍රශ්න උත්තරවලට සවන්දුන් මහජනතාව පේසකාර තරුණියගේ දෙඩමලු බවට ගරහමින් උද්ඝෝෂණය කළ නමුත් බුදුරජාණන් වහන්සේ සංවාදය නැවත ආරම්භ කළහ.



රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති
**පත්බේරියේ
ශ්‍රී විමලඤාණ නාහිමි**

දියණිය, මාගේ පළමුවන ප්‍රශ්නයට ‘නොදනිමි’ යයි උත්තර දුන්නේ මක්නිසාද?

ස්වාමීනි, ඔබ වහන්සේ මා කොතැනින් චුත ව මේ ආත්මභාවයෙහි උපන්නේ ද යන්න ප්‍රශ්න කළ බව සිතා ‘නොදනිමි’ යයි උත්තර දුනිමි.

සාධුකාර දෙමින් මානවිකාව, ඔබේ පිළිතුර නිවැරැදියි දෙවැනි ප්‍රශ්නයට නොදනිමි යනුවෙන් උත්තර දුනේනේ ඇයි?

ස්වාමීනි, ඔබ වහන්සේ මා මේ ඇති බවින් චුතව කොහි උපදින්නේ දැයි විචාළ බව සිතා ‘නොදනිමි’ කියා උත්තර දුනිමි.

දෙවන වරටත් සාධුකාර දෙමින් දියණිය, ඔබේ උත්තරය නිවැරැදියි. මගේ තුන්වැනි ප්‍රශ්නයට ‘දනිමි’ යැයි උත්තර දුන්නේ කුමක් නිසාද?

ස්වාමීනි, මම මැරෙන බව දනිමි. එම නිසා ‘දනිමි’ යයි උත්තර දුනිමි.

තෙවන වරටත් සාධුකාර දෙමින් සාධු, ඔබේ උත්තරය නිවැරදියි. දන්නෙහිද යනුවෙන් ඇසූ ප්‍රශ්නයට ඔබ නොදනිමි කියා උත්තර දුන්නේ ඇයි?

ස්වාමීනි, මාගේ මරණය අසවල් දින සිදුවේ දැයි මා නොදන්නා නිසා නොදනිමි උත්තර දුනිමි. බුදුරජාණන් වහන්සේ සිව්වන වරටත් සාධුකාර දෙමින් දියණිය, ඔබ මා ඇසූ ප්‍රශ්න සියල්ලටම නිවැරදි පිළිතුරු දී ඇත.

මේ පරිද්දෙන් සංවාදය නිම වූ බුදුරජාණන් වහන්සේ මුලින් සඳහන් කළ ‘අන්ධභූතෝ අයං ලෝකෝ’ යනාදී ගාථාවෙන් අනුමෝදනා ධර්ම දේශනා ආරම්භ කළහ. ධර්ම දේශනාවසානයේ එකුන්විසි වියැති පේසකාර දියණිය සෝවාන් ඵලයෙහි පිහිටියා ය. ඇය පේසකාර ශාලාවට යන විට නින්දට වැටී සිටි පියා හදිසියෙන් යන්ත්‍රය ක්‍රියාත්මක කළ නිසා රෙදිවියන හරස් දණ්ඩ ඇගේ උරෙහි වැදී ඕ එතැනම කලුරිය කළා ය.

සිය දියණියගේ අකල් මරණයෙන් මහත් ශෝකයට පත් පේසකාර හඬා වැළපෙමින් බුදුන් කරා එළඹ ඒ පුවත පියා සැළ කළේ ය. බුදුපියාණෝ ද ඔහු අස්වසමින් අග්මුල් නැති මේ දීර්ඝ සංසාරයේ දී ඔබ මෙවන් දියණියන්ගේ මරණ වෙනුවෙන් හෙලූ කඳුලු සිව්මහා සාගරයන්හි ජලයට ද වඩා අධික බව වටහා දී ශෝකය තුනී කරවූහ. නොබෝ දිනකින් බුදු සසුනේ පැවිදි වූ පේසකාර රහත් ඵලයට පැමිණියේ ය.

පින්වත්නි,

මෙමම පේසකාර දියණියගේ කතා වස්තුවෙන් මරණ සතිය වැඩීමෙන් ඉහාත්මයෙහි ලැබෙන අනුසස් කවරේදැයි හොඳින් පැහැදිලි වෙයි. අංගුත්තර නිකායෙහි පඤ්චක නිපාතයට අයත් අභිණ්හ පච්ච වෙක්ඛිතබ්බ සූත්‍රයේ දී ස්ත්‍රී පුරුෂ ගිහි පැවිදි සැම දෙනා විසින් ම මම මරණය ස්වභාවකොට ඇත්තෙමි. මරණය නොඉක්ම වූයේ වෙමි. (මරණ ධම්මෝම්හි, මරණං අනතීතෝ) නිරන්තරයෙන් නුවණින් මෙනෙහි කළ යුතු බව උගන්වා ඇත.

16 වැනි පිටුවට...

# පින් පිරෙන කුසල් වැඩෙන පින්බර වස් සමය



පිළියන්දල ජාතික පාසලේ ආචාර්ය
**තණමල්විල රාහුල හිමි**

**වසරකට වරක් වස් සමාදන්වීම භික්ෂූන් වහන්සේගේ කාර්යයකි. එයට දායකයන්ගේ ආරාධනාවක් අනවශ්‍ය ය. දායකයන්ගේ ආරාධනාවක් ඇතත් නැතත් උපසම්පද භික්ෂුව වස් සමාදන්වීම කළ යුතු ය. වස් වසනවා යනු තුන් මාසයක් එකතැනක වසන්නෙමි යන අදහස යි.**

වස් වැසීමත් මහජන හඬට කන්දීමක් වශයෙන් බුදුරජාණන් වහන්සේ විසින් පනවන ලද ශික්ෂා පදයකි. ලංකාවේ මෙන් නොව ඉන්දියාවේ ඇසළ මාසයෙන් පසුව ඇති වන වර්ෂා කාලය ඉතා බැරෑරුම් ය. පීඩාදායක ය. ඒ අනෝරා වැස්සේ බුදු සසුනේ භික්ෂූහු ආදියේ ගමන් බිමන් ගියහ. පිණ්ඩපාතයේ ගියහ. මේ පිළිවෙතට මිනිස්සු විරෝධය පළ කළහ. ශ්‍රමණ සම්ප්‍රදායට අයත් කෙනෙක් තීර්ථක වැනි කොටස් වස්සාන කාලයේ එක්තැනකට වී සිටීමේ ආදර්ශය දුන්හ. මේ ආදර්ශයත්, මහජන විරෝධතාවයත් භික්ෂූන් වහන්සේට වස් විසීමට පෙළඹවූ බව පෙනෙයි. සෑම වර්ෂයක ම ඇසළ පසළොස්වක දවසට පසුවද වස් එළඹිය යුතු ය. මාස හතරකින් යුක්තවන වස්සාන ඍතුවේ දී පළමු තුන් මාසය එක් තැනකට වී මහණදම් රැකීම වස් එළඹීම වශයෙන් නියමය වේ.

වස් එළඹෙන්නහු විසින් වහළක් ඇති, අරින්න වහන්න පුළුවන් දොරක් ඇති සෙනසුනකම වස් එළඹිය යුතු ය. සෙනසුනක් නැතයි වස් නොඑළඹ සිටිනු අයුතු ය. සෙනසුනක් නැත්නම් අත් උදව්කාරයකු සොයා දායකයකු සොයාගෙන සෙනසුනක් තනවා ගත යුතු ය. අත් උදව්කාරයකු නැතිනම් තමන් විසින් හෝ සෙනසුනක් තනා ගත යුතු බව විනයාලංකාර ටීකාවේ උගන්වා ඇත. නවත්වා ඇති නැවක හෝ වස් විසීම කළ යුතු ය. එය ද විනයානුකූල ය.

වස් දෙකකි. පෙර වස් හා පසු වස් යනුවෙනි. පෙර වස් යනු ඇසළ පොහොය දවසට පසුවද වස් එළඹීමයි. පෙර වස් වැසීමට නොහැකි වූ භික්ෂුවක් ඇසළ මාසය ගත වූ පසුව අනතුරුව එන චන්ද්‍ර මාසයේ පළමුවනද වස් විසිය යුතු ය. ඒ පසුවස් විසීමයි. පෙර වස් එළඹ තුන් මාසයක් වස් රැක ගතහොත් ඒ භික්ෂුවට කඨින චීවරයක් ලැබීමේ අයිතිය හිමි වේ. මෙසේ වස් එළඹෙන භික්ෂුව සතිකරණයෙන් යුක්ත විය යුතු ය. සිහියේ තබා ගැනීම මේ වස් කාලය යි. මම වස් එළඹ ඇත්තෙමි යැයි නිතර සිහිකටයුතු ය.

වස් කාලය තුළ වෙනද මෙන් ගමන් බිමන් නොකළ යුතු ය. තම මව, පියා, සහෝදරයා, සහෝදරිය අසනීපයෙන් වෙසෙන්නේ යැයි දැන ගතහොත් ඒ අය බලන්නට යා හැකි ය. තමන්ගේ ගුරුවරයා, උපාධ්‍යයන් වහන්සේ බැලීමට යා හැකි ය. වත් මානත් දීමාදී විනය කර්මයක් කිරීම ඇත්නම් එයට යා හැකි ය. එසේ යා යුත්තේ ද සතියක් ඇතුළත වස් එළඹි ස්ථානයට පැමිණෙන්නෙමි යන සතිකරණයෙන් යුතුව ය. සත්වන දින අරුණ


> **බුද්ධ කාලයේ භික්ෂූන් වහන්සේවස් එළඹීමට පෙර බුදුරදුන් හමුවී චරිතානුකූල ව කමටහන් ලබාගෙන නගරයෙන් ඈත පිටිසර පළාතකට ගොස් වස් එළඹ ඒ තෙමස තුළ කමටහන් වඩා සෝවාන් ආදී මාර්ග පලයන්ට පැමිණෙති.**

නැගෙන්නට පෙර තමන් වස එළඹි ස්ථානයට පැමිණිය යුතු ය. සමීපයේ අති ආරාමයකට ගොසින් තමන් වස් එළඹි ස්ථානයට අරුණ නැගීමට පළමු පැමිණෙන අදහසින් පිටත්වී එන අතර මඟ දී අරුණ නැගුණහොත් වස් නොකැඩේ. වසට උපද්‍රවයක් නැත. ආරාධනාවකින් යුතුව ගමනක් වඩින භික්ෂුවක් සත්වන දවසේ අරුණ නැගීමට පෙර වස් එළඹි ස්ථානයට පැමිණිය යුතුම ය. එසේ නොපැමිණියහොත් වස් එළඹීම පලුදු වේ. යම්කිසි භික්ෂුවක් දෙපළක වස් විසුවොත් මෙහි දෙවැන්නෙහි වාසය කරන්නෙමි'යි ළඟ සීමාවෙන්තික්ම යන කල්හි ම පළමුවන සෙනසුන ගැනීම යටපත් වේ. ඒ නිසා එක භික්ෂුවකට එක වසරක දී එකම තැනක මිස දෙපළක වස් එළඹිය නොහැක. කෙනෙක් ආරාමයක් වස් විසුවායින් වෙනත් භික්ෂුවක් පසු වී අවුත් වස් වසන්නට ඉල්ලුවහොත් මෙහි කලින් භික්ෂුවක් වස් එළඹ සිටීයි ද, වෙන තැනක් සොයා ගන්නැයි ද කිව යුතු ය.

අද වස් එළඹීම කරන්නේ රාත්‍රී කාලයේ ම ය. ඒ දායකයන් පැමිණ වස් ආරාධනා කිරීම, අද සිරිකත් බැවිනි. වස් එළඹීම රාත්‍රී කාලයේ ම කළ යුතු නැත. ඇසළ පසළොස්වක ගෙවී අරුණ නැගී පසුව උදේ හෝ දවල් හෝ වස් එළඹීමට පුළුවන. ආරාමයක වස් එළඹෙන්නේ නම් "ඉමස්මිං විහාරෙ වස්සං උපෙමි' යනුවෙන් ද නැවත ආදී තැනක වස් එළඹෙන්නේ නම් ඉධ වස්සං උපෙමි යනුවෙන් ද අධිෂ්ඨානයෙන් යුතුව වස් සමාදන් විය යුතු ය.

බුද්ධ කාලයේ වස් එළඹීමේ මූලික සිද්ධාන්තය අද යල් පැන අක්‍රියාත්මක වී ඇත. බුද්ධ කාලයේ භික්ෂූන්ගේ වස් එළඹීමට පෙර බුදුරදුන් හමුවී තමන්ගේ චරිතානුකූල ව කමටහන් ලබාගෙන නගරයෙන් ඈත පිටිසර පළාතකට ගොස් වස් එළඹ ඒ තෙමස තුළ කමටහන් වඩා සෝවාන් ආදී මාර්ග පලයන්ට පැමිණෙති. පැමිණ වස් හමාර වීමෙන් පසුව නැවත බුදුරදුන් හමුවී තමන්ගේ තොරතුරු කියති. සමහරවිට මෙසේ කමටහන් ලබාගෙන යන භික්ෂූන්ට සැප පහසු සේනාසනයක් නොලදහොත් කමටහන් වඩන්නට නොහැකි ව හිස් අතින් ආපසු එති. මෙසේ භික්ෂූන් වහන්සේල කමටහන් ගෙන ගම්බද පළාත්වලට යාම නිසා සැදැහවත් බෞද්ධයෝ උන්වහන්සේලාට සිව්පසයෙන් පූජා කර පින් ලබා ගනිති. ඒ පිළිබඳ විවිධ කතාන්දර ත්‍රිපිටකයේ සඳහන් වේ. එද බොහෝ භික්ෂූන් වස් කාලයේ නගරයෙන් ඈත් වූහ. ඒ තමන්ගේ සසර විමුක්ති සඳහා ය. අද මෙය වෙනස් වී ඇත. අද අවම වශයෙන් වස් කාලය තුළ මම මේ ධූතාංගය සමාදන් ව එය රකිමියි, අධිෂ්ඨාන කර රකින භික්ෂුවක් වත් නැත. වස් කාලය තුළ පන්සල්වල නිතිපද පිරිත් බණ සජ්ඣායනා කරමින් දායකයන් යහමඟට ගන්නා උත්සාහයක් අද පවතී.

බුදුරදුන් දවස ඇසළ මාසයේ වස් එළඹීමට භික්ෂූහු සූදානම් වූහ. ඇසළ මාසය දඹදිව සැණකෙළි මාසය යි. ජාතක පොතේ මේ පිළිබඳ නොයෙක් කතා එයි. මහාමායා දේවිය ඇසළ සැණකෙළියට සූදානම් වූ බව දැක්වේ. ගිරග්ග සමජ්ජ උත්සවය පවත්වන්නේ ද ඇසළ මාසයේ ය. මෙසේ ඇසළ මාසය සැණකෙළි මාසය නිසා බිම්බිසාර රජු ඇසළ මාසය වස් නොඑළඹ මාසයක් කල් යවන මෙන් භික්ෂූන්ගෙන් ඉල්ලීය. භික්ෂූහු බුදුරදුන් විමසූහ. බුදුරදුන් වදාළේ රාජ නියමට අනුව කටයුතු කරන්න කියා ය. වස් එළඹීම පිළිබඳව එසේත් සිදු වී ඇත. මේ කරුණු අනුව වස් එළඹීම භික්ෂූන්ගේ නියමිත කාර්යයක් විනා දායකයන්ගේ කාර්යයක් නොවේ. වස් කාලය තුළ සිව්පසයෙන් උපස්ථාන කොට කුසල් සිදුකර ගැනීමට දායකයන්ට අවස්ථාව තිබේ.



# ලෝක ශිෂ්ටාචාරය වෙනස් කළ ධර්ම විජය ප්‍රතිපත්තිය



**සිරිසර වෙසක් පුන්සඳ කෙමෙන් අඩු වී යළි පොසොන් අඩ සඳ අහස් තලයේ බබළද්දී අපට සිහිපත්වන ප්‍රධාන නම් තුනක් ඇත. භාරත දේශයේ ධර්මාශෝක රජ, මහින්ද මහ රහතන් වහන්සේ, ශ්‍රී ලංකාවේ දේවානම්පියතිස්ස රජතුමා යන ඒ නම් තුනෙන් ධර්මාශෝක මහ රජතුමාගේ සත්ක්‍රියාව පිළිබඳ විස්තරයක් මෙයින් දැක්වෙන්නේ ය.**

ධර්මාශෝක රජතුමා ගෙන් සිදු වූ සේවය මානව සමාජයට ම අවශ්‍යයෙන් ම අර්ථදයක වූ අයුරු ඓතිහාසික තොරතුරුවලින් ප්‍රත්‍යක්ෂ වන්නේ ය. සෑම රාජ්‍ය පාලකයෙක් ම පරපුරෙන් පරපුරට පවතින්නට කුමක් හෝ සේවාවක්, සටහනක් ඉතිරි කර යන්නට ඇත. එහෙත් ධර්මාශෝක ජීවන චරිතයත් කළ සේවයත් සෙසු රාජ්‍ය පාලකයන්ට වඩා සුවිශේෂ වන්නේ ය.

ශ්‍රී සම්බුද්ධ පරිනිර්වාණයෙන් සියවස් දෙකකට පසු ලොව බිහි වූ උසස් තම නරපතියාණන් වන ධර්මාශෝක මහ රජතුමාගේ අවංක, දිරිමත් ප්‍රතිභා කෞශල්‍යතාවය ප්‍රකටවන රජතුමා විසින්ම සාදවන ලද පාඨලී පුත්‍ර නගරයේ අශෝකාරාමයේ දී සිදුකළ තෙවන මහා ධර්ම සංගායනාවෙන් පසුව තිකුත් වූ ධර්ම යාත්‍රාව විවිධාකාරයෙන් පුළුල්ව එවකට බුදුදහම වටහා ගැනීමට කැමැති සෑම රටකට ම හඳුන්වා දෙන ලදී.

අශෝක ධර්මය හඳුන්වාදීමේ දී ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් අතර සෑම ආගමකටම ගරු කිරීම, දිග් විජය අත්හැරීම, ධර්ම විජය ක්‍රියාත්මක කිරීම, සමානාත්මතාවය, ධර්ම යාත්‍රාව, ආගමික අමාත්‍යාංශ පිහිටුවීම, සාමකාමී විදේශ ප්‍රතිපත්තිය යනාදිය ප්‍රධාන ය.

පියදස, පියදස්සී, අශෝක, ධර්මාශෝක යන නම්වලින් ප්‍රකට වූ අශෝක රජතුමාගේ ජීවන චරිතය පිළිබඳ තොරතුරු එතුමා විසින් පිහිටුවන ලද ශිලා ලේඛනවල සඳහන් නො වන්නේ බෞද්ධයකු වශයෙන් පෙනී සිටින විට එවන් තොරතුරු අවශ්‍ය නැතැයි යන හැඟීමෙන් ක්‍රියා කළා හෝ ඒවා මහජනතාව දැන ගැනීමෙන් රාජ්‍ය තන්ත්‍රයේ යම් බිඳවැටීමක් සිදුවේ ය යන සංකල්පයෙන් යටපත් කළා හෝ සිතා ගන්නට පුළුවන.

ශ්‍රී ලංකා සම්බුද්ධ ශාසනය පිළිබඳ සාහිත්‍ය ග්‍රන්ථවල දක්වන පරිදි මෙතුමා අවිහිංසාවාදී, ධාර්මික මහා අධිරාජයකු වශයෙන් මහා භාරතය පාලනය කළේය. මහාවංස, දීපවංශ, සමන්තපාසාදිකා, සද්ධර්මාලංකාරය, දිව්‍යාවදානය, යන ග්‍රන්ථවලින් මෙම රජතුමාගේ අසිරිමත් ජීවිතය, හා රාජ්‍ය පාලනය පිළිබඳ සත්‍ය තොරතුරු හා අතිශයෝක්ති වර්ණනා ද, දක්නට පුළුවන.



අස්ගිරි මහා සංඝ සභාවේ මහෝපාධ්‍යාය ශාස්ත්‍රවේදී රාජකීය පණ්ඩිත
**අමුණුපුර පියරතන නාහිමි**

අශෝක රජතුමාට පෙර භාරත දේශය ආගමික, දර්ශනික හා ආර්ථික වශයෙන් උසස්තම තලයක පැවතීම නිසා ධර්මාශෝක රජතුමාට එවන් භයානක යුද්ධයක් කිරීමෙන් තම ජනප්‍රිය තාවය ගොඩනගා ගන්නට රට සමෘද්ධිමත් කරන්නට ජන හදවත් දිනා ගන්නට හැකි විය.

බුද්ධාදී අති උත්තමයන් පහළ වූ, කෝටි සංඛ්‍යාත මහරහතන් වහන්සේලා අහසින් බිමින් වඩින, සිය දහස් ගණන් රජ දරුවන් විරාජමානව ප්‍රාදේශීය රාජ්‍යයන් පාලනය කරන, මහා පුණ්‍යවන්ත රාජ්‍යයක ධර්මාශෝක වැනි ධීර, වීර, කාර්යශූර, රජ කෙනකු රාජ්‍ය කරනවිට සම්පත් ඇතිවීම, ඇතිදේ වැඩිවීම පොදු ජනතාව සමගියෙන් ජීවත්වීම, ධන ධාන්‍ය කෙත්වත් සරුවීම ආගම දහම වශයෙන් සත්‍යවාදවීම ස්වභාව ධර්මය වශයෙන් අසිරිමත් දේ පහළවීම සිදුවන්නේ ය.

මෙම අශෝක කුමාරයා බින්දුසාර පියරජතුමා යටතේ ප්‍රදේශ දෙකක පාලනය කරගෙන ගිය බව සඳහන් වන පිය රජතුමාගේ අවසාන කාලයේ ඔහු අවන්ති දේශයේ පාලනය බාරගෙන සිටියේ ය. පිය රජතුමාගේ අභාවයෙන් අනතුරුව රජකම සඳහා තම සහෝදර කුමාරවරුන් අනූනව දෙනෙත් ඝාතනය කළ බව සඳහන් වන්නේ ය. එසේම ස්වකීය පිය රජතුමාගේ අභාවයෙන් රජකමට පත්වුව ද සතුරු කරදර නිසා සතර වසරක් ඔටුනු නොපැළඳ පාලනය කොට අප බුදුරදුන් පිරිනිවන් පෑමෙන් දෙසිය දහ අවේ දී සියලු රාජධානීන් යටත්කොට අධිරාජයාණන් වශයෙන් ඔටුනු පැළඳ රජකමට පත්විය.

අශෝක රජතුමාට චණ්ඩාශෝක යන නම ඇතිවූයේ කාලිංග යුද්ධය නිසා ය. අශෝකාවදානයේ දක්වෙන පරිදි අශෝක රජතුමා ඉතාමත් දරුණු බන්ධනාගාර ඇතිකොට මගධ කාලිංග යුද පිටියේ දී අල්ලාගත් සතුරු හමුදව හිරකොට දරුණු වද දී ඝාතනය කළබව සඳහන් වන්නේ ය.

අශෝක රජතුමා බුදුදහම පිළිගැනීමත් ඉන් අනතුරුව යුද්ධයක් ජයගෙන ජය පැන් බීමට වඩා එයින් පශ්චාත්තාපවීමත් එතුමා විසින් පිහිටුවන ලද. ශිලා ලිපිවලින් විස්තර වන්නේ ය. විශේෂයෙන් 13 වන කාලිංග ලිපියෙන් රජතුමාගේ චිත්තාභ්‍යන්තරයේ පවතින වේදනාව ප්‍රකාශනයට පත් කෙරෙන්නේ ය.

“දෙවන පියදස් රජු විසින් ඔටුනු පලන් අටවන වසරෙහි කළිඟු රට දිනා ගන්නා ලදී. ගණනින් එක්ලක්ෂ පනස් දහසක් දෙනා එහිලා සිරකරුවන් ලෙස ගෙන යන ලදහ. ලක්ෂයක් පමණ දෙනා එහිදී මරන ලදහ. එමෙන් කීප ගුණයක් මිය ගියහ. එතැන් පටන් අලුතින් දිනාගත් කළිඟුරට පිළිබඳ ව දෙවන පිය පියදසුන් කැළ පවත්නේ තියුණු වූ දැහැමි හැඟීමකි.

මේසා විශාල මනුෂ්‍ය ඝාතනයක් කළ චණ්ඩාශෝක රජ ධර්මාශෝකවීමත්, විදේශීය ප්‍රතිපත්තියේ වෙනසක් ඇතිකර ගත්තේ ද යුද්ධය සදහට ම තම චින්තනයෙන් හා ක්‍රියාවෙන් අයින් කළේ ද, බුද්ධාගම පිළිගත් පසු ය. එමෙන්ම එවකට ලෝකයේ පැවැති විශාලතම ප්‍රදේශයක පාලනය හා උසස්තම ශිෂ්ටාචාරයක් පෝෂණය කිරීමත් නිසා ධර්මාශෝක රජතුමා අසිරිමත් රාජ්‍ය නායකයකු වශයෙන් ඉතිහාසයේ සනිටුහන් වන්නේ ය. දස දහස් ගණන් මහරහතන් වහන්සේලා හා දෙවියන් ඇසුර ලබමින් සක්විති රජකෙනකුට සමාන ව දස රාජ ධර්මයන් අනුව රාජ්‍ය පාලනය කිරීමද වෙනත් කිසිම රාජ්‍ය පාලකයෙකුට නොතිබූ මහේශාක්‍ය ලීලාවද විද්‍යාමාන වූ වග ඓතිහාසික තොරතුරුවලින් ප්‍රකට වන්නේ ය.

කාලිංග යුද්ධයේ දී සිදු වූ යුදගිනි පිළිබඳව පශ්චාත්තාප වූ මෙම නරපතියාණන්ට නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ ශාන්ත, දාන්ත, ඉරියව් ඇතිව ගමන් කරන විලාසය දැක පසුව රජ මැදුරට කැඳවා වඩා හිඳුවා බුදුබණ ඇසීමෙන් සම්පූර්ණ මානසික සහනයක් ලබාගෙන එයින් තම ජීවන පැවැත්මේ මෙන්ම සමාජ පැවැත්මේ වෙනසක් ද ඇති කළ වග පාලි වංස කතාවල දක්වෙන්නේ ය.

ධර්ම යාත්‍රාව, ධර්ම විජය, ධර්ම මහාමාත්‍ය තනතුරුදීම බෞද්ධ භික්ෂූන් වහන්සේලාට දන්දීම දහස් ගණන් වෙහෙර විහාර කරවීම, සිද්ධස්ථාන වන්දනා කිරීම සෙල්ලිපි මාර්ගයෙන් බුද්ධ ධර්මයේ අත්‍යවශ්‍ය කරුණු ජනතාවට ප්‍රකාශ කරවීම ආදී කුදුමහත් විශාල වැඩ කොටසක් ඉෂ්ට සිද්ධ කර වූහ.

ධර්මාශෝක මහරජාණන්ගේ රාජ්‍ය පාලනය මෙන්ම ආගමික ජාතික හා ආර්ථික සේවය පිළිබඳව විශේෂඥ උගතුන්ගේ මත අනුව එක පුද්ගලයකුට මෙතරම් විශාල වැඩ කොටසක් කිරීමට හැකියාව ලැබීම පුදුම සහගත බව ය. පාඨලී පුත්‍ර නගරයෙහි රාජ මන්දර අශෝකාරාමය ආදී මන්දිර භූතයන් විසින් ගලින්ම නිමවන ලද බවට පාහියන්තුමාගේ ගමන් විස්තරයෙහි සඳහන් වේ.

ස්වදේශීය ජනතාව පමණක් නොව විදේශීය ජනතාව ද මෙතුමාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය පිළිගැනීමට තම තමන්ගේ කැමැත්ත පළ කළහ. මේ නිසා පාඨලී පුත්‍ර නගරයේ අශෝකාරාමයෙන් පිටත්ව ගිය ධර්මදූතයන් වහන්සේලා දෙස් විදෙස් රටවලදී ඒ උතුම් ශ්‍රී සද්ධර්මය ජනතා සිත් සතන් තුළ තිරසරව තැන්පත් කළහ.

මුළු ලොවට හිතවැඩ සැලසීම මට අයත් යුතුකමක් කොට සලකමි. ලෝකයාගේ හිත වැඩෙහි යෙදීමට වඩා වටිනා අන් සේවයක් නැති බැවිනි. මෙවන් අදහස් සිය ගණන් එම ශිලා ලේඛනවලින් ප්‍රකාශවන අතර, ධර්මාශෝක රජතුමාගේ කාර්යශූර බව මෙන්ම පශ්චාත්තාපයේ දී අහිංසකත්වය, පරම අවිහිංසාව, ත්‍රිවිධ රත්නය, කෙරෙහි අවංක ශ්‍රද්ධාව, ජනතාව කෙරෙහි ආදරය යන කරුණු අනුව මෙතුමා ලෞකික ලෝකයේ උසස්තම ගුණයන්ගෙන් සම්පූර්ණ වූ උතුම් ජනනායකයකු බව ප්‍රත්‍යක්ෂ වන්නේ ය. ධර්මාශෝක නාමය උතුම් බුදුදහම පවත්නාතාක් ලෝක ජනතා හදවත් තුළ රැඳී පවතින්නේ ය.

# මිතුරු වෙසට නොරැවටෙන්න



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනයේ
රාජකීය පණ්ඩිත,
ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**



**බාල, ළමා, තරුණ, මහලු භේදයකින් හෝ ස්ත්‍රී -පුරුෂ හෝ ගිහි-පැවිදි හෝ වෙනත් සමාජ බෙදීම් අනුව හෝ ඔවුනොවුන්ට මිතුරෝ සිටිති. සමගියෙන් කටයුතු කරති.**

එහෙත් පැණිවරකා ගහටත් හෙනවදී වැනි ගැමි කියමන් මතුවන්නේ මිතුරුකම් විනාශවන අවස්ථාවලයි. එවිට ඔවුන්ගේ සමගිය, මිතුරුකම නැති වී යයි.

මිනිස් ජීවිතය සාර්ථක කර ගැනීමට මිතුරන් අවශ්‍ය ය. තමාගේ ගුණවලට සමාන හෝ තමාට වඩා උසස් ගුණවලින් යුක්ත හෝ පුද්ගලයින් ඇසුරු කිරීම ජීවිතය සාර්ථකවීමට හේතුවකි. රාජකාරි ස්ථාන, සමාජ ක්‍රියාකාරකම්, දේශපාලනය, වෙළඳාම, අධ්‍යාපනය, ඥාතීත්වය, අසල්වැසිකම, ප්‍රාදේශීය බව යනාදි සාධක මත මිතුරුකම් ගොඩ නැගේ.

බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටි සමයේ සම්බුදු සසුනට ඇතුළත් වූ භික්ෂූන් වහන්සේලා හයනමක් ඉතා සමගියෙන් කටයුතු කළහ. ඡබ්බග්ගිය භික්ෂූන් යැයි ප්‍රසිද්ධ වූහ. එහෙත් එක් දවසක් දම්සභාවේ දී ඔවුන්ගේ අසමගිය ගැන කතාවක් ඇති වුණි. එතැනට වැඩම කළ බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාගෙන් පූර්ව පුවත් අසා “මහණෙනි, මේ භික්ෂූන්ගේ අසමගියට හේතුව සන්ධිභේද ජාතකයේ පැහැදිලිවම පෙනෙන්න තිබේ” යැයි දේශනා කළහ. එකල්හි කුතුහලයෙන් පිරී ගිය භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේට නමස්කාර කර දෙලොව හිත සුව පිණිස එම අතීත කතාව දේශනා කිරීමට ආරාධනා කළහ.

මහණෙනි, මම යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ පුත්‍රයෙක් ව උපන්නා. කුඩා විය ඉක්ම වූ පසු දිසාපාමොක් ඇදුරුතුමා වෙතින් ශිල්ප ලබා දීමට පියරජතුමා කටයුතු කළා. මම උගත් ශාස්ත්‍රය රජතුමා ඉදිරියේ පෙන්වූ පසු යුවරජ තනතුර ද පිරිනැමුවා. පියාගෙන් අනතුරුව රාජ්‍ය පාලනය කිරීමට අවස්ථාව උදා වුණේ එහෙමයි.

මහණෙනි, මෙහෙම රාජ්‍ය කරමින් යන විට දිනක් රාජ සභාවට එක් පුරුෂයෙක් පැමිණ නමස්කාර කර කැලයෙන් සොයා ගත් විශේෂ පලතුරු සමූහයක් මට ලබා දුන්නා. ඔහු සීසාමින් ගොවිතැන්වලට උදව්කරන පුරුෂයෙක් බව කිව්වා. ඔහුට විශාල ගව පට්ටියක් සිටින බවත්, ඔවුන් වනයට දමා කෑම බීම දෙමින් රැකබලා ගන්නා බවත් කිව්වා.

එකල රජ කෙනකු වූ මම වනාන්තරවලට බොහොම ප්‍රිය කළා. ඒ නිසා ඔහු අමතා “ පුරුෂය, තොප සිටින වනාන්තරයේ දුටු විරූ අරුම පුදුම යමක් වේනම් එය පවසව?” යි කිව්වා. එවිට ඔහු මා අමතා “දේශය පාලනය කරන උතුම් රජතුමනි, වචනයෙන් හෝ වරදක් වුවහොත් දහස්වාරයක් සමා වුම මැනව, අරුම පුදුම දෙයක් මම දුටුවෙමි. දිනක් මගේ ගව පට්ටියේ ගැබ්බර දෙනක් තණ කමින් මහා වනාන්තරය මැදට ගිහින් තිබුණා. මමත් ඇය සොයමින් ගියා. එහෙත් මට ඇය හමු වුණේ පැටවා බිහි කළාට පසුවයි. තවත් කිව යුතු පුදුමයක් තිබෙනවා. මට ඇය සමීපයට යාමට නො හැකි වුණා. ඇගේ හොඳම යහළුවා බවට සිංහ ධේනුවක් පත් වී සිටියා. දෙදෙනා එකට ආහාර ගැනීමත්, වාසය කිරීමත්, ගමන් බිමන් යාමත් කරන බව දුටුවා. සිංහධේනුවටත් පැටියෙක් සිටියා. එළදෙන සහ සිංහ ධේනුව සමගියෙන් සිටින නිසා පැටවුන් දෙදෙනාත් සමගියෙන්ම සෙල්ලම් කරමින් කාලය ගත කරනවා දුටුවා. කලකින් මව්වරු දෙදෙනා ම මිය ගියා. දැන් පැටවුන් දෙදෙනා සමගියෙන් වාසය කරනවා, එයයි මම දුටු අරුම පුදුම සිද්ධිය යැයි යටහත් පහත්ව පැවසුවා. රජතුමා ඔහුගේ කතාව අසා සිට

“එම්බා පුරුෂය, ඔවුන් දෙදෙනා අතරට තුන්වැනියෙක් එකතු වුවහොත් වහා මා

> **එළදෙන සහ සිංහ ධේනුව සමගියෙන් සිටින නිසා පැටවුන් දෙදෙනාත් සමගියෙන්ම සෙල්ලම් කරමින් කාලය ගත කරනවා දුටුවා. කලකින් මව්වරු දෙදෙනා ම මිය ගියා. දැන් පැටවුන් දෙදෙනා සමගියෙන් වාසය කරනවා**

දැනුවත් කරව” යැයි පවසා තෑගි බෝග පිරිනමා ඔහුව පිටත් කළා.

එම පුරුෂයාත් යහළුවන් දෙදෙනාගේ හැසිරීම අධ්‍යයනය කරමින් කාලය ගත කළා. දිනක් කැනහිලෙක් ක්‍රමයෙන් ඔවුන් දෙදෙනා අතරට එකතු වී මිතුරුකමක් ගොඩනගා ගත්තා. කලක් ගත වුණා. කැනහිලා මිතුරන් දෙදෙනාගේ ම තොරතුරු හොඳින්ම දැන ගත්තා. ඉතින් දිනක් කැනහිලාට මෙහෙම හිතුණා. පරණ මස් කැබලි සහ ඇටකැබලි කෑමෙන් මගේ කුස කවදාවත් පිරී ගියේ නෑ. රසනහර පිනාගිය කෑමක් ලැබුණ කලක් මතක නෑ. අනික ගවමස් සහ සිංහ මස් මාරුවෙන් මාරුවට කන්න තිබේ නම් කොපමණ රසයක් ඇතේවි ද? එසේ වාසනාවක් ගොඩනගා ගන්නේ කෙසේද යනුවෙන් ඔහු නිතර කල්පනා කළා.

මහණෙනි, දවසක් ඔහුට මෙහෙම සිතිවිල්ලක් ආවා. මම දෙදෙනාගේ ම තොරතුරු හොඳින්ම දනිමි. සිංහයාගේ අගුණ ගවයාටත්, ගවයාගේ අගුණ සිංහයාටත් පවසා දෙදෙනා තරහ කර, ගැටුම් ඇති කර ඔවුන් මරණයට පත් කළ හැකියි හිතුවා.

ඔහු එසේම කළා. දෙදෙනා විරසක වී නිතර ගැටුම් ඇති කර ගත්තා. මෙය දුටු ගව හිමියා රජු හමුවී සියලු පුවත් දන්වා සිටියා. රජතුමා වහා අශ්ව රථයෙන් එතැනට පැමිණ බලන විට දෙදෙනා ම මිය ගොස් තිබුණා.

සිංහයාගේ ශරීරයට ගොඩ වන කැනහිලා උගේ ශරීර මාංශ කැබැල්ලක්

## සන්ධිභේද ජාතකය

කඩා කා අනතුරුව ගවයාගේ පිටට පනියි. ගවයාගේ ශරීර මාංශ කැබැල්ලක් කා සිංහයාගේ ශරීරය මතට පනියි. මෙහෙම දෙදෙනාගේම ශරීර මාංශවල රසවිඳිමින් සිටියා.

බලන්න මහණෙනි, සිංහයා කන්නේ මාංශ, ගවයා කන්නේ තණ කොළ., සිංහයා සංවාසය කරන්නේ සිංහ ධේනුව සමග, ගවයාගේ සංවාසය වන්නේ ගව ධේනුවක් සමග, ඔවුන් දෙදෙනාගේ මරණයට හේතුව ආහාරවත්, ස්ත්‍රීන්වත් නොවන බව මෙයින් හොඳින්ම පේනවා.

මහණෙනි, දෙදෙනාගේ මරණවලට එකම හේතුව කේලාම් ඇසීමයි. කේලාම් යනු දෙපැත්ත කැපෙන තියුණු කඩුවක් හා සමාන යි. වහා ඇවිලී යන ගින්නක් හා සමානයි. මහණෙනි, එම නිසා කිසිවිටකත් කේලාම් ඇසීම හෝ කීම නො කළ යුතුයි. මෙලොවත් පරලොවත් විනාශවීමට හේතුව එයයි. මිතුරන් ඈත් කිරීමටත්, හතුරන් වැඩිකර ගැනීමටත්, සම්පත් විනාශ කර ගැනීමටත්, චිත්ත සන්තුෂ්ටිය නැතිවීමටත්, සැක කිරීමටත්, දෙස් පරොස් කීමටත්, බොරුකීමටත් හේතුව කේලාම් කීම සහ කේලාම් ඇසීමයි යනුවෙන් දම්සභාවේ වැඩ සිටි භික්ෂූන් වහන්සේලාට ධර්මාවවාද කරමින් ජාතක කතා දේශනාව අවසන් කළා.

අනතුරුව මෙසේ ද පවසා සිටියා “මහණෙනි, එකල රජ්ජුරුවෝ වූයේ බුදු වූ මම්ම වේ, සිංහයා, ගවයා සහ කැනහිලා වූයේ මෙකල ඡබ්බග්ගිය භික්ෂූන් ම ය.

# The Arrival of Arahat Maha Mahinda Thero and The Dawn of Poson



**Dr. Ven. Dodamgoda Sumanasara Thero**
University of Sri Jayewardenepura
Faculty of Humanities and Social Sciences

**All Sri Lankan Buddhists grandly celebrate Poson Full Moon Day which falls in June every year. This is the day on which Buddhism was introduced to Sri Lanka by Arahat Maha Mahinda Thero.**

236 years since after the passing away of the Buddha, Arahat Maha Mahinda Thero accompanied by five Arahats namely Itthiya, Uththiya, Sambala, Bhaddasala, Sumana Samanera and a layman Bhanduka arrived at Mihintale in Anuradhapura. On this particular day, king Devanampiyatissa was out on a hunting expedition with his retinue. Then, Mahinda MahaThero saw the king and addressed by the king's name "Tissa." Then the king was astonished and looked around to see who was addressing him by his name. He saw Arahat Mahinda Thero accompanied by several monks and Bhandukaupasaka on a high rock, MissakaPawwa. He was so surprised and respectfully kept his bow and arrows down and questioned Arahat Mahinda Thero about his arrival to Sri Lanka. Then, Arahat Mahinda Thero replied to king Tissa that they were the disciples of the Buddha and had arrived from India out of compassion for the king and the people of Sri Lanka.

"Samanamayam maharaja - dhammarajassasavaka

Tavewaanukampaya - jambudeepaidhagata."

Further, he described that he was the son of Emperor Ashoka and arrived from India to preach the doctrines of the Buddha to the people of the country. After this explanation, Arahat Mahinda Thero asked the following questions from the king to assess his wisdom.

Arahat Mahinda Thero: Oh King, what is this tree?

King: Most Venerable Sir, it is a mango tree.

Arahat Mahinda Thero: Are there any mongo trees here?

King: Yes, Most Venerable Sir, there are a lot of mango trees here.

Arahat Mahinda Thero: Are there trees other than this mango tree and those other mango trees?

King: Yes, Most Venerable Sir, there are. But those are not mango trees.

Arahat Mahinda Thero: Are there any trees other than those mango trees and the other trees?

King: Yes, Most Venerable Sir, it is this mango tree.

Then, the Arahat Mahinda Thero asked another questions from the king regarding the king's relatives to further observe his intelligence.

Arahat Mahinda Thero: Oh King, have you any relatives?

King: Yes, Most Venerable Sir, I have a lot of relatives.

Arahat Mahinda Thero: Are there any others who are not your relatives?

King: Yes, Most Venerable Sir. There are.


Arahat Mahinda Thero: Is there anyone else other than your relatives and those who are not related to you?

King: Yes, Most Venerable Sir, there is. It is me.

At the end of this friendly discussion, Arahat Mahinda Thero was so pleased with king Tissa's intelligence, and he understood that the king was wise enough to embrace and follow the Buddhist doctrines of the Buddha. Eventually, Arahat Mahinda Thero preached the Dhamma to king Tissa and his retinue. Hearing this great Dhamma discourse the king and the retinue took refuge in the Buddha, Dhamma, and Maha Sangha (The Noble Triple Gem). From this noble day onwards, Buddhism gradually spread across the country and the people of this country embraced the Dhamma and became Buddhists.

## Lesson for mindfulness – part 7

# Mindfulness for young People



Battaramulla
Siri Sudassanarama
sadaham senasuna
**Ven. Dr. Mirisse Dhammika thero**

**For young children, we can make them aware of their presence by the practice of counting breaths. For example, when a student breathes in, he/she should count one, and breathing out, should count two.**

Thus, they can count up to ten, then count backward and forward for five to ten minutes. This type of practice on breathing helps to hold awareness in the present moment. In an awareness of the present, of how things are, it can be much easier to be one's own image without damaging his/her social and moral identity, and manage the present situation effectively in a positive manner. Levete points outs:

**From an early age most of us have been conditioned to regard our negative emotions as unnatural states of mind to be covered over either through suppression or distraction.** Contrastingly, positive feelings such as peace, happiness and goodwill should always be a natural, permanent state of being. In reality, the positive image of what we should or should not be thinking, doing or feeling does not work out that way; thought is often in a crisis of conflict: confused, guilty and deeply afraid. A negative experience is often regarded as unnatural, a personal affront, or personal failure.

A consequence of this perception is that habitual thought patterns are divorced from a deeper level of intuitive understanding; an understanding which recognizes and accepts its interdependent connection with the rest of nature. By realizing that, as a self-observant and understanding human, one may be able to see his/her experience differently; the physical body and the process of thoughts are subject to natural laws, positive and negative consequences, impermanence and change. This state of mind empowers one's awareness of the present moment, and that awareness may lead him/her to cultivate positive thoughts of love, compassion, tolerance, sharing and respect due to a mind that is undistracted, composed and natural.



"From an early age most of us have been conditioned to regard our negative emotions as unnatural states of mind to be covered over either through suppression or distraction."

බුදුසරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

පොසොන් අමාවක 2021.07.09

## තමන්ගේ රැකවරණය තමන් තුළම ය

තමන් කළකම් තමා පසුපස ම එන බව කියන අපූර්ව කතා පුවතක් බෞද්ධ සාහිත්‍යයේ එයි. ඒ කෝක නම් සුනඛ වැද්දාගේ කතා පුවතයි. දඩයම් පහසු කරනු පිණිස තමන් විසින් මනා කොට පුහුණු කරන ලද සුනඛයන් ද පිරිවරාගෙන දිනක් දඩයමේ යන සුනඛ වැද්දා ඉදිරියට පැමිණියේ භික්ෂූන් වහන්සේ නමකි.

උන්වහන්සේ දුටු වැද්දා සිතන්නේ අද නම් තමන්ට හිස් අතින් ආපසු එන්නට සිදුවන බවය. සිතූ ලෙසම එදින ඔහුට කිසිදු දඩයමක් කර ගන්නට නොහැකි වුණි. සිතට නැගුණේ දැඩි කෝපයකි. වැද්දා එන මඟ ඉදිරියේ දී නැවත ද උන්වහන්සේ මුණ ගැසුණි. කෝපය පාලනය කරගත නොහැකි වූ වැද්දා තමන්ට බැල්මකිතිදු වරදක් නොකළ භික්ෂූන් වහන්සේ වෙත සුනඛයන් මෙහෙය වූයේ ය.

අසරණ වූ භික්ෂූන් වහන්සේට පිළිසරණට වූයේ මඟ අසල වූ ගසෙකි. වහා ගසට නැඟ ගත් උන්වහන්සේට වැද්දා ඊතලවලින් විදින්නට විය. වේදනාවටත්, කලබලයටත් පැමිණි උන්වහන්සේගේ සිවුර ගිලිහී ගස පාමුල සිටි වැද්දාගේ හිස මතට වැටුණේ ය. භික්ෂූන් වහන්සේ ගසෙන් බිමට වැටුණා යැයි සිතූ සුනඛ රැළ වැද්දා වෙතට කඩා පැන සපා කා ඔහු ජීවිතක්ෂයට පත් කළහ.

මේ තමන් කළ කම් ඒ මොහොතේ ම විපාක දුන් සැටිය. කළ කම් පළ දෙන බව බෞද්ධයිනට අමුතුවෙන් කියා දිය යුතු වූවක් නොවේ. යහපත් කර්ම කළේ නම් යහපත් පලද, අයහපත් කර්ම කළේ නම් අයහපත් පල ද විඳින්නට සිදුවේ. එහෙත් බොහෝ දෙනකුට වැරදී ඇත්තේ මේ ධර්මතාව දැන සිටියද ප්‍රායෝගිකව පුරුදු පුහුණු කොට ජීවිතයට ගළපා නොගැනීම නිසා ය.

අනුන්ට කරදරයක්, හිංසාවක්, පීඩාවක් දුකක්, වේදනාවක් නොවන ලෙස ජීවත්වන්නට හැකි අප අතරින් කීයෙන් කී දෙනාට ද? තමන්ට දැනෙන දුක වේදනාව ම, අනුන්ට ද දැනෙන බව සිතන්නේ කීයෙන් කී දෙනා ද?

සම්බුදු දහම අවධාරණය කරන්නේ ධර්මයට අනුව ජීවත්වන පුද්ගලයා ධර්මය විසින් ම ආරක්ෂා කරනු ලබන බව ය. ඒ පිරිසුදු, නිවැරැදි දහම් මඟ බුදුරජාණන් වහන්සේ අපට දේශනා කොට ඇත. මූලිකව ම උන්වහන්සේ ගිහියන් වෙත දේශනා කොට වදාළ දහම, ශික්ෂා මාර්ගය පංච ශීල ප්‍රතිපදාවය.

අනුන්ට තලා පෙළා හිංසා නොකරනතාක්, අනුන්ගේ ප්‍රාණය උදුරා නොගන්නාතාක් තමන්ගේ ජීවිතය සුරක්ෂිත ය. අනුන්ගේ දේපොළ සුරක්ෂිත කරන තාක් තමන්ගේ ද දේපළ සුරක්ෂිත ය. අනුන් බොරුවෙන් නොරවටන්නේ ද තමන්ද බොරුවට හසු නොවන්නේ ය. අනෙකුත් ධර්මතාවන් ද එලෙස ය. එහෙයිනි තමන් උපමාවටගෙන සමාජය වෙත යහපත ම මුදා හරින්නට අප ක්‍රියා කළ යුතු වනුයේ. දූහුවිලි ටිකක් ගෙන උඩු හුළඟට වීසි කළේ නම් එය පෙරළා තමන් වෙතම ආපසු පැමිණේ. ඊට ගත වන්නේ ක්ෂණයකි. අනුන්ට කරදර හිංසා නොකරන, වැරැදි නොකරන, ද්වේෂ නොකරන පිරිසුදු පුද්ගලයකුට යම් කෙනෙක් අපරාධයක් කරයි නම් එහි විපාක ඒ පුද්ගලයා වෙත ආපසු පැමිණෙන්නේ ද උඩු සුළඟට දැමූ දූහුවිලි මෙනැයි බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළහ.

අපගේ සිතිවිලි යහපත් කරගන්නට මේ උපමාවම ප්‍රමාණවත් නොවන්නේ ද? කිසිවකුගෙන් කිසිවකුට හිංසාවක්, පීඩාවක්, දුකක්, කරදරයක් නැති සමාජයක් මොනතරම් ලස්සන ද? ඒ සමාජය නිර්මාණය කරගත යුතු තම තමන් විසින්ම ය. වගකීම අනුන්ට පැවරිය නොහැකිය. මේ ගෙවී යන්නේ මිනිසාට මිනිසාගේ රැකවරණය ද සොබා දහමේ රැකවරණය ද ඇඩිව අවැසි කාලයකි. රැකවරණය ලැබීම හෝ නොලැබීම රැඳී ඇත්තේ තමන් තුළම ය. එහෙයින් කරුණා, මෛත්‍රී, ආදී ගුණාංගයන්ගෙන් තමන්ට ද, ලෝ වැසි අන් සියලු දෙනා වෙත ද කටයුතු කරන්නට සිත මෙහෙය විය යුතු ය.

# ධනය පරිහරණය පමණ දැනගෙන ද?

**ගිහි ලෞකික ජීවිතයක් ගත කරන්නා වූ පුද්ගලයාටත්, නිවන් මඟ පසක් කර ගැනීමට පැවිද්ද ලබන්නා වූ පැවිද්දාටත් ඔවුනොවුන්ගේ මෙලොව ජීවිතය මනා කළ මනාකාරීත්වයකින් යුතුව හා ආදීනව දැන ක්‍රියා කිරීමේ යහපත්කම බුදුන් වහන්සේ අවස්ථා කිහිපයක දී ම පෙන්වා වදාළ හ.**



**බැරගම ශ්‍රී රාහුල හිමි**

මිනිසා මෙලොව ජීවිතයේ දී ලබා ගන්නා සම්පත් හා ලැබෙන සම්පත් නිසි කළමනාකරණ ක්‍රමවේදයක් යටතේ පරිභෝජනය කිරීම පුද්ගල ජීවිතයේ මනා සාර්ථකත්වයට හේතුවක් බව ව්‍යග්ඝපජ්ජ, සිගාලෝවාද, පත්තකම්ම විභංග වැනි සූත්‍ර දේශනා රාශියක සඳහන් වේ.

මූලික අවශ්‍යතාවන් සේ සැලකෙන ඇඳුම්, ආහාර, නිවාස හා බෙහෙත් යන සිවුපසය පරිභෝග කිරීමේදී ද අනුගමනය කළ යුතු පරිභෝජන දර්ශනයක් ඉහත සූත්‍ර දේශනා වල අන්තර්ගත ව ඇත. මෙම මූලික මානුෂීය අවශ්‍යතා සතරෙහි ම ප්‍රමුඛාර්ථය යහපත් ජීවන වෘත්තියක් සකසා මිනිසා පෙළඹ වීමයි. ලෝකයේ ඇත්තේ සීමිත සම්පත් ප්‍රමාණයකි. එම සීමිත සම්පත් අරපිරිමැස්මෙන් යුතුව පරිහරණය කිරීම වැදගත් ක්‍රමවේදයකි. "සප්පායේ පමාණං ජානාති" යනුවෙන් මහාගෝපාලක සූත්‍රයේ දී පමණ දැන සම්පත් පරිහරණය කිරීමේ වටිනාකම ලෝකයා වෙත ලබා දෙනුයේ එම නිසා ය. පරිභෝජනය පිළිබද බෞද්ධ ආකල්පය ප්‍රධාන ශීර්ෂ දෙකක් යටතේ ගොනු කළ හැකි ය. එනම්, අවශ්‍යතා සපුරා ගැනීම හා නාස්තිය පිටු දැකීම ය.

මිත් පළමු වැන්න කෙරෙහි අවධානය යොමු කරන විට ධනය මඟින් කළ යුතු ප්‍රධානතම කාර්යය ලෙස සැලකෙන්නේ තමා සැපතට පත්වීම යි. මේ පිළිබඳ අංගුත්තර නිකායේ රාසිය සූත්‍රයේ දී කරුණු හතරක් දක්වා ඇත. එනම්,

**තමා ප්‍රයෝජනයට ගනියි, බෙදා දෙයි, පින් කරයි, ආදීනවය දැන පරිභෝජනය කරයි යනුවෙනි.**

තමා මුලින්ම සැපතට පත්ව පසුව අනෙක් කාරණාවන් පිළිබද සෙවීම සිදු කළ යුතු බව අංගුත්තර නිකායේ පත්තකම්ම විභංග සූත්‍රයේ ද එයි. එම සූත්‍රයේ දැක්වෙන සමස්ත කරුණුවල අන්තර්ගතය වන්නේ පරිභෝජනයේ දී මුලින්ම තමාගේ සැපත ඉලක්ක කරගත යුතු බව යි. ඉන් අනතුරුව මා පිය, අඹුදරු, දැසිදස් කම්කරු, යහළු මිතුරු නෑදෑ හිතවත් ආගන්තුකාදීන්ගේ අවශ්‍යතා පිළිබඳ සොයා බලා කටයුතු කළ යුතු ය. ඊට අමතරව තමා සතු සම්පත් පංචබලි සඳහා ද වැය කළ යුතු ය. එනම්,

ඤාති බලි – ඤාති සංග්‍රහ වශයෙන් සෙදවීම

අතිථි බලි – ආගන්තුක සංග්‍රහ වශයෙන් යෙදවීම

පුබ්බපේත බලි – මියගිය අය උදෙසා පින්දීම් වශයෙන් යෙදවීම

දේවතා බලි – දෙවියන්ට පින් වශයෙන් පැමිණවීම හා

රාජ බලි – රජයට බදු වශයෙන් ගෙවීම

යනු එම පඤ්චබලි සංකල්පයයි.

සිගාල සූත්‍රයේ දී
ඒකෙන භෝගෙ භුඤ්ජෙය්‍ය
ද්වීහි කම්මං පයොජයේ
චතුත්ථං ච නිධාපෙය්‍ය
ආපදාසු භවිස්සති

යනුවෙන් පරිභෝජන රටාවේ නිවැරැදි ක්‍රියාපටිපාටියක් ද හඳුන්වාදී තිබේ. යථෝක්ත සමස්ත කරුණු සම්පිණ්ඩනයක් ලෙස ගැනීමේ දී බෞද්ධ පරිභෝජන සංකල්පයේ සුවිශේෂතා රාශියක් පැහැදිලි කරගත හැකි ය. ලෝකය පුරාවටම කොවිඩ් 19 ව්‍යසනය ක්‍රියාත්මක මෙම කාල පරාසයේ දී බෞද්ධ දර්ශනයේ උගන්වන මෙම පරිභෝජන සංකල්ප ක්‍රියාත්මක කර ගැනීම මඟින් එදිනෙදා ජීවිතයේ දී ඇතිවන ආර්ථික අපහසුතා යටපත් කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

**'ලෝකයේ ඇත්තේ සීමිත සම්පත් ප්‍රමාණයකි. එම සීමිත සම්පත් අරපිරිමැස්මෙන් යුතුව පරිහරණය කිරීම වැදගත් ක්‍රමවේදයකි. "සප්පායේ පමාණං ජානාති" යනුවෙන් මහාගෝපාලක සූත්‍රයේ දී පමණ දැන සම්පත් පරිහරණය කිරීමේ වටිනාකම ලෝකයා වෙත ලබා දෙනුයේ එම නිසා ය.'**



# වැලිවිට අසරණ සරණ සරණංකර සිරි සංඝරාජ මා හිමි

03

**323 වන ජන්ම සංවත්සරය, 243 වන අනුස්මරණය හා මහා විහාරවංශික ස්‍යාමෝපසම්පදාවට වසර 268ක් සම්පූර්ණ වීම නිමිත්තෙනි.**

**මෙම ලිපියේ 2 කොටස පසුගිය පොසොන් අව අටවක පෝදා පත්‍රයේ පළ විය**

**සම්බුද්ධ ශාසනය යනු උපසම්පදාවයි. උපසම්පදාවක් නැති නම් ශාසනය නොපවතී. ඒ නිසා ම නවරට සසුන් පිහුටු වීමට පස් නමකට අධික පිරිසක් යැවූයේ පැවිදි උපසම්පදාව පිහිටු වීමේ ප්‍රාර්ථනාවෙනි. එදා ආරම්භ කළ සම්බුද්ධ ශාසනය අද දක්වා ම පවත්වාගෙන ඒමට හැකි වූයේ උපසම්පදා භික්ෂූන් වහන්සේ නිසා ම ය.**

උන්වහන්සේලා ආරක්ෂා කිරීම, සිවුපසයෙන් ඇප උපස්ථාන කිරීම ආදිය රජයේ මෙන් ම මහජනතාවගේ පරම යුතුකම වූ නිසා එකී උපසම්පදාව අඛණ්ඩව පවත්වාගෙන ඒමට රාජරාජ මහාමාත්‍යාදීන් කටයුතු සිදු කරනුයේ ඒ නිසාම ය.

මේ අයුරින් සම්බුද්ධ ශාසනයත්, රටත් ජාතියත් සංස්කෘතියත් වැඩි දියුණු වූ මොහොතක පොළොන්නරු යුගයේ දී කාලිංග මාඝ කළ විනාශයත් කෝට්ටේ යුගයේ දී සපුමල් කුමරු හය වන බුවනෙක බා නමින් රජවීමෙන් පසු ඇති වූ ගැටුම් නිසාත්, පෘතුගීසීන්ගේ පැමිණීමෙන් පසු ක්‍රිස්තු ධර්මය ව්‍යාප්ත කිරීමත්, ධර්මපාල කුමරු දෙන් ජුවාන් නමින් ඔටුනු පැළඳීමත් නිසා කෝට්ටේ යුගයේ දී විශාල බෞද්ධ පිරිස් ක්‍රිස්තියානි කරවීය.

පෘතුගීසීන් ඇති කළ බෞද්ධ විරෝධී මහා කැරැල්ල නිසා සමහර බෞද්ධයින් ක්‍රිස්තියානි වූ අතර එසේ නොවූ අයට කසපහර, කඩුපහර, වෙඩි පහර, හිරගෙදර දැමීම, දඩගැසීම ආදී හිංසා කිරීම නිසා ඔවුන් ද ක්‍රිස්තියානි කරමින් බෞද්ධ වෙහෙර විහාර ගොඩනැඟිලි කඩා පොළොවට සමතලා කළහ. බෞද්ධ ප්‍රතිමා මන්දිර කඩා ක්‍රිස්තියානි පල්ලි හා ප්‍රතිමා සෑදී ය. සිංහල බෞද්ධයන් රාජ ද්‍රෝහීන් බවට පත් කරමින් බෞද්ධ පොත් පත් ඇති පුස්තකාල ගිනිබත් කිරීම ආදි මේ සියල්ල පෘතුගාලයේ මහරජුගේ නියමයෙන් වූ බව ප්‍රකාශ කරමින් පන්සල් පිරිවෙන් අධ්‍යාපනය විනාශ කොට කතෝලික පාසල් ආරම්භ කරමින් සිංහල බෞද්ධයන් ක්‍රිස්තියානි කරන ලදි.

පෘතුගීසීන් කළ බෞද්ධ සංහාරය ලන්දේසීන් විසින් ද ඒ අයුරින්ම කිරීම නිසා භික්ෂූන්ට පමණක් නොව ගිහියන්ටත් බෞද්ධ නමින් පෙනී සිටීම මරුවා තමන් වෙත කැඳවා ගැනීමක් විය. සීතාවක පළමුවන රාජසිංහයන් ද පියා මරා බලයට පත්වීම පිතෘඝාතක අකුසලයක් බව භික්ෂූන් පෙන්වා දුන් හෙයින් රජු බුදු සමය අතහැර ශිව ආගම වැළඳ ගත්තේය. බෞද්ධ සංහාරයක් අරඹා පන්සල් වෙහෙර විහාර කඩා විනාශ කරමින් භික්ෂූන් දහස් ගණනින් මරා ශ්‍රී පාදය වැනි බෞද්ධ සිද්ධස්ථාන ශිව භක්තිකයන්ට දී බෞද්ධ පොත්පත් පුස්තකාල ආදිය විනාශ කරන ලදි.

රට අවුල් ජාලයකට පත්විය. පෘතුගීසි, ලන්දේසී, සිංහල යන ඔවුනොවුන් අතර ද සටන් ඇතිවීමෙන් බුද්ධ ශාසනය අන්ත පරිහානියට පත්විය. පළමු වන රාජසිංහයන් උණකටුවක් ඇනී මරණයට පත්විය. මෙවන් මොහතක සිංහල ජාතියත්, සංස්කෘතියත්, ධර්ම ශාස්ත්‍ර හා සම්බුද්ධ ශාසනය සමග ම උපසම්පදාව ද පරිහාණියට පත්වීම නොවැළැක්විය හැකි විය. මේ අයුරින් පිරිහෙමින් පැවති මහනුවර යුගයේ දී වැලිවිට අසරණ සරණ සරණංකර සාමණේරයාණන් වහන්සේ පහළ වූහ.

වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමි
ශකවසින් එක්දහස් –
සසිය විස්සක් පිරිවස්
සතවක රිවි දවස් –
උතුරුපුටුපෙන් අවපොසොන් මස්
තුන්පනේ වැලිවිට –
ගොවිකුල මුදලි කෙනෙකුට
දාව පිරිසිදු කොට –
ඉපිද වැඩෙමින් සොළොස් වයසට
(සඟරජ වත)

මධ්‍යම පළාතේ මහනුවරදිස්ත්‍රික්කයේ තුම්පනේ ගංඅට පළාතේ වැලිවිට පහළගම වත්තේ වළව්වේ තුම්පනේ හා වෙල්ලස්ස පාලනය කළ වික්‍රමසිංහ තිලකරත්න වාසල කුලතුංග මුදියන්සේලාගේ වැලිවිට කුලතුංග මුදලිතුමාගේ හා බිබිල මැදගම වැලිවිට ලොකුකුමාරිහාමිගේ පුත් රුවනක ලෙස රාජ්‍ය වර්ෂ 1698 ජූනි 18 වෙනි ඉරුදින උපත ලබා වැලිවිට කුලතුංග බණ්ඩා නමින් හැදී වැඩුණි.

පස්වියෙහි දී එරමුදුලියද්දේ උපාසකරාල හා මුරුත්දෙණියේ හේරත්ගෙදර ගුරුතුමාගෙන් මූලික අධ්‍යයනය ලබා සොළොස් වියෙහි දී පෝය මලු විහාරයේ වැඩ විසූ වටපුළුවේ හිමියන්ගේ ශිෂ්‍යයෙක් වූ ද දෙවැනි විමලධර්ම සූරිය රාජ්‍ය කාලයේ දී රක්ඛංග දේශයෙන් ගෙනා උපසම්පදාව ලබා සිටි සූරිගොඩ ශ්‍රී නරේන්ද්‍රාරාමාධිපති සූරියගොඩ කිත්සිරිමෙවන් රාජසුන්දර මහතෙරුන් වෙතින් උතුම් වූ පැවිද්ද ලැබී ය.

කෝට්ටේ යුගයේ පටන් ඇති වූ පෘතුගීසි, ඕලන්ද බලපෑම් ද බුවනෙකබා පළමුවන රාජසිංහ ආදි රාජ්‍ය කාලවල දී සාපරාදී ක්‍රියාවන්ගෙන් වැනසී ගිය ශාසනික ආගමික ජාතික පරිහානිය වැළැක්වීමට නොහැකිව අති බිහිසුණු ත්‍රාස ජනක හිංසාවන්ට මුහුණ දෙමින් කටයුතු කිරීමට සිංහල බෞද්ධයන්ට සිදු වූයෙන් බෞද්ධ සිරිත්–විරිත් පැවැත්වීමට නොහැකි වූයේ ඒ සියල්ල අමතක විය.

බෞද්ධකම කෙසේ වුවත් බෞද්ධ නම ලක් පොළවෙන් සම්පූර්ණයෙන් විනාශ වී යාමට ඉඩ නො දී ඉමහත් දුෂ්කරතා මධ්‍යයේ ජීවිත පරිත්‍යාගයෙන් සාමණේර, ගණින් යන නම්වලින් පෙනී සිටිමින් බෞද්ධ නාමයත්, ප්‍රතිමා, චෛත්‍ය, විහාර මන්දිර, දාකරුඬු, පෙති පිළිම, පෞරාණික පොත්පත් හා ලේඛන, විහාර සන්තක ඉඩකඩම් ආදිය ආරක්ෂා කර ගනිමින් පිළිම ගෙවල් අඳුරේ නොතබා බුද්ධ පූජා පවත්වමින් බෞද්ධ උරුමය, බෞද්ධකම ආරක්ෂා කර ගැනීමට ඔවුන් කළ උදාරතර සේවය හා කැපවීම අගය කළ යුතු ය.



සෝමවති රාජමහා විහාරාධිපති
මහා විහාරවංශික ස්‍යාමෝපාලි මහා නිකායේ
මල්වතු මහා විහාර පාර්ශ්වයේ
වැඩබලන ලේඛකාධිකාරි
ආචාර්ය **පහමුණේ සුමංගල හිමි**

නැකැත්, වෙදකම්, යන්ත්‍රමන්ත්‍රවලට යොමුවෙමින් සමාජ සේවයක් කරමින් සමාජ ප්‍රභ!වය ලබා ගෙන විහාරස්ථානය වෙතට ගම ඇදබැඳ තබා ගැනීමට සමත් වූහ. වත් පිළිවෙත් පිරීමක් හෝ ශ්‍රමණ ආකල්ප ගැන වැටහීමක් නොවූ අතර භාෂා සාහිත්‍යය, ශබ්ද ශාස්ත්‍ර, ධර්ම–විනය පරිහානියට පත් වී තිබූ හෙයින් ඒවා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට නිසි මගක් නොවී ය.

එවන් අවස්ථාවක සරණංකර සාමණේරයන් වහන්සේගේ මූලික අභිප්‍රාය වූයේ සංඝ ශාසනය වැඩි දියුණු කිරීමත් භාෂා සාහිත්‍යය, ශබ්ද ශාස්ත්‍ර ධර්ම විනය වැඩි දියුණු කොට සම්බුද්ධ ශාසනය බැබළවීම යි.

පොතපත සොයා ගැනීමට මෙන් ම ගුරුවරයකු සොයා ගැනීමේ ඉමහත් දුෂ්කරතාව නිසා සුවිශාල පරිශ්‍රමයක් දරමින් මාකෙහෙල්වල සිරගත කර සිටි ලෙව්කේ රාළහාමි වෙත ගොස් බාලාවතාරය මුල් කොටසත්, පෝයමළු විහාරයේ පල්කුඹුරේ අත්‍ථදස්සි හිමිගෙන් ඉතිරිකොටස ද ඉගෙන ගනිමින් ස්ව උත්සාහයෙන් ත්‍රිපිටක ධර්මය හා පාලි, සිංහල, සංස්කෘත භාෂා පිළිබඳ විශාරදත්වයට පත්වෙමින් ඒවා උගන්වමින් කටයුතු කිරීම නිසා විශාල ගිහිපැවිදි පිරිසක් සම්බන්ධ වීමෙන් සිල්වත් සමාගමක් ඇති විය.

සරණංකර සාමණේරයන් වහන්සේ සම්බුද්ධ ශාසනයට හා ධර්ම ශාස්ත්‍රය දියුණු කිරීමටත්, මහජනාවට කරන ඉමහත් සේවය නො ඉවසිය හැකි පිරිස නරේන්ද්‍රසිංහ රජතුමා නොමග යැවීම නිසා රාජ උදහසට ලක් වූයේ සරණංකර සාමණේරයන් ලග්ගල සිරගත කරන ලදි.

එවන් අවස්ථාවක ගුරුවර්ණ පිළි හැඳ පෙරවූ බමුණෙක් නුවර පැත්තට එන බව අසා උපසම්පදා නමක් යැයි සිතා හඟුරන්කෙත මඟුල්මඩුවට ගෙන්වා ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා මැති අමැති පිරිවරා අවුත් රන් මොළවක අධිකාරම් තිලමේ ලවා කථා කිරීමේ දී,

**විද්වානෙව විජනාති
විද්වජ්ජන පරිශ්‍රමම්
න හි වන්ද්‍යා විජානාති
ගුර්විං ප්‍රශව වේදනා"**

(උගතෙක් වන වෙහෙස උගතෙක් ම දනී. දරු ප්‍රසූතියෙන් වන වේදනාව ද දරුවන් නැති තැනැත්තියක් නොදනී.)

මෙමෙ සංස්කෘත පද්‍යය නොතේරීම නිසා විහාර දෙකේ සාමණේරයන් ද ගෙන් වූ නමුත් ඒ කිසිවෙකුට පහදා දීමට නොහැකි වූයෙන් ලග්ගල සිරගත කර සිටි සරණංකර සාමණේර හිමියන් ගෙන්වා විමසූ කල සිංහල, පාලි, සංස්කෘත භාෂා තුනෙන් ම දේශනා පැවැත්වීම නිසා මල්වතු අස්ගිරි විහාර දෙකේ සාමණේර වහන්සේලා හා රජතුමා ඇතුළු හැම දෙනාම ඉමහත් සතුටට පත්වූහ.

දෙවෙහෙර සාමණේරයන්ගේ හා රජතුමාගේ සහයෝගය නිසා පළමුකොට පෝය මළු විහාරය මුල් කොට ගිහි–පැවිදි දෙපක්ෂයට ම අධ්‍යාපනය ලබා දෙමින් තවතවත් අධ්‍යයන කටයුතුවල යෙදෙමින් ග්‍රන්ථ සම්පාදනය කිරීමෙන් ද මුනිගුණාලංකාරය හා අභිසම්බෝධි අලංකාරය රචනා කිරීමෙන් අනතුරුව පෝයමළු විහාරයේ වැඩ වෙසෙමින් කරන මෙවන් ධර්ම ශාස්ත්‍ර සේවය දුටු නරේන්ද්‍රසිංහ රජතුමා රාජ්‍ය වර්ෂ 1726 වර්ෂයේ දී කරන ලද ආරාධනය අනුව "සාරාර්ථ සංග්‍රහය" ග්‍රන්ථය ලියා රජතුමාට ම පිළිගැන්වීමෙන් අපමණ සතුටට පත්ව ඇතෙක් පූජා කළ ද එය ප්‍රතික්ෂේප කොට ගිහි–පැවිදි දෙපක්ෂයට ම අධ්‍යයනය ලබාදීමට සහාය ඉල්ලාසිටි නිසාම තව තවත් රජතුමා මෙන් ම උභය විහාරවාසී සාමණේරයන් වහන්සේලාගේ ද කරුණාවට පාත්‍රවිය.

**මෙම ලිපියේ තවත් කොටසක් ඇසළ පුර අටවක පෝදා පුවත්පතේ පළ වේ**



# සමාජ මාධ්‍ය භාවිතයේ

## හොඳ නරක ගැන දරුවන්ට කියා දෙන්න

**වර්තමානයේ ඇති වී තිබෙන වසංගත රෝග තත්වය නිසා පාසල් මෙන්ම විශ්ව විද්‍යාල ද වසා ඇති බව අප හැමෝම දන්නා කාරණාවකි. එම හේතුව නිසා බොහෝ දරුවන් තම ඉගෙනීමේ කටයුතු සිදු කරනු ලබන්නේ online මාර්ගගත ක්‍රමය ඔස්සේ ය.**

අද අප සාකච්ඡා කරනු ලබන්නේ එම online මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉගෙනීමෙන් අත්වන අතුරු ප්‍රතිපල පිළිබඳව ය. බොහෝ මව්පියන් මේ කාරණය පිළිබඳ අඩු සැලකිල්ලක් දක්වන නිසා බොහෝ දරුවන් වැරදි මඟට යොමු වී ඇති බව පෙනේ.

වර්තමානයේ තම පෞද්ගලික තොරතුරු තවත් කෙනකු අතට පත්වීමෙන් බොහෝ සෙයින් පීඩාවට පත්වන්නේ නව යොවුන් වියට හා පෙර සහ මුල් නව යොවුන් වියේ පසුවන්නන් ය.

බොහෝ වෙබ් අඩවිවල වයස් සීමාවකින් තොරව බොහෝ දෙනකු හා මාධ්‍ය අතර ඇත්තේ සමීප සබඳතාවකි. මෙමඟින් දරුවාගේ හැඟීම්, ආකල්ප, හැසිරීම් පිළිබඳ පිරික්සීමේ දී අවම වශයෙන් දරුවකු දිනකට පැය තුන හතරක්වත් සමාජ සංගීතය, වීඩියෝ ක්‍රීඩා සහ සමාජ මාධ්‍ය බහුලව භාවිත කරන අතර අවුරුදු 12 ත් 17 ත් අතර දරුවන් වීඩියෝ ක්‍රීඩාවලට මෙන්ම සමාජ මාධ්‍ය භාවිත කිරීමට වැඩි නැඹුරුතාවක් දක්වන බව පර්යේෂණ මඟින් තහවුරු වී ඇත.

වර්තමානය වන විට ළමයාගේ ආකර්ශණීය මාධ්‍ය රූප මාධ්‍යය වේ. ජංගම දූරකථන හා පරිගනක ළමුන් අතර වඩාත් ජනප්‍රිය වී ඇත්තේ මේ නිසාවෙනි. ගුවන් විදුලිය, රූපවාහිනිය සහ පුවත්පත් වැනි ප්‍රධාන දහරාවේ ජනමාධ්‍ය අතික්‍රමණය කරමින් සමාජ මාධ්‍ය පෙරට ඒම වර්තමානය වනවිට දැකිය හැකි තත්ත්වය යි. මේ නිසාම සමාජ මාධ්‍යවල ඇබ්බැහිකරුවන් බවට පත් වී ඇත්තේ ද තරුණ දරුවන් ය. සමාජ මාධ්‍ය තුළින් පොදුවේ ඇතිවිය හැකි බලපෑම් තුනකි. එනම් හැසිරීම් කෙරෙහි වන බලපෑම, ආකල්ප කෙරෙහි වන බැලපෑම හා හැඟීම් කෙරෙහි ඇතිවන බලපෑම ය.

මේ ආකාරයන් මඟින් දරුවන්ට ඇතිවන බලපෑම කෙබඳු ද කියතොත් අමෙරිකාවේ පැය තුනකට වරක් වෙඩි තැබීමකින් දරුවකු මිය යන අතර විනාඩි පහකට වරක් ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් දරුවකු අත්ඩංගුවට ගැනීම ද සිදුවේ.

> ගුවන් විදුලිය, රූපවාහිනිය සහ පුවත්පත් වැනි ප්‍රධාන දහරාවේ ජනමාධ්‍ය අතික්‍රමණය කරමින් සමාජ මාධ්‍ය පෙරට ඒම වර්තමානය වනවිට දැකිය හැකි තත්ත්වය යි. මේ නිසාම සමාජ මාධ්‍යවල ඇබ්බැහිකරුවන් බවට පත් වී ඇත්තේ ද තරුණ දරුවන් ය.

එසේම බොහෝ සමාජ මාධ්‍ය ප්‍රචණ්ඩත්වය හා ලිංගිකත්වය හුවා දැක්වීම මඟින් ද බොහෝ දරුවන් අවාසනාවන්ත ලෙස අවිචාරවත් ලිංගික සබඳතා හා අනාරක්ෂිත හුරුපුරුදු, අයහපත් සෞඛ්‍ය පුරුදුවලට මෙන්ම මත්කුඩු හා මත්ද්‍රව්‍ය වලට පෙළඹීම ද සිදු වෙයි. එම හේතු නිසා මේ කාලයේදී විශේෂයෙන් ම ඔබේ දරුවා පිළිබඳ සැලකිලිමත් ව ඔවුන් සිදුකරන ක්‍රියාවන් පිළිබඳ අධීක්ෂණයෙන් යුතුව දරුවාට සමාජ මාධ්‍ය මඟින් ඇතිවිය හැකි ගැටලු මෙන්ම එහි ඇති ඵලදායිත්වය පිළිබඳව ද දැනුවත් කොට ළමා පරපුර නව පෞරුෂයක් නව සමාජයක් හා නව ලෝකයක් කරා මෙහෙයවීමේ බලය මාධ්‍ය සතු වන අතර ඉන්ද්‍රිය වර්ධනය, හැඟීම් සංවර්ධනය, සමාජ අවබෝධය, සමාජ සබඳතා හා භාෂා වර්ධනය කෙරෙහි යහපත් බලපෑම් ද ඇතිකරනු ලබයි.

එසේම දරුවන්ගේ ස්වයං අත්හදා බැලීම් විෂයයෙහි වර්ධනය ඇතිකිරීමටත්, සන්නිවේදන හා නිර්මාණාත්මක හැකියා වර්ධනය-ටත් මාධ්‍ය ඉවහල්වන බව කිවයුතු ම ය.

එමනිසා online මාරයාගෙන් ඔබේ දරුවා සුරක්ෂා කොට යහපත් ලෙස මාර්ගගත කිරීම වත්මන් වැඩිහිටි සියලු දෙනාගේ ම මෙන්ම බලධාරීන්ගේ ද වගකීමකි.

මොරටුව ලුනාව ශ්‍රී බෝධිරාජාරාම විහාරවාසී

**දාම්මල සුමනජෝති හිමි**



## සුසුම

සුසුම ඇයි මා අතැර යන්නේ
සිත් බිඳීමක් වුණිද නැහැනේ
ගියොත් ඔබ නෑ යළිත් එන්නේ
සැබෑඳියාවන් නිමා වෙන්නේ

උපන් ද සිට අතැර නොගොසින්
ඔබ ම පමණයි ළඟම උන්නේ
ඔබ ව මෙතරම් වටිනවා දැයි
අතැර යන තුරු නැහැනෙ දැනුනේ

හඬා වැටෙනා බියෙන් තැතිගෙන
මිනිසුන්ගෙ දුක දෙස බලා
නොයා ඉනු මැන වෙලා ඉක්මන්
සැවොම දුක් කඳුළින් තෙමා

**තලල්ලේ චන්දකිත්ති හිමි**

# කෝවිඩ් වසංගත රෝගය හමුවේ බිඳවැටෙන කායික හා මානසික සෞඛ්‍යය රැක ගත යුතු හැටි



අමෙරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා ප්‍රාන්තයේ ක්ලාරා නුවර බුද්ධි විහාරවාසී රාජකීය පණ්ඩිත

**කොටපොළ චන්දිම හිමි**

**2019 වසර අග භාගයේ චීනයේ වුහාන් නගරයෙන් ව්‍යාප්ත වූ කොරෝනා වෛරස හෙවත් කොවිඩ් 19 වසංගතය 2021 ජුනි මස මුල් සතිය වන විට ලොව රටවල් 222 ක මිලියන 173 කට අධික ජනයා රෝගාතුර කොට ඉන් ලක්ෂ 37 කට අධික පිරිසක් මරුමුවට පත්කොට ඇත.**

ලොව මෙතෙක් අත්දුටු දරුණුම වසංගතයක් වූ මෙය පාලනය කිරීමට දැනට යෝජිත ක්‍රම අතරින් ප්‍රතිශක්තිකරණ එන්නත් කිරීමත්, සංචරණ සීමා පැනවීමත් සාර්ථකම ක්‍රියාමාර්ග ලෙස හඳුනාගෙන ඇත.

මෙම සංචරණ සීමා කිරීම් හමුවේ ආර්ථික, සාමාජික, ආගමික හා දේශපාලනික අපහසුතා රැසකට මුහුණදීමට ලොව බොහෝ දෙනකුට සිදුව ඇති අතර, එය සමස්ත ලෝකවාසීන්ගේ කායික හා මානසික සෞඛ්‍යයට ඉතා දැඩි බලපෑමක් එල්ලකර තිබේ. බෞද්ධයකු ලෙස මේ තත්ත්වයට මුහුණදී ඒ කළමණාකරණය කරන්නේ කෙසේද යන්න මෙම ලිපියෙන් අපි විමසා බලමු.

### මෙත් සිත හා කාරුණික බව

අප මෙතෙක් මෛත්‍රී භාවනාව ප්‍රගුණ කළෙමු. දැන් කාලය පැමිණ ඇත්තේ එම මෛත්‍රිය හා කරුණාව පෙරදැරිව අවදියෙන් කටයුතු කිරීමට ය. ඔබේ මුඛාවරණ පැළඳීම හා දෑත් නිතරම පිරිසුදු කිරීම සිදුකළ යුත්තේ පොලීසියට හා නීතියට බියෙන් නොව සියලු සත්වයින්ගේ ම යහපත වෙනුවෙන් බව නිතර සිහිපත් කරන්න.

ඔබ තරුණ වියේ පසුවන නිසා මෙම කොවිඩ් රෝගය ඔබට වැළඳුණ ද එය එතරම් දෙයක් නොවන බව සිතනවා නම්, ඔබ දෙවරක් සිතා බැලිය යුතු ය. මන්ද ඉන්දීය කොවිඩ් ප්‍රභේදය නිසා වැඩිපුරම මිය ගිය පිරිස වයස 18 - 40 අතර අය නිසාය. "මම මරණ ධර්මතාවය ඉක්මවූ කෙනෙක් නොවන බව ද මා නිසා වෙනත් කිසිවකුගේ ජීවිතයට උවදුරක් නොවේවා යන මෙත් සිතින් ද නිතර සිත අවදිමත් කොට, එදිනෙද කටයුතුවල යෙදෙන්න. එසේ කටයුතු කිරීම ලොවට අභයදානය දීමකි. ප්‍රතිශක්තීකරණ එන්නත ලබා ඇති විට ද ඔබ එකී සෞඛ්‍ය පුරුදු අඛණ්ඩව කළ යුත්තේ, "තවමත් මම වාහකයකු වීමේ හැකියාව ඇති අයකු බව" දයානුකම්පිත ව සිතමිනි.

### ආතතිය මඟහරිමු

මෙබඳු තත්ත්වයන් තුළ මානසික පීඩා හා ආතතිය ඇති වීමට ඉඩකඩ බොහෝ ය. භය, අපේක්ෂා භංගත්වය හා අවිනිශ්චිතබව මිත් නිසැකව ම ඇතිවන සෘණ හැඟීම් වේ. වසංගත තත්ත්වයන් නිසා සිදුවන සංචරණ සීමා කිරීම් හා ආර්ථික අවපාතයන් නිසාද, සාමාජික සබඳතා සීමාවීම නිසාද එබඳු හැඟීම් අපතුළ මෝදුවිය හැකි ය. එබඳු තත්ත්වයක් තුළ අප සුබවාදීව සිතිය යුතු කෙසේද?


සත්‍ය තත්ත්වය නම් මෙම තත්ත්වය මීටත් වඩා දරුණු විය හැකිව තිබූ බවයි. නමුත් ඔබේ පැරැණි යහපත් කර්මවලට ස්තුති වන්නට ඔබේ ජීවිතය යහපත්ව තිබීම ගැන සතුටු වන්න.

ලොව ඇතැම් රටවල මිනිස්සු කුසගින්න නිසා සංචරණ සීමා සමය තුළ මිය ගියහ. ඔබට එබන්දක් වී නැත. ඔබට එක වේලක් හෝ ආහාර ගනිමින් ජීවිතය පවත්වා ගත හැකිව තිබේ. රස මසවුළු නැතත් තිබෙන ආහාරය ගැන සතුටු වන්න. ඇතැම් මිනිසුන් රැකියාව අහිමිව මහ මඟට වැටුණමුත්, ඔබට තවමත් හිසට වහලක්, ඇතුව තිබීම පිළිබඳ සතුටු වන්න. කවර බාධක පැමිණිය ද, එවිට ඒ බාධක පමණ ඉක්මවා නොදැක, මෙය මීට වඩා බරපතළ වීමට තිබූ බවත්, මේ බාධක කුඩා ඒවා බවත් තේරුම්ගෙන කටයුතු කරන්න.

මේ තත්ත්වය ද සදාකාලික නොවන අතර, තාවකාලික ය. මේ නරක සමය ද වෙනස්වී ගොස් යහපත් සමයක් පැමිණෙන බව තේරුම්ගෙන "මේකත් වෙනස්වෙනවා" යැයි සිතමින් අනිත්‍යානුපස්සනාවෙන් වර්තමාන ස්වභාවය දකින්න.

### වර්තමානයට අනුගත වන්න

මනඃකල්පිතයන්වල නොසිට, අතීතයේ ගෙවූ කාලය සමඟ මේ වත්මන් මොහොත සංසන්දනය නොකොට වර්තමාන මොහොතේ යතාර්ථය පිළිගෙන සිත සාමාකාමී කරගන්න. අතීතයේ කොතරම් නිදහසක් හා සතුටක් සහිත අවස්ථා වූව ද, ඒ සියල්ල අවසන් බවත් මේ මොහොත ඒවායෙන් වෙනස්, අලුත්ම නැවුම් එකක් බවත් තේරුම්ගෙන සිත මේ මොහොතට අනුගත කර ගන්න.



### අනවශ්‍ය වියදම් කපා හරින්න

සංගීත සංදර්ශන, චිත්‍රපට ශාලා, සැණකෙළි, ක්‍රීඩා උත්සව ආදී සෙනඟ ගැවසෙන ස්ථාන වසංගතය අවසන් වනතුරු භජනය නොකිරීමට නුවණැත්තෝ වගබලා ගත යුතු ය. වෙළඳසැල් හා රජයේ කාර්යාල සේ ම රැකියාස්ථානවලට නිතර යායුතු වූව ද, එම සංචාර මනා සිහියෙන්, සෞඛ්‍යාරක්ෂිත ක්‍රම මැනවින් පිළිපදිමින් සිදු කළ යුතු ය. බාහිර සමීපතමයන් හමුවීමේ දී, "මේ මාගේ නෑයාය, මේ මාගේ මිත්‍රයා ය" යන්න නොසලකා, සැමගේ ආරක්ෂාව වෙනුවෙන් මුඛාවරණ අඛණ්ඩව පැළඳීම නුවණට හුරු ය. මන්ද යත් රෝගය එබඳු නෑ මිතුරු සබඳතා කිසිවක් නොහඳුනන හෙයිනි. එය නොතකන දුර නොබලන සැම විටම ඔබ අනතුරේ හෙළන්නේ සමස්ත සමාජයයි.

එහෙයින් වර්තමානයට එළඹසිටි සිහිය ඉතාමත් වැදගත් වේ.

### කාලසටහනකට අනුව වැඩ කරන්න

ඇතැම් කෙනෙක් තමන් නිවසේම සිටින හෙයින් අලස වීමට ඉඩ ඇත. එසේ නැතිනම් ඔබ අන්තර්ජාලය ඔස්සේ රැකියාව කරන්නේ නම් මුළු දවසම ඉඩ තිබේ යැයි කාර්යාල කටයුතු අතපසු කිරීමට හෝ කල්දැමීමට ඉඩ ඇත. මේ ගැන ඉතාමත් අවදිමත් වන්න. මන්ද, එය පසුව මානසික ආතතියක් ඇති කිරීමට තුඩුදෙන පුරුද්දක් බැවිනි. එසේ කල්තැබූ වැඩ ගොඩගැසී ආතතියට පත් බොහෝ කාර්යාල සේවකයන් මේ කාලසීමාවේ අපට බොහෝ සෙයින් මුණ ගැසිණි. එය ඔබට නොවීමට, වගබලා ගත යුතු ඔබ ම ය.

රැකියා කටයුතු හා අධ්‍යාපන කටයුතු ලැප්ටොප් පරිගණක හා ජංගම දූරකථන ඔස්සේ සිදුවන බැවින් එයට ඇබ්බැහි වීමට වැඩිහිටියන් හා ළමුන් ද පෙළඹීම සුලබ ලක්ෂණයකි. කායික හා මානසික සෞඛ්‍යයට මෙය ඉතාමත් භයානක ය. සමාජ මාධ්‍ය Facebook, Twitter, instagram, tiktok ආදීන් තුළ ඔබේ ජීවිතය දියවීමට ඉඩ නොදී බුද්ධිමත් ව අවශේෂ කාලය ගත කරන්න. මිනිත්තු 45 කට වරක් තිරය වෙතින් ඇස් ඈත්කොට ඇස්වලට මිනිත්තු පහක විවේකයක් දෙන්න. අනවශ්‍ය දෙයට ගෙවන ඔබේ ජීවිත කාලය මේ වටිනා මනුෂ්‍ය ජීවිතය අපතේ හැරීමක් වන අතර, ඒ කාලය ඇතුන් ලවාවත් යළි ලබා ගත නොහැකි බව තේරුම් ගන්න.

### කාල නාස්තියට හොඳම විසඳුම

දෛනික කාලසටහන මේ කාල නාස්තියට හොඳම විසඳුමයි. හිමිදිරියේ පිබිද කලින් නින්දට යන පරිදි කාලසටහනකට දවසේ සියලු කටයුතු පෙළ ගස්වාගන්න. එය ඔබේ ආතතිය හා වෙහෙසකර බව දුරුකර, සැහැල්ලුවක් පිළිවෙලක් සේ ම කාලය නිසිපරිදි කළමණාකරණයක් ඇති කර දෙනු ඇත.

### අලුත් හැකියාවක් පුරුදු වෙමු

නිවසේ සිටීම නිසා දැන් මහ මඟට සේ ම අවශේෂ කටයුතුවලට ගෙවුණ කාලය ඉතිරි බව සත්‍යයකි. එහෙත් එම කාලය සමාජජාලා හෝ පරිගණක ක්‍රීඩාවලට යොදන්නේ නම් එය අනුවණ කටයුත්තකි. එම කාලය ඒ වෙනුවට ඵලදායී අලුත් කුසලතාවක් ඇතිකර ගන්නට යොදාගත හැකි ය.

අලුත් භාෂාවක් ඉගෙනීම, කෑම ඉවීම, කායික ව්‍යායාම ප්‍රගුණ කිරීම, ක්‍රීඩා පුහුණුව, කවි, කෙටිකතා, නිසඳැස් හෝ ලිපි සම්පාදනය, පොත් කියවීම හෝ තමන් කැමති විෂයයක් ඔස්සේ තොරතුරු ගවේෂණය ද, චිත්‍ර ශිල්පය ද, වඩුවැඩ හෝ මූර්ති නිර්මාණය ද, මැහුම් ගෙතුම් ද කුඩා හෝ නව නිෂ්පාදනයක් බිහි කිරීමට ද මෙම කාලය යොදා ගත හැකි ය.

පරිගණක උපාංග හැකියා දියුණු කිරීම ද, අන්තර්ජාලයේ අධ්‍යාපන පාඨමාලා අඩවිවල පාඨමාලාවක් හැදෑරීම ද, වීඩියෝ නිර්මාණ හා සංස්කරණ ශිල්පය ද, අන්තර්ජාල රැකියාවක තාවකාලිකව යෙදීමට ද මෙය යොදාගත හැකි ය.

අප්‍රමාදීව කටයුතු කරන්නා මෙලොවත් පරලොවත් දෙකම ජයගන්නා බවත්, විශේෂයෙන් නොසිතන තැනැත්තා විශේෂත්වයට පත් නොවන බවත් අප හොඳින් සිත තබාගත යුතු ය.


### ආධ්‍යාත්මික ව දියුණු වෙමින් දහම් මඟට පියවර තබන්න

මෙම වසංගත කාලය අපට කියාදෙන වැදගත්ම පාඩම නම් ජීවිතයේ අනිත්‍ය බවයි. නානාවිධ වයස් මට්ටම්වලට අයත් ස්ත්‍රී, පුරුෂ, දුප්පත් හෝ ධනවත් බලහීන හෝ බලවත්, උගත්, නූගත්, ජනීජනයන් ලක්ෂ ගණනක් වසංගතය හමුවේ මියගියහ. බිලියන ගණන් ඉපැයූ මහා සමාගම් බංකොළොත් වූයේ සති කිහිපයකිනි. රැකියා අහිමි වූ අය අමෙරිකාවේ පමණක් මිලියන 50 ඉක්මවා ඇත. බාහිර රැස් කර ගත් කවර ධනයක්, දේපළක්, වස්තුවක් වුව ද, ඒවා අප පාලනයේ නොපවතින බව තේරුම්ගෙන අස සදාකාලික වූ ධනය ඉපැයීමට උත්සුක විය යුතු ය. ධර්ම මාර්ගයේ පියවර තැබිය යුතු ය. සසර පුරා අප පසුපස එන එකම ධනය පිනත්, කුසලයත් පමණි.

පෙර සිහියෙන් සීලය නොරැකියේ නම් මේ සීලය දියුණු කිරීමට කාලයයි. භාවනා පුහුණුවේ යෙදී සමාධියත්, ප්‍රඥවත් ප්‍රගුණ නොකළේ නම් මේ ඊටද කාලයයි. ධර්මය ප්‍රඥව යොදමින් නූගත්තේ නම් එම පවිත්‍ර සිරි සද්ධර්මය අවබෝධ කිරීමට කාලයයි.

හෙට ඕනෑදෙයක් විය හැකිය. නුවණැත්තෝ අඛණ්ඩව කවරක් වූවද දහම් මඟ දියුණුවීම නොනවතන හෙයින් එබඳු නුවණැතියකු වන්න. අසල්වැසියන් පිළිබඳ විමසිලිමත් වෙමින් කරුණාවන්ත වන්න. හැකි පමණින් නැතිබැරි අයට මදක් හෝ පිහිටවන්න. වචනයෙන් හා මෙත් සිතින් සැමට දිරිමත් වදනින් අස්වසන්න. නිවසේ උදේ සවස පවුලේ අය සමඟ බුද්ධ වන්දනාවේ හා බුද්ධ පූජාවල නියුතු වන්න.

# ධර්ම විනය පිළිබඳ ගැටලු තිබේ නම් සුදුසුම දේ සංගායනාවක් පැවැත්වීමයි



**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ සයාමෝපාලි වංශික මහා නිකායේ කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ අනුනායක ධුරන්ධර අග්ගමහා පණ්ඩිත මහාචාර්ය කොටපිටියේ රාහුල අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.**

**අග්‍රගණ්‍ය පාණ්ඩිත්‍යයකින් පිරිපුන් සුපේශල ශික්ෂාකාමී යතිවරයාණන් වහන්සේ නමක් වශයෙන් වැඩසිටින ඔබ වහන්සේ ශාසන දායාදය ලබා ගත් ආකාරය සිහිපත් කරමින් ම සාකච්ඡාවට ප්‍රවේශ වෙමු නායක හාමුදුරුවනේ,**

කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල මැතිවරණ කොට්ඨාශයට අයත්වන කොටපිටිය ග්‍රාමයේ ජීවත් වූ චාර්ලිස් වීරසේකර පියතුමන් සහ ඇල්පිනෝනා වීරසේකර යන සදාදරණීය මව්පිය දෙපළගේ පුත්‍ර රත්නයක් වශයෙන් 1961 ජූලි 10 වෙනි දින ජන්ම දායාදය ලැබුවා. මා ඇතුළු සහෝදර සහෝදරියන් පස් දෙනෙක් සිටි බවත් සිහිපත් කළ යුතුයි. එවකට නාකන්දලගොඩ මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබුවා. සැදැහැවත් මව්පිය දෙපළගේ ආශිර්වාදය ඇතිව කොටපිටිය සුධර්මාරාමාධිපති ව වඩ සිටි බදුරලියේ රතනසාර නා හිමිපාණන් වහන්සේගේ හා රාජකීය පණ්ඩිත මගුරේ ඤාණිස්සර මා හිමියන්ගේ ආචාර්යත්වයෙන් මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙන්පති මොල්ලිගොඩ ශ්‍රී අරියවංශ මහානායක මාහිමිපාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් සංසාරගත පුණ්‍ය ශක්තියට අනුව 1975 වර්ෂයේ ජනවාරි 03 වෙනි දින උත්තරීතර ප්‍රව්‍රජ්‍යාභාවය ලබා ගැනීමට භාග්‍යවන්ත වුණා.

අනතුරුව මතුගම වලගෙදර ශ්‍රී නිවාස පිරිවෙන,මොල්ලිගොඩ ප්‍රවචනෝදය මහපිරිවෙන යන පරිවේණස්ථානයන් තුළින් සිංහල,පාලි,සංස්කෘත භාෂා ආදිය මෙන්ම මූලික බෞද්ධ අධ්‍යාපනය ලැබුවා . අග්‍රගණ්‍ය පඬිරුවනක් වුණ ලබුගම ලංකානන්ද මහා නාහිමි,මහාචාර්ය උඩුවේ ජනානන්ද මාහිමි, මහාචාර්ය වල්පොල රාහුල නා හිමි වැනි ශ්‍රේෂ්ඨ සංඝ නේතෘන් වහන්සේලාගේ පා සෙවණේ ගුරුහරුකම් ලබන්නට තරම් භාග්‍යවන්ත වූ බවත් මේ අවස්ථාවේදී කෘතවේදී ව සිහිපත් කළ යුතුයි. තිසි වයස් සම්පූර්ණ වූ විට 1981 වර්ෂයේ ජූනි 09 වෙනි දින කෝට්ටේ රාජමහා විහාරස්ථ සිරි මංගල උපෝෂථාගාරයේදී ලබුගම ලංකානන්ද මා හිමියන්ගේත්,මගුරේ ඤාණිස්සර මාහිමියන්ගේත් ආචාර්යත්වයෙන් උතුම් උපසම්පදා භූමියට පත්වුණා.

**ශාස්ත්‍රීය ශික්ෂණයෙන් ජාත්‍යන්තර වශයෙන් පවා සම්භාවනාවට පාත්‍ර වූ ඔබ වහන්සේ කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ අනුනායක ධූරය දක්වා ආ පියවර පිළිබඳ අතීතාවර්ජනයක යෙදෙනවා නම්,**

මූලික අධ්‍යාපනයෙන් අනතුරුව පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ගෞරව ශාස්ත්‍රවේදී උපාධිය හා ශාස්ත්‍රපති උපාධිය ලැබුවා. අනතුරුව එම විශ්ව විද්‍යාලයේදීත්,එංගලන්තයේ ලන්ඩන් විශ්ව විද්‍යාලයේ ආසියාතු හා අප්‍රිකාතු අධ්‍යයන පීඨයේදීත් ආචාර්ය උපාධිය ලබා ගැනීමට අවශ්‍ය පර්යේෂණ කටයුතුවල නිරත වුණා. අනතුරුව ආචාර්ය උපාධිය ලබා ගත්තා. ශ්‍රී ලංකා ප්‍රාචීණ භාෂෝපකාර සංගමය විසින් පිරිනමනු ලැබූ රාජකීය පණ්ඩිත ගෞරව උපාධියෙන් හා බුරුම රජය මගින් පිරිනැමූ අග්ගමහාපණ්ඩිත උපාධියෙන් ද පිදුම් ලැබුවා. 1986 වර්ෂයේ සිට පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්ය ධූරය ලැබ කටයුතු කළා.

1988 වර්ෂයේදී රුහුණු විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයකු වශයෙන් කටයුතු කළා. 1991 වර්ෂයේදී පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යනාංශයේ ස්ථිර කථිකාචාර්යවරයකු ලෙස පත්ව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ලෙසත් පාලි හා බෞද්ධ අධ්‍යනාංශයේ අංශාධිපති වශයෙනුත් කටයුතු කළා. 2010 වර්ෂයේ සිට එම අධ්‍යයනාංශයෙහි ම මහාචාර්ය ධූරයට පත්වුණා. ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය කළ ගිහි පැවිදි විශාල සිසු පිරිසක් දේශීයව හා විදේශීයව විශ්ව විද්‍යාල තුළත්, ශාස්ත්‍රීය ආයතන තුළත් සක්‍රීයව කටයුතු කරන ආකාරය පිළිබඳව ඉතාමත් සතුටුයි.

ඒ වගේම වැඩිම විදේශීය සිසුන් පිරිසක් ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය කරන කැලණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රථම පැවිදි අධ්‍යක්ෂවරයා වශයෙන් එයට අනුබද්ධ ආයතන බිහි කරමින් වඩාත් පුළුල් කාර්යභාරයක් සිදුකළා. සිංගප්පූරුවේ Buddhist Library ආයතනයට අනුබද්ධ ආයතනයක් සාර්ථක ව පවත්වාගෙන යනවා. මහාචාර්ය ක්වාලාලම්පූර් ධම්මජෝති හිමියන්ගේ මූලිකත්වයෙන් හොංකොංවල නව බෞද්ධ විශ්ව විද්‍යාලය අනුබද්ධ ආයතනයක් ලෙස පිහිටුවීමට කටයුතු කළා . කොරියාවේ ඩොංගුක් විශ්ව විද්‍යාලය සමග අනුබද්ධ ආයතනයක් හා චීනයේ අනුබද්ධ ආයතන 2ක් පිහිටුවීමට මූලික කටයුතු කළා.

ඒ වගේම ශාස්ත්‍රීය ලෝකයට ප්‍රදානය කළ කෘති වශයෙන් සද්දසාරත්ථජාලිනී සංස්කරණය,බෞද්ධ විනය අධ්‍යයනය,බුදුසමය හා පූජාචාරිත්‍ර,කම්මවාචා,පැවිදි උපසම්පදා වත,පාලි හා බෞද්ධ අධ්‍යයන ග්‍රන්ථ හා Symposium of Buddhist Studies,Pali and Buddhist Studies ආදී කෘති ද සංස්කරණය කළා.ජාත්‍යන්තර පර්යේෂණ සැසිවාරවල දී ශාස්ත්‍රීය දේශන සඳහා විශාල වශයෙන් සහභාගි වුණා.

දේශීය වශයෙන් ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂොපකාර සමාගමෙහි සංවත්සර මහා සභාවෙහි 2015 වර්ෂයේ මුඛ්‍ය දේශනය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යනාංශයෙහි 10 වන වාර්ෂික බෞද්ධ අධ්‍යයන සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය,හා මහනුවර පල්ලෙකැලේ ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන පීඨයෙහි දී 2015 වසරේ පවත්වන ලද ප්‍රධාන දේශන විශේෂයි.

ඒ වගේම ශාස්ත්‍රීය කටයුතුවලට අමතරව 1998 වර්ෂයේදී කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්මමහා සංඝ සභාවේ කර්මවාගාචාර්ය ,2006 වර්ෂයේදී උපසම්පදා ලේඛකාධිකාරී ,2011 වර්ෂයේදී නියෝජ්‍ය ලේඛකාධිකාරී ,2013 වර්ෂයේදී එම සංඝ සභාවෙහි ම ප්‍රධාන ලේඛකාධිකාරී හා 2014 වර්ෂයේ සිට කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ අනුනායක ස්වාමීන් වහන්සේ වශයෙන් පැවරී තිබෙන ශාසනික, නෛතික, සාමාජික හා ජාතික කාර්යභාරයන් ශාසන මාමක ව ඉටුකරගෙන යනවා. සංඝ සභාවේ එකසිය පනස් වන වර්ෂය වෙනුවෙන් බෞද්ධ විනය අධ්‍යයන නමින් සංස්කරණය කළ කෘතිය විද්වත් ලෝකයේ වගේම බෞද්ධ ලෝකයේත් ප්‍රසිද්ධියට පත්වුණා.

වාද්දුව තල්පිටිය බෝධි රාජමහා විහාරස්ථානය සියලු විහාරාරාංගයන්ගෙන් හා ප්‍රාකාර තොරණාදියෙන් අලංකාරවත් ව සැදැහැවතුන්ගේ චිත්තප්‍රමෝදය ඇතිවන ආකාරයට නිර්මාණය කළා.




**අපේ හාමුදුරුවනේ,නූතන ශාසනික ප්‍රවණතාවයන් පිළිබඳව අතිශය සංවේදී ලෙස බලන ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් යම් සමාලෝචනයක යෙදෙනවා නම් වටිනවා.**

අපි දැන් ජීවත්වෙන්නේ 21 වෙනි ශත වර්ෂය තුළයි. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාලා අවුරුදු 2564ක් ගෙවිල අවසන්. එම කාලය තුළ බුදුරජාණන් වහන්සේගේ ධර්මය අකාලික ධර්මයක් ලෙස, සදාකල්හි ගැළපෙන දර්ශනයක් ලෙස මේ ලෝකයේ ආගම් අතර ඉහළින්ම වැජඹෙනවා. ඒ ගැන කිසිම විවාදයක් නැහැ. හැබැයි අප මීට අවුරුදු දෙදහස් පන්සියයකට පෙර සිටි සමාජයත්, වර්තමාන සමාජයත් ගත් විට ලොකු පරතරයක් තිබෙනවා. ඇතැම් කරුණු ඒ සමාජයට ගැළපුණ ද, වර්තමාන සමාජයට ගළපා ගැනීමට අපි උනන්දු විය යුතුයි.

උදාහරණයක් වශයෙන් භික්ෂූන් වහන්සේලා එකල ජීවත්වූ පරිසරයට වඩා විද්‍යාවෙන්, තාක්ෂණයෙන් සහ බොහෝ කරුණුවලින් වෙනස් වූ ඇතැම් විට භෞතික විද්‍යාවෙන්දියුණුවට පත්වූ ලෝකයකයි අපි ජීවත් වෙන්නේ. මේ ජීවත්වන ලෝකයට බුදු දහමේ තිබෙන දර්ශනය එකඟයි. හැබැයි අපේ සංස්කෘතිය පැත්ත සහ එහි සමාජමය වාතාවරණයට එය අපි නිවැරැදිව ගළපා ගත යුතුයි.

ධර්ම විනය පිළිබඳ අපිට ගැටලු ඇත්නම්, වඩාත් සුදුසුම දේ සංගායනාවක් පැවැත්වීමයි. භික්ෂූන් වහන්සේලාගේ යම් දුර්වලතා ඇත්නම්,විනය පිටකයටත් අනුකූලව එම දුර්වලතා මඟහැර ගැනීමට අවශ්‍ය කරන නූතන කථිකාවතක් භික්ෂු සමාජයට අවශ්‍යයයි. උතුම් ත්‍රිපිටකය ශ්‍රී ලංකාවේ මෙතෙක් අපි රැකගෙන ආ ඉහළම ආධ්‍යාත්මික වස්තුවයි. එනිසා ත්‍රිපිටකය ආරක්ෂාකර ගැනීමත්,එය අනුගමනය කිරීමත්,තව බෝහෝ කල් නොවෙනස්ව පවත්වාගෙන යාම සඳහාත් අවශ්‍ය කරන ත්‍රිපිටක සංරක්ෂණ පනතක් වැනි යම්කිසි වැඩපිළිවෙළක් අපිට අවශ්‍ය ම බව මා විශ්වාස කරනවා.

හේමමාලා රන්දුනු

# මහා පින්කමක අසිරිය



**ඒ නුවර වැසියෝ මුළු නගරය ම ඒකාලෝක කරමින් විචිත්‍ර වර්ණ යොදමින් සැරසීම් සිදු කළහ. ප්‍රීති ඝෝෂා කරමින් මංමාවත් දිගේ ඇවිද ගියහ. සමන්, කැකුළු, ඊතණ, අබ පොරිවලින් සමන්විත ලද පස්මල් ඉසිමින්, මාර්ගය විසිතුරු කළහ. ගෙයක් ගෙයක් පාසා පුන්කලස් තබා සතුටු වූ නගරවාසීහු වර්ණ වූ, විචිත්‍ර වූ විශාල ධජ එස වූහ. මේ රජගහනුවර නැකත් කෙළි කාලයයි.**

එන්න, අපි නටමු. ගයමු. මුළු රජගහ නුවර ම දෙව්ලොවක් වගේ, ගය ගයා ප්‍රීති වෙමු." කියමින් එනුවර කාන්තාවෝ අප්සරාවන් මෙන් සැරසී දරුවන් ද ඇකයේ රඳවාගෙන ප්‍රීති වූහ.

එකල එරට රජ කළ බිම්බිසාර රජු සිරිත් විරිත් රකිමින්, චාරිත්‍රවලට අනුව රාජාභරණයෙන් සැරසී රාජ තේජස පතුරවමින් රට වාසීන්ට දැකබලා ගැනීම පිණිස නැකත් කෙළි සෙල්ලම් පිණිස නගරය පුරා සැරිසරන්නට විය. නගරවාසීන් සමඟ සතුටු වන්නට විය.

ඒ නගරයේ විසූ එක් කුල දුවක් රජතුමාගේ ඉසුරුමත් බවත්, මනෝභාවනීය ආකාරයත්, සෞභාග්‍යයත් දැක පුදුමයට පත් වූවා ය. දෙව්ලොව සම්පත් වැනි මෙවැනි සම්පත් ලබන්නට මේ රජු කෙතරම් පින් කරන්නට ඇති ද? නො අඩුව මෙවැනි සැපයක් ලබන්නට මෙතුමා කවර නම් පිනක් කරන්නට ඇතිදැයි ඇයගේ සිතට අදහසක් ඇතිවිය. පඬිවරුන් යැයි සම්මත පුද්ගලයෙක් වෙත ගොස් ඇය මේ බව අයා සිටියා ය.

"පින්වත් පඬිතුමනි, මහ රජතුමා උසස් ආකාරයට සැප සම්පත් භුක්ති විඳියි.එතුමාට කිසි දෙයකින් අඩුපාඩුවක් නො මැති බවයි පෙනෙන්නේ. පඬිතුමනි, පෙර ආත්මයේ මෙතුමා මොනවගේ පිනක් ද කරගෙන තිබෙන්නේ?"

"පින්වත් දියණිය, පින්කම් සිතූ පැතූ සම්පත් දෙන මැණිකක් හා සමානයි. කල්ප වෘක්ෂයකට සම කළ හැකියි. ධන සම්පත්තිය ද, ශ්‍රද්ධා සම්පත්තිය ද ඇති කල්හි යම් ප්‍රාර්ථනාවක් සිදුකර යමක් කරයිද? එය ඒ අයුරින්ම ඉටු වෙනු ඇත. දියණිය, ආහර පූජාවෙන් ශක්ති සම්පත්තිය ද, ආසන පූජාවෙන් උසස් කුලවත් බව ද, වස්ත්‍ර පූජාවෙන් වර්ණ සම්පත්තියද, වාහන පූජාවෙන් සුවපහසුව ද, පහන් පූජාවෙන් ඇස් පෙනීමේ ශක්තිය ද, ආවාස පූජාවෙන් සියලු සැප සම්පත් ද ලැබේ. එනිසා ඔබත් බොහෝ පින් දහම්වල යෙදෙන්න' යැයි ඒ පඬිතුමා ප්‍රකාශ කළේ ය.

"කොතරම් සැප සම්පත් තිබුණත් මිනිස් ලොවේ දී කායික පීඩා, මානසික පීඩා කොතරම් ද? අඹු දරුවන් පෝෂණය කරන්න, ගේ දොර හදන්න, මිල මුදල් සොයන්න, කෙතරම් වෙහෙස විය යුතු ද? නමුත් දිව්‍ය ලෝකයේ මේ කිසිදු බාධාවක් නැත. මේ සියලු සැප සම්පත්වලට වඩා දිව්‍ය සම්පත් නොවේද වටින්නේ? බාධා අඩු දිව්‍ය සම්පත් නොවේ ද වටින්නේ? බාධා අඩු දිව්‍ය ලෝකයේ මම සිත පිහිටුවා ගනිමි" සිතූ ඒ දියණිය මසුරුකම් දුරුකොට ඉතාමත් ශ්‍රද්ධාවෙන් ගෞරවයෙන් දන මාන කටයුතු ද, තමන් හැකි අයුරින් සියලු ම පින් දහම් සිදු කළේ ය.

ඇයගේ මේ අදහස් දැනගත් මව්පියෝ ඇය වෙත අලුත් වස්ත්‍ර යුගලක් ද, අලුත් ආසනයක් ද, නෙළුම් මල් මිටියක් ද, ගිතෙල් පහන්, කිරි, මී පැණි, උක්හකුරු ආදී දානය පිණිස ලබා දුන්නා ය.

එයින් ඇය අපමණ ප්‍රීතියට පත්වුණි. දානය සඳහා සියලුම දේ ලැබුණි. එනිසා ඉතා ප්‍රණීතව සකසා දානයක් දෙමි' සිතා ජලය මුසු නොකොට කිරිබතක් සකසා එයට මී පැණි ද එක් කොට තවත් දේ පිළියෙළ කළා ය. සුවඳ ගල්වන ලද පිපුණු මලින් සරසා ආසනය පිළියෙළ කර එයට සුදු රෙද්දක් අතුරා ඒ ආසන්න සතර කොණ පිපුණු මල් පොකුරු සතරක් තබා ආසනය උඩින් වියනක් බැඳ එය ඉතා අලංකාරව සුවඳවත්ව සැරසී ය.

පසුව ඇය' භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක පුත්‍රයකු වැඩි කල්හි මෙය පූජා කරන්නෙමි" සිතා ඉක්මණින් දානය පිළියෙල කළා ය. පසුව තම යෙහෙළිය අමතා, "මිතුරිය, මේ මාවතේ අද යම් භික්ෂුවක් පිඩු පිණිස වඩී ද උන්වහන්සේ මාගේ නිවසට කැඳවාගෙන එන්නැයි" පිටත් කළා ය. එදින සැරියුත් තෙරණුවෝ පිණ්ඩපාතය සඳහා රජගහ නුවර මහ මඟට වැඩියහ. යෙහෙළිය සැරියුත් තෙරුන් දැක සතුටු සිත උපදවාගෙන,

"ස්වාමිනි, පාත්‍රය මා හට දෙනු මැනවි. මාගේ යෙහෙළිය අද පිණ්ඩපාතය පූජා කිරීමට බලා සිටිනවා ද? ඇයට අනුකම්පා පිණිස ඒ නිවසට දානය පිණිස වඩින සේක්වා" යි ඉල්ලා සිටියා ය.

සැරියුත් මහ රහතන් වහන්සේ අනුකම්පා උපදවා පාත්‍රය ඇයට දී දානය සඳහා නිවසට වැඩම කළහ. නිවසට ගිය පසු ස්වාමිනී, සරසා සකස් කරන ලද මේ ආසනයේ අසුන් ගනු මැනව' යි ගෞරවයෙන් ඉල්ලා සිටියා ය. තෙරුන් වහන්සේ ඒ ආසනය පිළිගත් පසු ඉතාමත් ගෞරවයෙන්, කර්මඵල විශ්වාසයෙන් යුතුව භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය කෙරෙහි පැහැදුණු සිතින් ඇය දානය පූජා කළා ය.

ගිතෙල්, මී පැණි, උක් හකුරු, සහිත බතක් පිස පූජා කළ ඇය දානය අවසානයේ දී 'ස්වාමීනි මා අද රැස්කළ පිනක් වේ ද, ඒ සියලු පින් බලයෙන් මා හට දිව්‍ය සම්පත් ලැබේවා. සියලු ඉරියව් වලින් මානෙල්, නෙළුම් මල් සුවඳ විහිදේවා යි ප්‍රාර්ථනා කළා ය.

ඉන්පසු තෙරුන් වහන්සේ වැළඳූ පසු පාත්‍රය සෝදා පිරිසුදු කොට නැවත ගිතෙල්, මී පැණි, උක් හකුරුවලින් පාත්‍රය පුරවා ඒ පාත්‍රයත් තෙරණුවෝ වැඩ සිටි ආසනයත් සේවකයකු ලවා විහාරයට ගෙන ගොස් තැබුවා ය.

තමා විසින් මනාකොට සකසා ගෞරවයෙන් යුතුව සංඝරත්නය උදෙසා පූජා කළ දානය පිළිබඳව සිතමින් ඇය සතුටු විය. තුනුරුවන් කෙරෙහි ශ්‍රද්ධාව උපදවා ගත්තා ය. මනා කොට ඉන්ද්‍රිය සංවරය ඇතිකර ගෙන සමාදන්වන සිල්පද නිසි ලෙස රැක ගත්තා ය. සිත තුළ ඇතිවන පාපී අකුසල් අතහැර යහපත් දේ පමණක් සිතීය. දිවිහිමියෙන් පින් දහම් සිදු කොට බොහෝ කලක් මිනිස් ලෝකයේ ආයුෂ ගෙවා මහලු බවට පත්ව මරණයට පත් වූවා ය. හැකුලූ අතක් දිග හරින තරම් වේගයෙන් ඇය තව්තිසා දෙව්ලොව යොදුන් සියයක් විශාල රන් විමනක දෙවඟනක් සේ පහළ වූවා ය.

දිනක් මුගලන් තෙරුන් වහන්සේ දිව්‍ය ලෝකයේ චාරිකාවක වඩින විට අලුතෙන් පහළ වූ දෙවඟනක් උන්වහන්සේට දැක ගන්නට ලැබුණි.

"පින්වත් දෙව්දුව, ඔබ පැළඳගෙන සිටින ඔය දිව්‍ය සළුපිළි, දිව්‍ය මල්මාලා හරිම ලස්සනයි. ඔබ ඔය අසුන්ගෙන සිටින ආසනය ඉතාමත් මනහරයි. වෛරෝඩි මාණික්‍යයකින් කළ එකක් වගේ. ඔබ කැමැති කැමති දිශාවට මේ ආසනය සිතේ වේගයෙන් ගමන් කරනවා. එවිට ඔබ ඉතා වර්ණවත් ව බබළනවා. වලාකුළු අතරින් දිලිසෙන විදුලිය වගේ.

දෙව්දුව ඔබට මෙතරම් ලස්සනක් ලැබුණේ කොහොමද? මොනවගේ පිනක් නිසාද ඔබට මෙතරම් සැප ලැබුණේ. සිතට ප්‍රිය උපදවන මේ සැප සම්පත් ලැබුණේ කිනම් පිනක ආනුභාවයෙන් ද?

මහානුභාව සම්පන්න පින්වත් දෙව්දුව, මිනිස් ලොව සිටින කාලයේ දී ඔබ කළ පින අප දැන ගැනීමට කැමැති වෙමු. මෙසේ ආනුභාව සම්පන්නවීමට ඔබ කළ පින මහා විශාල එකක් විය යුතු යි. ඔබේ සිරුරෙන් විහිදෙන එළියෙන් හැම දිශාවම බබළනවා."

එය ඇසූ දෙව්දුව සතුටු විය. මෙසේ පවසන්නී ය.

"පින්වත් මුගලන් මහරහතන් වහන්ස, මම ඒ කාලයේ මිනිස් ලොව සිටියේ, එද ආගන්තුක ස්වාමීන් වහන්සේ නමක් මගේ නිවසට වැඩි සේක. මම උන්වහන්සේට වැඩ සිටීමට ආසනයක් පිළියෙළ කොට නමස්කාර කළෙමි. මට පුළුවන් ආකාරයට දානය පූජා කර ගෙන ඒ පින ගැන සිතමින් මම සිත සතුටින්මයි හිටියේ. මම පින් පව් විශ්වාස කරගෙන ඉතා හොඳින් පින් රැස්කර ගත්තා.

ස්වාමිනි, මම කළ ඒ පිනෙන් තමා මෙවැනි ලස්සනක් මට ලැබුණේ. ඒ පින හේතුවෙන් තමා මේ සම්පත් ලැබුණේ. සිතට ප්‍රීතිය උපදවන මේ සැප සම්පත් සියල්ල ම ලැබුණේ ඒ පිනකම නිසාමයි.

නයනා නිල්මිණී

# බුදුරජාණන් වහන්සේ දෙසා වදාළ දාන කථා

**දාන කථා නම් දන් දීමේ අනුසස් දැක්වීම ය. බුද්ධ දේශනාවේ දානකතා අංක එක ය. අවසාන හයවෙනි උත්කෘෂ්ඨ කතාව වනුයේ සියලු දුක් නිවාලන නිවන පිළිබඳ විස්තර ඇතුළත් සාමුක්කංසික කතා ය. මෙහිද දෙක සීලානිසංස කථා ය. තුන සුගති නම් වූ දිව්‍ය බ්‍රහ්ම මනුස්ස ලෝක පිළිබඳ කියැවෙන සග්ග කථාය. සිව්වැන්න වූයේ සියල්ල අත්හැරීම නම් වූ පැවිද්ද පිළිබඳ කියැවෙන නික්මීම නම් වූ නෙක්ඛම්ම කථා ය. පස්වැන්න වනුයේ ආනිසංස කථාය.**

එනම්, සැම හොඳ, නරක යහපත්, අයහපත්, පින් පව්, කුසල් අකුසල් ක්‍රියාවලටම විපාක ඇති බව විස්තර කථා ය. කෙසේ වෙතත් මේ සියලු කථා ධර්ම දේශනාවලින් අසන ඔබත් මමත් ඒ සැම අවස්ථාවකදීම සිතට ගත යුත්තේ කිසිදු දුකක් නැති නිවනට ළංවීම මිස සසර සැරි සැරීම නොවේ.

අපගේ මාතෘකාව වනුයේ දාන කථා ය. මේ දාන කථා වල ද ආමිස දාන, අභය දාන, ධර්ම දානාදී වශයෙන් බොහෝ බෙද දැක්වීම් ඇතත් ආමිස දාන අනුසස් ඉදිරිපත් කිරීම මෙහි පරමාර්ථය වේ.

'ආමිස' යනු පරිභෝග හෙවත් (එදිනෙදා ප්‍රයෝජනයට අදාළ) සිව්පසය නම් චීවර පිණ්ඩපාත, සේනාසන, බෙහෙත් පිරිකර වැනි වස්තු පූජාවන්ට නමකි. මේවායින් ද අප විස්තර කරනුයේ 'ආමිස දාන' හෙවත් 'ආහාර දීම'ට අදාළ විස්තරයකි. මේ ආහාර පූජාව යමෙක් කර්මඵල විශ්වාස කොට දෙන්නේ නම් ඒ දායකයා විසින් දෙකරුණක් සිහි තබාගත යුතු ය.

දීම අවබෝධයෙන් දෙන දීමක් වන්නේ නම් ඔබ ප්‍රාර්ථනා කළත්, නැතත් සුන්දර පුණ්‍ය විපාකයක් ලැබෙන්නේ ම ය. දෙවන කරුණ නම්, බුදු දහමෙහි කිසිදු දුකක් නැති නිවන සාක්ෂාත් කරනුයේ අවිද්‍යාව ප්‍රහීණ කොට තණ්හාව කිසිදු ඉතිරියක් නැතිව ක්ෂය කිරීම නිසාවෙන් තමා මෙම ආහාර පිරිකර සහිත දානය දෙන්නේ ඉක්මන් භවයකදීම සසර දුකින් මිදීමට යන අදහස සිතට ගැනීම නිවැරදිම චේතනාවයි.

'ආමිස' යන්නට පාලි සිංහල ශබ්ද කෝෂවල දී ඇති තේරුම් අතර 'ඇම' අල්ලස යන තේරුම් ද සඳහන් ව ඇත. 'ඇම' යනු ලොකු මාළුවෙක් ඇල්ලීමට යොදා ගන්නා කුඩාම කුඩා ගොදුරට යොදා ඇති නම හෝ ඒ හා සමාන එකකි. 'අල්ලස' ද එසේ ය. ලොකු ලාභයක් ලබා ගැනීමට තේ එකක්, බුලත් විටක්, ආහාර වේලක්, කිසියම් මුදලක් වැය කිරීම ය. අපි දන්දීමේ දී ද චාගය (අත්හැරීම) වැනි ගුණධර්මයක් සිතට නොගෙන ඇමක් අල්ලසක් සේ සලකා සසර සැප පතා දන් දුනහොත් සසර ගමන දික්වන්නේම ය.

බෞද්ධ අපේ පරමාර්ථය එය නොවේ. මහ රහත් සාරිපුත්ත සඟ පරපුරේ අවිච්ඡින්න පුරුක වූ ඔබේත් මගේත් ගම්වල වෙහෙර විහාරස්ථානවල දානට ද වැඩ සිටින වර්තමාන මහා සංඝරත්නය මේ ආහාර දාන දීමේ දී සැලකිය යුත්තේ, දන් දීමට සුදුසුකම් ලත් මාර්ගඵල ලාභී උත්තමයන් ලෙසින්ම ය. මේ බව අංගුත්තර නිකාය 1 තික නිපාතය, බ්‍රාහ්මණ වග්ගය, පිටුව 289 වච්ඡගොත්ත සූත්‍රයේ හා මජ්ඣිම නිකාය උපරිපණ්ණාසකයේ එන දක්ඛිණාවිභංග සූත්‍රයේත් කරුණු දක්වා තිබේ.

වරක් වච්ඡගොත්ත පරිබ්‍රාජකයා බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ වැඳ එකත්පස්ව හුන්නේ, "ස්වාමීනි, මම භවත් ගෞතමයන් වහන්සේ පිළිබඳ මෙවැනි කතාවක් අසා ඇත. මටම දන්දිය යුතු ය. මගේ ම ශ්‍රාවකයන්ට දන් දිය යුතු ය. අන් හට දන් නොදිය යුතු ය. අනුන්ගේ ශ්‍රාවකයන්ට ද දන් නොදිය යුතු ය. මට හා මගේ සව්වන්ට දුන් දෙය මහත් ඵලය, අන්සව්වන්ට දුන් දෙය එසේ නොවේ" යි වශයෙනි.

ස්වාමීනි, යමෙක් එසේ කියත් නම්, එය ඔබ වහන්සේ නො කියූ දෙයක් කියූ දෙයක් ලෙසින් කියන්නේ ද, කියූ දෙයක් කියන්නේ ම වේද, එසේත් නැතිනම් හේතු සහිත වූ කිසියම් දීමක් ගැරහීමට ලක් කරනු පිණිස ගළපා කියන්නක් ද," යි පරිබ්‍රාජික තෙමේ ඇසී ය.

එමෙන් ම "ස්වාමීනි, අපි නම් ගෞතමයන් වහන්සේට දෙස් පැවරීමට කිසිසේත් නොකැමති වෙමු."

"වච්ඡ, යමෙක් එසේ කියත් ද, එය මම කියන ලද්දක් කියන්නාහු නොවෙති. මා නො කියූ දෙයක් කියා අසත්‍යයෙන් මට චෝදනා කරත්, වච්ඡ, දන් දෙන කෙනෙක් යමෙකු විසින් වළක්වන්නේ නම්, ඔහු තිදෙනෙකුට අනතුරක් කෙරෙයි. දායකයාගේ පිනට, ප්‍රතිග්‍රහකයාගේ (දන් ලබන්නාගේ) ලාභයට හා එසේ කරන්නාගේ යම් වෙනත් ගුණයක් තිබුයේ නම් එය ද හාරා දැමූවක් සේ වෙයි.

වච්ඡය, මෙසේ නොව යමෙක් උයා පිසා නිමකළ හැළියක් වළඳක් සෝදා ඉඳුල් වතුර ටික කුණු දමන වලකට හෝ කුණු ජලය ගලායන කාණුවකට දමා මෙහි යම්, ප්‍රාණියෙක් හෝ වේ නම් ඔවුන් මෙයින් යැපෙත්වා යි සිතත් නම් එය ද පින් ලැබේ යයි, මම කියමි.

මෙසේ නම් මනුෂ්‍යයකුට දීම ගැන මම කුමක් කියන්නේ වේද?

එනමුත් වච්ඡය, සිල්වතුන්ට දුන් දෙය මහත් ආනිසංස ඇතැයි කියන මම දුශ්ශීලයන්ට දුන් දේ එසේ නො වෙමි යයි කියමි.

සිල්වතා නම් කවරේද? කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීන මිද්ධ, උද්ධච්චකුක්කුච්ච හා විචිකිච්ඡා යන පඤ්චනීවරණ ප්‍රහීණ කොට මේ තුළින් යමෙක් අසේඛ විමුත්ති ඤාණ දර්ශන නම් වූ අරහත් ඵලය දක්වා පැමිණියේ වේද හෙතෙමේ මැනවින් ම සිල්වතා වේ.

වරක් බුදුරජාණන් වහන්සේ තම උපන් ගම වූ කිඹුල්වත් නුවර නෑයන් ඉදිකළ නිග්‍රෝධාරාමයෙහි වැඩ සිටිද්දී තම කිරි මවු මහා ප්‍රජාපතී ගෝතමී අලුත් වස්ත්‍ර යුගලක් රැගෙන භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ වැඳ එකත්පස්ව හිඳ

"ස්වාමීනි, මා සතු මේ වස්ත්‍ර දෙක භාග්‍යවතුන් වහන්සේ උදෙසා ම මා විසින් නූල් පවා පිළියෙළ කොට වියන ලද්දකි. ස්වාමීනි, මට අනුකම්පා පිණිස එය පිළිගන්නා සේක්වා" යි ඉල්ලා සිටියා ය.

එවිට බුදුරජාණන් වහන්සේ එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් "ගෞතමිය එය සංඝයාට පූජා කරන්න. එසේ සංඝයා විෂයෙහි දුන් කල මට ද පුදන ලද්දෙම් වෙමි. සංඝයාට ද පුද ලද්දේ වේ" යයි වදාළ සේක.

දෙවනුව ද, තෙවනුව ද "මට අනුකම්පා පිණිස භාග්‍යවතුන් වහන්සේ ම එය පිළිගන්නා සේක්වා" යි ඉල්ලා සිටියා ය.

ඒ සැම වරක ම පළමු සේ විය. එවිට ආසන්නයේ සිටි ආනන්ද තෙරුන් වහන්සේ 'ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ගෞතමියගේ අලුත් වස්ත්‍ර දෙක පිළිගන්නා සේක්වා. මේ මහා ප්‍රජාපති දේවි භාග්‍යවතුන් වහන්සේට බොහෝ උපකාර ඇත්තීය. කිරි පෙවූ මව වූවා ය. අත් පා මනා කොට වැඩුවා ය. පෝෂණය කළා ය. වැදූ මව කලුරිය කළ කල්හි කිරි පෙව් මව වූවා ය. ස්වාමීනි, තිසරණ සරණ ගිය මෝ තොමෝ ආර්යකාන්ත ශීලයෙහි හැසිරුනේ, අචල ශ්‍රද්ධා ඇත්තේ, චතුස්සත්‍යය අවබෝධ කළේ, සැක නැත්තියකි.

"ආනන්දය එය එසේම ය. එය එසේම ය. (සැක නැත්තේ ය) ආනන්දය, එනමුත් යමෙක් තම ගුරුවරයා නිසා කුමන තත්ත්වයකට පත් වූවත් වැඳීමෙන්, පෙරගමන් කොට පිළිගැනීමෙන් දෑැඟිලි එකතු කොට දෙහොත් මුදුන් තබා වැඳීමෙන්, වෙනත් කුමන ආකාරයේ ගෞරව කිරීමෙන් හෝ චීවර, පිණ්ඩපාත, සෙනසුන්, ගිලන් පස – බෙහෙත් පිරිකර යන මේවා දීමෙන් (ප්‍රත්‍යුපකාර) කළ නො හැක්කේ ම ය. ආනන්ද ඒවා සියල්ල පෞද්ගලික කළගුණ සැලකීම වේ."

(මේ අනුව ගෝතමී මාතාවගේ එම වස්ත්‍ර දානය ද පෞද්ගලික දානයක්ම ය.) "ආනන්ද මෙවැනි පෞද්ගලික දාන 14 මම මෙහි දී දක්වමි."

1. අර්හත් තථාගත සම්‍යක් සම්බුද්ධයන් විෂයෙහි දන් දෙයි ද මෙය පෞද්ගලික දානයකි.
2. පසේ බුදුරජාණන් වහන්සේට දන්දීම.
3. තථාගත ශ්‍රාවක රහතන් වහන්සේට දන් දීම.
4. රහත් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා පිළිවෙත් පුරන (අරහත් මගෙහි සිටින) ශ්‍රාවකයාට දන් දීම.
5. අනාගාමී ඵලස්ථයා හට දන් දීම.
6. අනාගාමී ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා පිළිවෙත් පුරණ (අනාගාමී මඟට පිළිපන්) ශ්‍රාවකයාට දන්දීම.
7. සකෘදගාමී ඵලස්ථයා හට දන් දීම.
8. සකෘදාගාමී ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා පිළිවෙත් පුරන (සකදාගාමී මගෙහි සිටින) ශ්‍රාවකයාට දන්දීම.
9. සෝවාන් ඵලස්ථයා හට දන් දීම.
10. සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා පිළිවෙත් පුරන (සෝවාන් මගෙහි සිටන) ශ්‍රාවකයාට දන්දීම.
11. කාමයෙහි නො ඇලෙන (වීතරාග) බාහිරක තාපසයකු හට දන් දීම (මොවුහු පඤ්ච අභිඥා සඳහා වෙහෙසෙන කර්මවාදීහු ය.)
12. පෘථග්ජන සිල්වතෙකුට දන්දීම (මොවුහු අනුන් නො රවටයි. නො පෙයි. කපටි නැත. මායා නැත. ගොවිතැනින් වෙළඳාමින් ධාර්මිකව ජීවත් වෙයි.)
13. පෘථග්ජන දුශ්ශීලයාට දන්දීම (මසුන්, ඌරන්, ගවයන් වැනි සතුන් මරමින් අනුන් පීඩාකොට ජීවත් වන්නා දුශ්ශීලයා ලෙස ගැනේ.)
14. තිරිසන් ගත සත්ත්වයන්ට දන් දීම යනුවෙන් ය.

> **වච්ඡය, මෙසේ නොව යමෙක් උයා පිසා නිමකළ හැළියක් වළඳක් සෝදා ඉඳුල් වතුර ටික කුණු දමන වලකට හෝ කුණු ජලය ගලායන කාණුවකට දමා මෙහි යම්, ප්‍රාණියෙක් හෝ වේ නම් ඔවුන් මෙයින් යැපෙත්වා යි සිතත් නම් එය ද පින් ලැබේ යයි, මම කියමි.**



(මේ සතුන් ගැන කීමේ දී බල්ලාගේ වැනි ගුණයක් අශ්ව, හස්ති, ගව ආදීන්ගේ උපකාරයක්, එළු, බැටළු, ගව ආදීන්ගේ පෝෂණ ප්‍රයෝජනයක් සලකා දීම මෙහි දී නො සැලකේ. තමා විසින් පෝෂණය කරන අඹු දරු ආදීන් හා තමාගේ ප්‍රයෝජනයක් සලකා නිවසේ ඇති දැඩි කරන සතුන්ට දෙන දීම දානයක් නොව යුතුකම් ඉටුකිරීමකි. සිඟාලෝවාද සූත්‍රයේ දක්වන පරිදි යුතුකමට ද පින් තිබේ. තමා සමීපයට එන ඕනෑම තිරිසනෙකුට දීමේ අනුසස් දාන අනුකම්පාවෙන් දීම මෙහි දී සැලකේ. ගෙදර සිටින බල්ලාට කෑම දීම යුතුකමකි. දඩාවතේ යන බල්ලෙකුට කෑම දීම පින්කමක් බව මෙයින් කියැවේ.)

මේ තුදුස් දානයෝම පෞද්ගලික දාන ලෙසින් මෙම දක්ඛිණා විභංග සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ වදාරා ඇත.

(මේ සියල්ල පෞද්ගලික දාන වනුයේ මක් නිසා ද? ප්‍රතිග්‍රාහකයා (දාන වස්තුව ලබන්නා) ඒ ඒ ගුණයන්ගෙන් යුක්ත අය බව තමා හැඳිනගෙන දීමේ හේතුවෙන් ය.)

"ආනන්දය, ඒ දානයන් අතුරෙන් තිරිසන් සතෙකුට යමෙක් දන් දෙයි ද අනුසස් සියයක් ඇති දානයක් බව මම කියමි.

පෘථග්ජන දුශ්ශීලයෙකුට දන් දීමෙන් අනුසස් දහසක් කැමැති විය යුතු ය.

පෘථග්ජන සිල්වතෙකුට දීම සියක් දහසක් (ලක්ෂයක්) අනුසස් ඇත.

කාමයෙහි නො ඇලෙන ගෞතම ශ්‍රාවකයකු නොවන බාහිරක තාපසයකුට දන් දීම කෝටි ලක්ෂයක් (කොටි සතසහස්ස) අනුසස් ඇත.

සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා පිළිවෙත් පුරන්නකුට දන් දීම සංඛ්‍යාවකින් දැක්විය නො හැකි (අසංඛේය අප්‍රමෙය) අනුසස් ලැබෙන දානයකි. මෙසේ වූ කල්හි යමෙක් මා තථාගත වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ බව දැන දෙන දානයේ අනුසස් පිළිබඳ කවර කතා ද?"

මෙසේ වදාළ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ආනන්දය, (මා ගෝතමී මාතාවට වදාළේ මට දෙනවා වෙනුවට ඒ වස්ත්‍ර යුගලය සංඝයාට දීමෙන් මට ද දුන්නා මෙන් සැලකෙන හෙයින් පුද්ගලිකව මට දෙනවාටත් වඩා පින් ලැබෙන හෙයින් ය. "ආනන්දය මෙවැනි මහත් ආනිසංස ඇති සංඝගත දක්ෂිණාවෝ (සාංඝික දාන) සතක් ද මෙසේ වදාරමි.

ඒ කවරේද?

බුද්ධ ප්‍රමුඛ උභතො (භික්ෂු / භික්ෂුණී) සංඝයාට දන්දීම.

තථාගතයන් වහන්සේ පිරිනිවී කළ උභතො සංඝයා කෙරෙහි දන්දීම. (අද මේ සඳහා සර්වඥ ධාතු තැන්පත් කරඬුවක් ගෙදරට ගෞරවයෙන් වඩම්මවා ගෙනවිත් දානයේ අග්‍ර කොටස (බුද්ධ පූජාව වශයෙන් තබා අනතුරුව ඉතිරි කොටස සඟ සතු කොට වළඳවාලීම කරවති.)

භික්ෂු සංඝයාට දන් පිළිගැන්වීම.

භික්ෂුණී සංඝයාට දන් දීම, මට මෙපමණ භික්ෂු සංඝයා ද, භික්ෂුණී සංඝයා ද දෙනු මැනවැ යි ප්‍රමාණය දක්වා ආරාධනා කොට ඒ දෙපිරිසට දෙන දානය පස්වෙනි සංඝගත දක්ෂිණාවයි.

මට මෙපමණ භික්ෂු සංඝයා දෙනු මැනැයි සංඛ්‍යාව දක්වා ආරාධනා කොට දන්දීම.

මට මෙපමණ භික්ෂුණී සංඝයා දෙනු මැනැවයි සංඛ්‍යාව දක්වා ආරාධනා කොට දන්දීම. යන මේ සතයි.

සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලයේ ලේකම්
(බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව)
**කේ.කේ. සුගතපාල**

# ප්‍රහේලිකා අංක 20

බුදුසරණ
ත්‍යාග අනුග්‍රහය බෞද්ධාලෝක පදනම

**බුදුසරණ ප්‍රහේලිකාව ඉදිරිපත් කිරීම මහාචාර්ය කිවුලේගෙදර නාරද හිමියන්ගේ අනුශාසකත්වයෙන් කේ. එල්. ඒ. රණසිංහ විසිනි.**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | | 2 | ■ | 3 |
| | ■ | ■ | | ■ | |
| | ■ | 4 | | 5 | |
| 6 | 7 | ■ | 8 | | ■ |
| 9 | | | ■ | 10 | 11 |
| ■ | | ■ | 12 | | |

**හරහට**

1. විදුර ජාතකයෙහි සඳහන්වන යක්ෂයාගේ නමයි
4. බුදුබව ලබා ගැනීමට බෝසතුන් මෙම ගුණාංග දහයක් පුරන ලදී
6. මෙම සම්ප්‍රදායික ජ්‍යොතිෂය තොරතුරු පත්‍රය ශුභ, අශුභ කාල සහ පොහොය දින යනාදිය දක්වයි.
8. මාර්ගය යන අර්ථය දෙන වචනයකි.
9. ආශිර්වාදාත්මක ප්‍රබන්ධයන් වන මෙම වචන සැකැසුම් තඹ තහඩුවල ලියා ශරීරයෙහි පැළඳීම ද කරති.
10. ගෘහ සේවිකාවන් සඳහා වන පැරැණි භාවිත නාමයකි.
12. පන්සලකට සම්බන්ධ එහි අවශ්‍යතා සපයන ගිහියන් නම් කරන අයුරුයි.


**පහළට**

1. අරහං යන බුදුගුණය අළලා ලියූ සුප්‍රසිද්ධ පැරණි සිංහල ග්‍රන්ථයකි.
2. ගල් ගුහා තුළට පර්වත බිත්තියෙන් ගලායන ජලය වළකාලීමට කර ඇති නිර්මාණයයි.
3. ඉතා නුවණැති කාන්තාවක් ලෙස මෙම දේවියගේ නම සිංහල සාහිත්‍යයෙහි කියැවෙයි.
5. මුවන්ට අභය භූමියක් වූ නිසා බරණැස ඉසිපතනයට මෙම නම යෙදිණි.
7. හින්දු ධර්මයට අයත් ග්‍රන්ථ කාණ්ඩයකි.
11. ශික්ෂා යන අරුත් දෙන වචනයකි.

**පිරුවානා පොත් වහන්සේ, සප්ත බොජ්ඣංගය, මහාචාර්ය වල්පොළ රාහුල හිමියන් විසින් රචිත බුදුන් වදාළ ධර්මය ඇතුළු ධර්ම ග්‍රන්ථ කට්ටලයක් පිරිනැමේ.**

**බුදුසරණ කර්තෘ, ලේක්හවුස්, ඩී. ආර්. විජයවර්ධන මාවත, කොළඹ ලිපිනයට ප්‍රහේලිකාව පුරවා තැපැල්පතක අලවා, එහි දුරකතන අංකයක් ද සඳහන් කර එවීමට අමතක නොකරන්න.**

# ස්වර්ණමාලී සෑරදුන් අභියසදී විළඳ මී පිඬු පූජා පින්කමක්



බුදුරජාණන් වහන්සේ උදෙසා පළමුැනි දනය පූජා කිරීමට සසරේ පෙරුම් දම් පුරා ගෙන ආ තපස්සු භල්ලුක නම් වෙළඳ දෙබෑයෝ, කරත්ත පන්සියයකින් වෙළඳාමේ යන අතරමඟදී බුදුහාමුදුරුවන්ට විළඳ සහ මී පිඬු පූජා කරන ලදී. මෙම උතුම් පින්කම පිළිබඳ සිහිපත් කරමින් 2010 වසරේ සිට වාර්ෂික ව රුවන්වැලි මහා සෑරදුන් අබියස විළඳ සහ මී පිඬු පූජා කිරීම කඳුළුගමුවේ සුමනතිස්ස හිමියන්ගේ අනුශාසනා පරිදි පැවැත්වේ. එදිනට කරත්තවලින් රැගෙන එන විළඳ සහ මී පැණි, කප්රුක් පූජා සහිත උතුම් පින්කමට විශාල සැදැහැවතුන් පිරිසක් සහභාගි වේ. පින්කමට සහභාගිවන දහස් ගණන් සැදැහැවතුන් උදෙසා උදෑසන ආහාර සඳහා දන්සැල් ආදිය පවත්වන මහා පින්කම් ද සිදු කෙරේ. මේ වන විට කරත්ත පෙරහර සඳහා යොදු ගැනීමට සැදැහැවතුන් විසින් කරත්ත සහ ගවයන්ද පූජා කර තිබේ.

මෙම පින්කමේ මී පැණි පූජා කිරීමෙන් අනතුරුව රෝගීන්ට ඖෂධ සෑදීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවට ලබාදීම 2020 වසරේ සිදු කෙරිණි. 2010 වසරේ සිට වාර්ෂිකව සිදු කරන මෙම උතුම් සම්බුද්ධ පූජාව 2021 ජූලි 14 වෙනිදට යෙදී ඇත. මෙවර 12 වෙනි වරට පින්කම පැවැත්වීමට නියමිත ව තිබේ. පවතින කොරෝනා වසංගත තත්ත්වය අනුව නිරෝධායන නීති රීති හා සෞඛ්‍යය උපදෙස් අනුව ජන සහභාගිත්වයෙන් තොරව චාරිත්‍රානුකූලව පූජාව පැවැත්වීමට සිදු වී ඇත. මෙම උතුම් පින්කමේ අනුහසින් පවතින කොරෝනා වසංගත තත්ත්වය දුරුවී සියලුම රෝගීන් සුවපත් වේවා යන අධිෂ්ඨානයෙන් රුවන්වැලි මහා සෑ මළුවේ දී එම පින්කම එදින සිදු කෙරේ.

# පිහිට පතයි



නිමල් වීරක්කොඩි නැමති අයට ඒ බී පොසිටිව් හෝ ඕ නෙගටිව් වර්ගයේ වකුගඩුවක් අවශ්‍ය වී ඇති බව කියයි. අවුරුදු 40 ට වැඩි අයෙකු වකුගඩුවක් පරිත්‍යාග කිරීමට කැමැති නම් දුරකතන අංක 0785357439 හෝ 0772003434 අංකයට දන්වන ලෙස ඉල්ලීමක් කරයි.

## ප්‍රඥ ඇසින්...

03 වැනි පිටුවෙන්...

ඒ මක්නිසාද? සත්වයන් තුළ පවත්නා ජීවිත මදය නිසා ඔවුහු කය, සිත, වචන යන තුන්දෙරින් ප්‍රාණඝාතාදී අකුසල කර්ම රැස් කරති. මරණ සතිය වැඩීමෙන් ජීවිත මදය දුරුවී යථාර්ථය අවබෝධ වෙයි. එමනිසා පස් පව් දස අකුසල් නැති පන්සිල් සුරකින සමාජයක් ඇති කිරීමට මරණසතිය මහෝපකාරී වෙයි.

මරණ සතිය වඩන භික්ෂූන් වහන්සේ හැමවිටම අප්‍රමාදීව විහරණය කරයි. අනිත්‍යාදී ත්‍රිලක්ෂණය අවබෝධ කර ගනී. ඉහාත්මයේ දීම නිවන සාක්ෂාත් කර ගනී. නැතහොත් සුගති පරායණ වෙයි.

(අන්ධභූතෝ අයං ලෝකෝ) මේ පුහුදුන් ලෝකයා අන්ධ යැයි වදළේ ලෞකික සත්වයාට ඇස් ඇතත් පඤැස නැති බැවින් අන්ධ ලෙස සැලකිය යුතු හෙයිනි. ලෝකය ශාස්වතය ආදී මිථ්‍යාදෘෂ්ටි ඇතිවන්නේ පඤැස නැති බැවිනි. පැඤැස ඇත්තේ ආර්යයන් වහන්සේලාට ය.

උපතින්ම අන්ධයා සමහර විටක නියම මඟිනුත්, සමහර විටක නොමඟිනුත් යයි. එසේම පැඤැස නැති පුහුදුන් තැනැත්තා සසර සැරිසරමින් සමහර විටක පින් ද සමහර විටෙක පව් ද කරයි. හොඳ නරක, පින් පව්, හරි වැරදි, ඇත්ත නැත්ත, මඟ නොමඟ, යුතු අයුතු දේ යනාදිය මසැසින් නොව පැඤැසින්ම දත යුතු වේ. ලෝකයා සසර ප්‍රමාද වන්නේ ඇයි? මසැසින් දකින සියල්ල නිත්‍ය, සුඛ, සුභ වශයෙන් ගන්නා බැවිනි. ලෝකයේ යථා ස්වභාවය වූ අනිත්‍ය දුක්ඛ අනාත්ම ධර්මයන් වටහා ගත යුත්තේ පැඤැසෙනි. ප්‍රඥ චක්ඛුසෙනි.

# කවරයේ කතාව



මද්‍රරට සාගල නුවර රජ කුලයෙහි විශිෂ්ට රූපශ්‍රීයෙන් යුත් ඛේමා නම් කුමරියක් විය. ඇය වැඩි විය පැමිණි කල් හි බිම්බිසාර මහ රජුගේ මෙහෙසිය වූවා ය. ඇය තම රූපශ්‍රීය පිළිබඳව මත්ව සිටියා ය. බුදුරජාණන් වහන්සේ රූපයට නිග්‍රහ කරනවා යැයි අසා බුදුරජාණන් වහන්සේ හමුවට නො ගියා ය.

බිම්බිසාර මහ රජු තම දේවිය බුදුරජාණන් වහන්සේ හමුවට යැවීමේ අදහසින් උපායක් යොදමි යැයි සිතා වේළුවනයේ අලංකාරය පිළිබඳව වර්ණනා ගීතිකා ගායනා කරවන ලද්දේ ය. ඒ ගී ඇසූ බිසවට වේළුවනය පෙර නොදුටුවාක් මෙන් හැඟී වේළුවනය දැකීමේ සිත් පහළව එහි ගියා ය.

බුදුරජාණන් වහන්සේ බැහැ නො දැක ආපසු එන්නට සැරසුණොත් බලහත්කාරයෙන් හෝ ඇය බුදුරජාණන් වහන්සේ වෙතට යැවිය යුතු බව මහ රජු රාජපුරුෂයන්ට අණ කළේ ය.

දේවිය වේළුවනයේ සිරි බලා ඇවිද බුදුරජාණන් වහන්සේ වෙතට නොගොස් ආපසු එන්නට හැරුණා ය. මහ රජුගේ අණ පරිදි රාජපුරුෂයන් දේවිය බලහත්කාරයෙන් බුදුරජාණන් වහන්සේ වැඩ සිටිනා ස්ථානයට රැගෙන ගියේ ය.

බුදුරජාණන් වහන්සේ ඛේමා දේවි තමා වෙත එනු දැක දෙවඟනක් බඳු ස්ත්‍රියක් ඍද්ධියෙන් තමන් වහන්සේට විජිනිපතක්ගෙන පවන් සලන්නා සේ ඛේමා දේවියට පෙනෙන්නට සැලැස්සූ සේක. ඛේමා දේවිය එය දැක දෙවඟනක් බඳු වූ රූපශ්‍රීය ඇති ස්ත්‍රීහු බුදුරජාණන් වහන්සේ සමීපයේ සිටිත්, මම මේ අයගේ මෙහෙකාරකමට වත් වටින්නේ නැති තරම් යැයි සිතීය.

බුදුරජාණන් වහන්සේ රූපශ්‍රීයට නිග්‍රහ කරන බවට රටේ පවත්නා කතාව බොරු චෝදනාවක් යැයි ද ඛේමා සිතුවා ය. ඒ වගේ ම අර ස්ත්‍රී රූපය දෙස ම බලාගෙන සිටියා ය. ඛේමා දේවිය බලා සිටිය දී ම බුදුරජාණන් වහන්සේගේ අධිෂ්ඨානය පරිදි අර ස්ත්‍රී රූපය ප්‍රථම වයස ක්‍රමයෙන් ගෙවා මධ්‍යම වයසට ද, එය ද ඉක්මවා මහලු වයසට ද පැමිණ හිසකෙස් පැසුණු සම රැලි වැටුණු විරූප වූ මැහැල්ලක් විය. විජිනපත ද හැර දමා බිම ඇද වැටුණාය. ඛේමා ඒ දෙස බලා සිට මෙබඳු වූ රූමත් ශරීරයක් පවා මේ ආකාරයෙන් විනාශයට පැමිණියේ ය. මගේ ශරීරයත් මෙසේ ම වන්නේ නොවේ දැයි කල්පනා කළා ය. ක්‍රමයෙන් ඛේමාගේ රූප මදය හීන විය.

ඛේමා දේවියගේ නුවණ මුහුකුරා ගිය බව දුටු බුදුරජාණන් වහන්සේ ශරීරයේ පිළිකුල ප්‍රකාශ කොට ධර්මය දේශනා කළ සේක. බුදුරජාණන් වහන්සේගේ ධර්මය ඇසූ ඛේමාගේ කෙලෙස් බර ගතිය තුනීව නීරෝගී වූ සිත් ඇත්තියක් බවට පත්විය.

බුදුරජාණන් වහන්සේ ඇයට මහානිදාන සූත්‍රය වදාළ සේක. ඒ ධර්ම කතාව ඇසූ ඛේමා සෝවාන් විය. ඇය පසුව රජුගෙන් අවසර ගෙන පැවිදි වූවා ය. එයින් අඩ මසක් ගිය තැන පහනක් දැල්වීමත්, නිවීමත් දැක ඒ සිතිවිල්ල අරමුණු කොට විදසුන් වඩා රහත් වූවා යැයි සඳහන් වේ.

- දීපා

## පෝය ලබන සහ ගෙවෙන අයුරු

### පොසොන් අමාවක

ජූලි 09 සිකුරාදා පූර්වභාග 05.16 අමාවක ලබා 10 සෙනසුරාදා පූර්වභාග 06.46 ට ගෙවේ. සිකුරාදා සිල්

### ඇසළ පුර අටවක

ජූලි 17 සෙනසුරාදා පූර්වභාග 04.34 පුර අටවක ලබා 18 ඉරිදා පූර්වභාග 02.41 ගෙවේ. සෙනසුරාදා සිල්.

මුලතිව් වඩ්ඩමාන පර්වත විහාරයේ
මුරකුටිය ඉදිකර ගැනීමට
මහජන ආධාර පතයි.
ගල්ගමුවේ ශාන්ත බෝධිතෙර
0774578791
0772036151

O පොසිටිව් වකුගඩුවක්
අවශ්‍යයි
0722239725

පන්සලක් අවශ්‍යයි
අත්හැර දමන ලද පන්සලක් හෝ ඉඩම් කැබැල්ලක් පරිත්‍යාග කළ හැකි අයෙක් සිටීනම් දන්වන්න
077 3410270,
077 3586421

'O' පොසිටිව් වර්ගයේ වකුගඩුවක් රෝගියකුට ඉතා ඉක්මණින් අවශ්‍යයි.
HLA වාර්තා තිබේ නම් වඩාත් සුදුසුය.
අමතන්න : 01122-40183,
077-6729881



# අල්ලාගන්නා දෙය අත්හැරෙන බව නිතර සිතන්න

**දුර්ලභව ලැබූ මේ මනුෂ්‍ය ජීවිතයේ ලැබිය හැකි උතුම්ම පලය දහම් ඇස පාදාගැනීම ය. එහි දී සසර දුකින් මිදීම සඳහා සතර සම්‍යක් ප්‍රධන් වීර්යය පවත්වා ගත යුතු බවට නිතර මෙනෙහි කළ යුතු වේ.**

පස්, පව්, දස අකුසල්වලින් මිදෙන්නට යැයි මොනතරම් පැවසුවද වැඩි පිරිසක් ඒ ගැන නොසිතන්නේ කුමක් නිසා ද? එයට හේතුව නම් දුර්ලභ ව ලබා ඇති මෙම මනුෂ්‍ය ජීවිතයේ වටිනාකම අවබෝධ කර නො ගැනීම ය. භාග්‍යවතුන් වහන්සේ දේශනා කොට වදාළ අයුරින් තිස් එකක් වූ සක්වල උපත ලබා ඇති සියලු ම සත්ත්වයෝ ඔවුන්ගේ අතීත සසරෙහි උපත ලබා ඇත්තේ සතර අපායේ ය. සතර අපායේ ඉපිද ඉන් නිදහස්වීමට නොහැකිව කල්ප ගණන් දුක් විඳ ඇත්තෝ ය. කුකුළන්, ගවයන් වැනි සතුන් ලෙස ඉපිද, ගෙල සිඳී ගලාගිය රුධිරය කෙතරම් ද, එනම් සිව් මහා සාගරයේ ජල කඳටත් වඩා වැඩි බවයි ධර්මයේ සඳහන් වන්නේ.

ඒ වගේ ම ප්‍රේත විෂයයෙහි ඉපිද අපවිත්‍ර දෑ ආහාරයට ගනිමින් වචනයෙන් කියා නිමකළ නොහැකි තරම් දුක්විඳ ඇත්තේ ය. “දුල්ලභංච මනුස්සත්තං“ ඒ නිසයි ධර්මයේ සඳහන් වන්නේ මනුෂ්‍ය ජීවිතයක් ලැබීම ඉතා දුර්ලභ බව ඔබට මට පියවි ඇසින් දැක ගත හැකි තිරිසන් අපාය දකින විට එය අවබෝධ නොවේ ද?

ඉතා ම දුර්ලභ වූ මනුෂ්‍ය ජීවිතය ලබා ඇති බව සිහිපත් කොට ඉන් උතුම් ප්‍රයෝජන ලැබීමට වීර්යය ආරම්භ කළ යුතු ය. අප සම්මුතියෙහි පිහිටා සම්මත ලෝකයෙහි ඉගෙනීම, රැකියාව, විවාහය, දරුවන් මෙන් ම ගේදොර ආදී කටයුතු සීලයෙහි පිහිටා පවත්වා ගැනීම ගෘහස්ථ ජීවිත ගත කරන අයට අනුමත ය. මේවා ලබා ගැනීමේ දී පස් පව්, දස අකුසල්, නොකළ යුතු ය. ඒ අතීත සසරෙහි අපමණ දුක් නැවත නැවත සිහිපත් කිරීම හා ලැබූ දුර්ලභ මනුෂ්‍ය ජීවිතය ගැන සිහිපත් කිරීමෙන් ය.

ලෞකික වශයෙන් අප සීලයෙහි පිහිටා පැවැත් ම පිණිස කටයුතු කරන්නේ ද පරමාර්ථ ධර්මයට අනුව ලැබූ ජීවිතයෙහි සහ බියකරු සසරෙහි යථා ස්වභාවය අමතක නොකළ යුතු ය.

අප බුදුරජාණන් වහන්සේ විසින් මහා කරුණාවෙන් සහ මහා ප්‍රඥාවෙන් යුතුව දේශනා කළ ඒ දහම් මඟට යොමුවීම ද, එහි ඵල ලැබීම ද කළ යුතු ම දෙයකි. මෙම දහම් මඟට යොමු වී සහ ඵලයන් ලබා ගැනීම ද කල් දැමීමට ද නොහැකි ය. එයට හේතුව වන්නේ සම්මතයෙහි අප අවුරුදු සියයක් ආයුෂ ඇත්තේ ය යනුවෙන් පැවසුවත්, බොහෝ පිරිසකට සියයක් ආයුෂ විඳින්නට අවස්ථාව නොලැබේ. එනම් මව් කුසක කලලය හටගත් මොහොතේ සිට ඕනෑ ම මොහොතක ජීවිතයේ මරණය, එනම් අවසන් මෙහොත විය හැකි බැවිනි.

මේ තිබෙනවා ය යැයි පවසන අවුරුදු සියය ද ලෙඩවීම්, දිරාගෙන යෑම් හා ප්‍රියයන්ගෙන් වෙන්වීම්, අකමැති අරමුණු සමඟ ගැටීම්, කැමති අරමුණු ඉටු නොවීමෙන් ඇතිවන ශෝකය, හඬා වැළපීම්, දුක්ඛ දෝමනස්ස සමඟින් ගත කරන්නට සිදුවේ.

කුමන ආකාරයේ ආයු ශක්තියක්, කර්ම ශක්තියක් අපි රැගෙන ආවේ ද යැයි නොදනිමු. කවර ආකාරයේ ලෙඩ දුක් මෙම දෙතිස් කුණපයන්ගෙන් පිරුණු මේ ශරීරයේ ඇත්තේ ද හටගන්නේ ද යන්න නිශ්චිත ව පැවසිය නොහැකි ය.

අපිරිසුදු සිතින් යුතුව සිතනා, කියන, කරන සියලු දෙය ම නිසා දුක් සහගත ප්‍රතිවිපාක ලැබෙන්නේ ය. පිරිසුදු සිතින් සිතන, කියන, කරන දෙය නිසා යහපත් වූ පල විපාක ම ලැබෙන්නේ ය.

මෙලොව සියලු සත්වයින් ම කර්මය දායාද කොට ගන්නේ ය. කර්ම සිදු වන්නේ ඒ ඒ මොහොතේ බවත් සිහි කරමින්, එළඹ සිටින මෙහොතෙහි පිරිසුදු සිත ම පවත්වා ගැනීමට අධිෂ්ඨානයක් කර ගනිමු. ඒ වගේ ම අප සිතින් යමක් සිතා වචනයෙන් එය පිට කිරීමට පෙර, ක්‍රියාවෙන් හැසිරීමට පෙර එය තමාටත් අන් අයටත් යහපතක් හෝ අයහපතක් සිදුවන්නේ දැයි ධර්ම මාර්ගය අනුගමනය කරන බුද්ධ ශ්‍රාවකයෙක් ලෙස මෙනෙහි කරන්න.

තමන් කරන ක්‍රියාව තමාට හෝ අන් අයට යහපතක් සිදුවේ නම් සුදුසු පරිදි සුදුසු කාලයෙහි සිදු කරන්න.

අන් අයට අයහපතක් එයින් සිදුවේ නම් “මුතු මැණික්,

රත්තරන්, දෙනවා යැයි කීවත්, “කෝටියක“ මුදලක් ලැබෙනවා යැයි කීවත් නොකිරීමට තරම් ධර්ම මාර්ගයෙහි ස්ථිර අධිෂ්ඨානයක් තමා තුළ ඇත්දැයි සිතා බලන්න.

තමන් විසින් සමාදන් වන්නා වූ සීලය, වචනයට පමණක් සීමා නොකරන්න. ඒ ඒ සිල්පදවල අර්ථය දැන සීලය මනාව ආරක්ෂා කරන්න. එය සමාධියට මෙන් ම සම්‍යක් ප්‍රඥාවට බලවත් සේ උපකාර වන අයුරු සිහිපත් කරන්න.

ප්‍රඥාව සීලය නිසා පිරිසුදු වේ. සීලය ප්‍රඥාව නිසා පිරිසුදු වේ. සීලයෙහි පිහිටියා වූ ඇත්තාට සම්‍යක් ප්‍රඥාව ඇත. සම්‍යක් ප්‍රඥාවෙහි පිහිටියා වූ ඇත්තාට ආර්යකාන්ත සීලය ඇත.

තමාටත්, අන් අයටත් හානියක් නොවන නිවැරැදි ජීවනෝපය මාර්ගයන්හි පමණක් ම නිරත වන්න. අධර්මයෙන් උපයන ධනය මහා ගින්දරක් වැනි වූ උණු වූ ලෝදියක් වේ.

එය තමාට පමණක් නොව එය පරිහරණය කරන අන් අයට ද දෙලොවදී ම කටුක විපාකයන්ට මුහුණ දීමට සිදුවන බව සිතන්න. ඔබ, ඔබ විසින් රකින්නා වූ සීලයේ පිරිසුදු බවත්, එහි ආනිසංසත් මෙනෙහි කරන්න.

“අප්පකිච්ච සල්ලහුකවුත්ති“ නම් මෙත්ත සූත්‍රයෙහි පෙන්වා දෙන ආකාරයෙන් අවබෝධයෙන් යුතුව අල්ප වූ කටයුතු මෙන් ම සරල සැහැල්ලු ඇවතුම්, පැවතුම් ඇති පහසුවෙන් පෝෂණය කළ හැකි පුද්ගලයකු වන්න.

යම් දෙයක ස්වල්පය බැගින් හෝ අයිතිය අත්හැරීමට, පරිත්‍යාග කිරීමට යොමු වී ඔබගේ ම සිතෙහි ස්වභාවය පිළිබඳව තේරුම් ගැනීමේ අවස්ථාවක් කර ගන්න.

නිතර අන් අයගේ දෙස් දකින, අන් අය විවේචනය කරන කෙනෙක් බවට පත් නොවන්න. තම ජීවිතයේ යමෙක් “බැන්නා, දෙස් කීවා, තමා සතු දේ ගත්තා යැයි සිතේ පවත්වා ගන්නා වූ සියලු අදහස් සම්පූර්ණයෙන් ම ඉවත් කොට දමන්න. එසේ නොකරන්නේ නම් එම සිතිවිලි ඔබව සුගති මාර්ගයෙන් බැහැර කොට දුගති මාර්ගයට යොමු කරවන බව සිහිපත් කරන්න.

මේ පවත්වා ගන්නා වූ ගමනේ හමු වී මගේ යැයි ජීවිතයේ අල්ලාගෙන සිටිනා පුද්ගලයින් මෙන් ම විවිධ වූ දේ කෙරෙහි ඇති කර ගන්නා බැඳීම්වල තාවකාලික බව හා නිසරු බව නුවණින් අවබෝධ කරගන්න. ඔබ සිතින් මෙන් ම දෑතින් අල්ලාගෙන සිටිනා සියලු දේ මරණයෙන් අත්හැරෙන බවත්, ඒවා මුල් කරගෙන ජීවිතය පුරා අකුසල් රැස්කර ගැනීමෙන් පලක් නොවන බවට නිරතුරුව ම සිත පුරුදු කරන්න.

දීපා පෙරේරා

# ගැමුණු කුමරු අසහනයට පත්වෙයි

**දුටුගැමුණු මහ රජතුමා 38**

**“වේළුසුමන, මා දන්නා ශාස්ත්‍රයට අනුව කාවන්තිස්ස රජතුමා මේ වන විට මියගොස්. මා මේ සූදානම් වෙන්නේ හෙට ඒ ආදාහන උත්සවයට සහභාගී වීමට මාගමට යාමටයි. දුටුගැමුණු කුමාරයාත් සමඟ යාමට තිබුණා නම් හොඳයි. ඒ නිසයි මගේ ගමන ප්‍රමාද කළේ. ගැමුණු කුමාරයාගේ තොරතුරු දන්නා සෙබලෙකු ඌරුපැලැස්සට පිටත් කර යැව්වා. “**

“දාව ආචාර්යවරයාගේ වදන් ඇසූ මට ඉවසා ගත නොහැකි දුක් වේදනාවක් ඇති වුවා. වචනයක්වත් කතා කරගන්නට බැරිව කොයිතරම් වේලාවක් බලාසිටියාදැයි මා දන්නේ නැහැ. පියවි සිහිය ලැබුණු සැනින් මා මෙහි පැමිණියා.“

“වේළුසුමන, නුඹට මෙහි එන්නට කීවේ තොප යවා ගැමුණු කුමාරයා හැකි ඉක්මනින් මෙහි ගෙන්වා ගැනීමටයි. නමුත් දැන් අපේ බලාපොරොත්තු සියල්ල බිඳ වැටෙනවා. ඉදිරි දවස් කිහිපය තුළ සිදුවිය හැකි අනපේක්ෂිත සිදුවීම් ගැන සැලකිලිමත් වෙමු.“

“මහා තෙරුන්වහන්ස, කැලණියට මේ පුවත සැලවුවහොත් ගැමුණු කුමාරයා මෙහි පැමිණිය හැකියි.”

“නමුත් වේළුසුමන, කාවන්තිස්ස රජතුමාගේ අභාවය පිළිබඳ අප කිසිවකුට දැනුම් දෙන්නේ නැහැ.”

“පිණ්ඩපාතික තිස්ස තෙරුන් වහන්සේ කැළණි විහාරයේ වැඩ සිටී නම් දුටුගැමුණු කුමාරයා කැලණියට ගියේ නම් මෙම පුවත ස්ථිරවම කුමාරයාට ලැබේවි. අවශ්‍ය නම් මට හෙට උත්තිය රජ මාළිගයට යන්නට පුළුවන්.“

“එම උත්සාහයෙන් ඵලක් නැහැ. හෙට හවස රජතුමාගේ ආදාහන කටයුතු සිදුකරනවා.“

“වේළුසුමන, කුමාරයා සොයා ගැනීමට ඔබ ගෙන ඇති උත්සාහය අගෙයි. දැන් අපට කරන්නට තිබෙන්නේ එන හැටියකට මුහුණ දීමටයි. හැම දේම වෙන්නේ හොඳට යැයි සිතමු. ඔබට හැකි නම් තිස්ස කුමාරයා, දුටුගැමුණු කුමාරයාට විශ්වාසවන්තව තබා ගැනීමට වැයම් කරන්න. තිස්ස කුමාරයා වෙනස් වුවහොත් අපේ සැලැස්ම වසර ගණනාවකින් ආපස්සට යනවා. එය අපට විශාල පාඩුවක්.“

“මේ පිළිබඳව අද රාත්‍රී හතට සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වෙන රැස්වීමේදී සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙනවා.“

“වේළුසුමන දැන් ඔබ ගොස් අනෙක් සෙනෙවිවරුන් සමග එකතු වී හෙට පැවැත්වෙන ආදාහන කටුතු සංවිධානය කරන්න.“

“රාජ්‍ය සම්ප්‍රදායට අනුව දුටුගැමුණු කුමාරයා සොයා ගැනීමේ වගකීම පැවරී ඇත්තේ අමාත්‍ය මණ්ඩලයටයි. දාව ආචාර්යතුමා පැමිණි විගස අතික් අය සමග කතාබහට පෙර අප හමුවිය යුතු බව පවසන්න.”

වේළුසුමන මාහිමිපාණන් වහන්සේට වැඳ අවසර ගෙන නික්මුණේය. සිය අසු පිටට නැගී වේගයෙන් අසු ධාවනය කරන දෙස බලා සිටි උන්වහන්සේලා වේළුසුමන සිදුකරන අප්‍රකට සේවය ගැන ප්‍රසාදයෙන් යුතුව කතා කළහ.

එළැඹෙන පසළොස්වක පුන් පොහෝ දින පුසුල්පිටිය රජ මහා විහාරයේ මහා පිංකම කොටගේපිටිය ගම්මානයේ තරුණ ගොවි නායක වූ හිද්දලයා විසින් භාරගෙන ඇති බව කොත්මලේ ප්‍රදේශය පුරා ප්‍රචාරය විය. මේ නිසා එදිනට පෙහෙවස් සමාදන් වීම සඳහා අවට ගම්මානවලින් උපාසක උපාසිකාවන්ගේ තිස් දහසකට අධික ප්‍රමාණයක් පැමිණෙන බව ආරංචි වී තිබිණි. සියලු පිරිසට දානය පිරිනැමීම භාරගෙන තිබුණේ ඌරුපැලැස්සේ ගම ගෙදර විසින්ය.

මෙදින ධර්ම දේශනය උසස්ම අයුරින් සිදුකිරීමට හිද්දලයා බලාපොරොත්තු විය. ඒ අනුව පුසුල්පිටිය විහාරාධිපතින් වහන්සේගේ ආරාධනාව අනුව චිත්තගුත්ත මහතෙරුන් වහන්සේ වැඩම කරවීමට කැමති වීම ගැන සියල්ලෝම සතුටට පත්වූහ. එදිනට දෙදහසකට වඩා වැඩි මහා සංඝරත්නය වැඩම කරන බව ඌරුපැලැස්සේ ගම ගෙදරට දන්වනු ලැබූහ. ඒ ගිලනප්පස දහවල් දානය, පිරිකර ආදිය කල්වේලා ඇතිව සූදානම් කරගත යුතු බැවිණි.

පින්කමේ ප්‍රධාන දායකයා හිද්දලයා වුවද මුළු ගම්මානයම පින්කමේ කොටස්කරුවන් කරගැනීමට ඌරුපැලැස්සේ ගමරාලට වුවමනා විය. මේ හැම දෙයකටම පෙර හිද්දලයාගේ උපදෙස් ලබාගැනීම අවශ්‍යය. එහෙත් මේ සම්බන්ධව ඔහුගේ එතරම් උනන්දුවක් නොපෙනෙන විට ගමරාළ කලබලයට පත්විය.

ගම හාමිනේ මේක බරපතළ වැඩක්. මේ වගේ විශාල පින්කමක් අහල ගම් හතකවත් කෙරිලා නැතිලු. මේ පින්කමට මහා සංඝයා වහන්සේලා දෙදහසක් පෙහෙවස් සමාදන් වන උපාසක උපාසිකාවන් තුන්දහසක් ඊට අමතරව පිංකම බලන්න ඇත ගම්වලින් එන පිරිස ඇතුළු සැමටම සංග්‍රහ කරන්නට ඕනෑ. මේ හැම කටයුත්තක්ම අඩුවක් පාඩුවක් නැතිව මට කෙරෙන්නට ඕනෑ.”

“සංඝයා වහන්සේලාගේ දානාදිය වෙනම පිරිසකට පවරන්න. හිද්දලයා ගමේ තරුණ ගොවි නායකයා ලෙසට පළමු වරට කරන මේ වැඩේ අපි උපරිමයෙන් කරමු. දානෙට අවශ්‍ය දේවල් සියල්ල රැස්කර ගන්නට ගම හාමිනේට පුළුවන්. ගමේ අයත් අවසර ඉල්ලනවා දානෙට කෑම, බීම, පිරිකර ගෙන එන්නට. ඒ අයටත් ඉඩක් දෙන්නට ඕනෑ. හැමෝම සම්බන්ධ කරගෙන කරන පිංකම්වල ආනිසංස වැඩියි.”

ගමරාලගේ උනන්දුව ගැන හාමිනේ සතුටට පත්වූවාය. දුවයි බෑනයි දෙදෙනාත් පිංකමට උනන්දු කරවන්නට ඕනෑයි ඇයට සිතිනි.

“දැන් දැන් හිද්දලයාට ගමන් බිමන් වැඩියි. හිටි ගමන්ම දින දෙක තුන අතුරුදහන් වී සිටියි. යහළු පිරිසත් වැඩියි. නිතර බර කල්පනාවට වැටෙයි. මේ පළාතේ අස්වැන්න නෙළන්නේ දුටුගැමුණු කුමාරයාගේ යුද්ධෙට දෙන්නලු. මේ පළාතේ තරුණයෝ සෑහෙන ප්‍රමාණයක් ගිරි නුවර යුද කඳවුරට සම්බන්ධ වෙලා. හිද්දලයා ඔවුන්ට කඩු හරඹ පුහුණු කරනවාලු.”

“අපේ හිද්දලයාට යුද්ධයට යන්න හිතිලද දන් නැහැ. අනේ එහෙමනම් වෙන්න එපා. ඒ කොලුවා මේ ගමට මොන වාසනාවක්ද?”

“ඒ කොලුවාට මොන යුද්ධයක්ද? මේ මහපොළවත් එක්ක කරන යුද්දෙ හොඳටම ඇති. පුරන් වැටුණු කුඹුරු යායක් අස්වැද්දුවේ කවුද? හිද්දලයා ඇත ගැසූ කිසි වැඩක් වැරදුනේ නැහැ.”

ඒ ඇසූ ගමරාල සහ ගම මහගේ සිනාසුණහ. ඒ ඔවුන්ගේ සතුටය.

පසුදා උදෑසනම හිද්දලයා කුඹුරට ගියේය. ඔහු යන්නට කලින් රන් මැණිකාට මෙසේ කිවේය.

“අද කුඹුරේ වැඩි වැඩක් නැහැ. මම දහවල් මොණරාගලට යනවා. දහවල් බත කුඹුරට ගේන්න. ඉර බහින්න කලින් මම ආපසු එනවා.”

කුඹුරට ගොස් වතුර බැඳ හිද්දලයා ගියේ මොණරාගලටය. එහි යන විට අසුන් පිට හිඳගත් තරුණයන් සතර දෙනෙකු කඩු හරඹයක යෙදෙනු දුටු හිද්දලයාගේ සිතෙහි සතුටක් ඇතිවිය.

“කඩු ශිල්පයේ දක්ෂකම් පෙන්වන අය ළඟදීම කඳවුරට එක්කරගෙන යනවා. ඒ අය ඇතුන් අසුන් පිටේ කඩු හරඹ පුරුදු වීමටත් අවශ්‍යයි.“

“කොච්චර හොඳද? අපි ළඟදීම යුද කඳවුරට එන්නම්.”

“අපට අශ්ව ශිල්පය කියාදෙන වේළුසුමන යෝධයා හිද්දලයා ගැන ඇහුවා. ඔබව සොයන්නට ඌරුපැලැස්සටත් ගිහින්. ඔබට හදිසි පණිවිඩයක් දෙන්නට විය හැකි එහෙම සෙව්වේ.”

“මම පසුගිය දවස් වල දුර ගමනක් ගිහින් හිටියේ. දවස් තුනක් ගෙදර හිටියේ නැහැ. ආයෙත් සෙව්වොත් කියන්න මම රන්තලාව කුඹුරේ සිටිනා බව. කඩු හරඹය බොහෝම ප්‍රවේසමෙන් පුහුණු වන්නට ඕනේ. මම නැවත මෙහි එන්නේ පෝයදාට පසුවදායි. එහෙනම් මම යනවා.”

හිද්දලයා ආපසු එන ගමන් කල්පනාවට වැටුනේය. ඔහුගේ සිතට මහත් අසහනයක් දැනෙන්නට විය. වේළුසුමන මා සොයාගෙන ඌරුපැලැස්සට ගියේ ඇයි? කුමක්ද මේ හදිස්සිය?”

“මැණියන්ගේ හදිසි පණිවුඩයක්ද? පියාණන් තරමක අසනීප තත්වයෙන් පසුවන බව වේළුසුමන පැවසුවා මතකයි. පියාණන්ගේ අසනීපය වැඩිවෙලාද?” තමන් තුළ ඇති අසහනයට හේතුව කුමාරයාට සිතාගත නොහැකි විය. සුසුල්පිටිය රජමහා විහාරයේ පිංකම අවසන් වූ විගස ගිරි නුවරට ගොස් දාව ආචාර්යතුමා හමුවී ඔහුත් සමග මාගම යා යුතු බව කුමාරයා තීරණය කළේ ය.

අයන්ති විතාන

## සිරි සදහම් පැන විසඳුම්



බුදුසරණ

සතියේ ප්‍රශ්නය - 57

සතර පෝදාට ම පිදෙන බුදුසරණ පුවත්පතෙහි පළවන දහම් ලිපියකින් සැකසෙන ප්‍රශ්නයට නිවැරැදි පිළිතුරු ලියා එවා ගුණසේන සහ සමාගමෙන් පිරුවානා පොත් වහන්සේ නම් යුත් "මහ පිරිත් පොත් වහන්සේ" හිමිකර ගන්න.

සතිපතා ජයග්‍රාහකයන් පස් දෙනකුට ත්‍යාග තිළිණ කෙරේ.

**බෞද්ධයාගේ අත්පොත ලෙස හැඳින්වෙන ධර්ම ග්‍රන්ථය කුමක්ද?**

පිළිතුර : ..............................

නම : ..............................

නිවසේ ලිපිනය : ..............................

..............................

දුරකතන අංකය : ..............................

ඔබේ පිළිතුර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

ඇම්. ඩී. ගුණසේන - බුදුසරණ සිරි සදහම් පැන විසඳුම්, බුදුසරණ පුවත්පත, ලේක්හවුස්, කොළඹ 10

# සීල සමාදානය ලෝක මානයට ද?



**සීලය යනු කය වචන දෙකෙහි සංවරය යි. ලෝකය ශිෂ්ටාචාරගත වූ මොහොතේ සිට කුමන හෝ පාලන ක්‍රමයක් පැවතුණි. බුදුදහම ලොව පහළවීමටත් පෙර සිට ම විවිධ ඉගැන්වීම් තුළ සීල ප්‍රතිපදාවන් දැකිය හැකි ය. ජෛන ශාසනයෙහි පංචවිරතිය ඊට කදිම නිදසුනකි. එහෙත් වර්තමානය වෙද්දී සීලය, එහි භාවිතය, සමාදන්වීම කියන කාරණා තුළදී සීලයෙන් අපේක්ෂිත අරමුණු ඉටුවනවා ද යන්න සැක සහිත ය.**

එසේම සීලය පිළිබඳ දුර්මතයන් ද සමාජගත වී ඇති ආකාරයක් දක්නට ලැබේ. ඕනෑම ඉගැන්වීමක් වඩාත් ඵලදායක වන්නේ එය ප්‍රායෝගික තලයේ දී ලබාදෙන යහපත මත ය. එසේ නොමැතිව ඉගැන්වීම් ටොන් එකක් තිබුණත් භාවිතය අංශුව නම් එම ඉගැන්වීම් සමාජ යහපතට යොදාගත නොහැක. සීලය ද ඒ ආකාර ය.

## සිල් සමාදන් වීමට සුදුසු කාලයක් තිබෙනවා ද?

වර්තමානය වෙද්දී ඇතැම් තැනක සීල සමාදානය හුදෙක් ම සම්ප්‍රදාය ආරක්ෂා කිරීමකට සීමා වී ඇත. අපේ ඇවතුම් පැවතුම් යම් හෝ ප්‍රමාණයකට නියාමනය කිරීම සීලයෙහි කාර්යය යි. එසේම සිල් සමාදන් විය යුතු කාලය ද ඇතැම් අය විශ්වාස කරනුයේ වයසට යාමේ දී වඩා යෝග්‍ය බවයි. එහෙත් සත්‍ය වශයෙන් ම සිල් සමාදන් විය යුත්තේ තරුණ හා මැදිවියේදී ය. මන්දයත් වයසට යාමේ දී සියල්ලෝ ම අකමැත්තෙන් වුව ද සීලවන්තයෝ ය. එය පංච සීලයට ආරෝපණය කොට බැලුවහොත් වඩාත් හොඳින් තේරුම්ගත හැකි ය. වයසට යාමේ දී ප්‍රාණඝාත සිදුකිරීමට සිතුණත් අත ඉස්සීමටවත් බැරිනම් එතැනදී ප්‍රාණඝාතය සිදු නොවේ. අමුතුවෙන් ශික්ෂාවක් එතැන දී අවශ්‍ය නොවේ. අනෙක් ශික්ෂාපදයන් ද එසේම ය. මෙවැනි ශික්ෂාපද අවශ්‍ය වන්නේ තරුණ සහ මැදි වයසේ දී ය. එවැනි වයස් කාණ්ඩයක කෙනකුට මෙවන් සිතිවිල්ලක් පැමිණි කල එය පාලනයට පාණාතිපාතා ශික්ෂාපදයෙහි ලොකු අවශ්‍යතාවක් ඇතිවේ. එවැනි කාලයක දී නො රකින ශික්ෂා පදයන්ගෙන් ඇති පලක් වයසට යාමේ දී තේරුමක් නොවේ.

## සීලය කැඩුණොත්

එසේම සීලය හැමවිට ම සමාදන්වීම අවශ්‍ය නොවේ. ශික්ෂාවන් එකවරක සමාදන් වී වැඩි කාල වේලාවක් රැකිය හැකි නම්, එය වැදගත් වේ. එහිදී ශික්ෂා පද පහෙන් එකක් කැඩුණවිට සියලුම




සිකපද ඡේදනය නොවේ. කැඩෙන ශික්ෂාව පමණක් නැවත සමාදන් වී ආරක්ෂා කළ හැකි ය. සීලයෙහි වෙන වෙනම ශික්ෂා පද සඳහා ආනිසංස පවතී. සාමාන්‍ය තත්ත්වයෙන් ගත් කල එක් එක් ශික්ෂා පදයෙන් සිදුවන යහපත වෙනස් ය. සමස්තයක් හැටියට සියලුම ශික්ෂාපද ආරක්ෂා වේ නම් මුළු සමාජය ම මහත් සාමකාමී බවින් යුතු වේ.

## ප්‍රධාන අරමුණු

පොදුවේ දහමෙහි පංචශීලය අනුදැන වැදෑරීමේ අරමුණ කරුණාව සහ මෛත්‍රිය යි. මෙහිදී කරුණාව යනු දුකින් පෙළෙන අය සුවපත් කිරීම යි. මෛත්‍රිය යනු මුළු සමාජයට මිත්‍රත්වයෙන් සැලකීමයි. පංච ශීලයෙහි වෙන වෙනම ආනිසංස පවතී. කෙනකුට සිල්පද පහම ආරක්ෂා කළ නොහැකි වුව ද එකක් හෝ රැකිය හැකි නම් එය වැදගත් ය. මන්ද යත් රකින ලද ශික්ෂාපදයට අදාළ ආනිසංස ඔහුට හෝ ඇයට ලැබෙන නිසාවෙනි. අනෙක් හතරම කැඩුණා යන පදනම මත ශික්ෂා පද පහම කණ්ඩණය නොවේ.

> ඉගැන්වීම් ටොන් එකක් තිබුණත් භාවිතය අංශුව නම් එම ඉගැන්වීම් සමාජ යහපතට යොදාගත නොහැක. සීලය ද ඒ ආකාර ය.

## දීර්ඝායුෂ ලැබෙන හැටි

පරමත්ථජෝතිකා නම් ඛුද්දකපාඨ අට්ඨකතාවේ දී මෙම ශික්ෂාපද පිළිබඳ අනුසස් පවතී.

එහිදී ප්‍රාණඝාතයෙන් වැළකීම මත අරෝහපරිනාහ දේහයක් ලැබීම, පොළොවෙහි මනාව පිහිටන යටිපතුල ඇති බව, මෘදු, පිරිසුදු බව, ලෝකයට ප්‍රියවීම, පරිවාර සම්පත්තිය, සුරූපී බව, අල්පාබාධ ඇති බව, ශෝක නොකරන බව, දීර්ඝායුෂ ඇති බව ආදී අනුසස් රාශියකි.

## කැමැති දෑ ලැබීම

මහා ධනවතකුවීම, භව භෝග සම්පත්වලින් ආඪ්‍ය වීම, සම්පත් විනාශ නොවීම, කැමැති දෑ ලැබීම, රජුන් සොරුන් අප්‍රියයන් පැහැර නොගැනීම ගින්නෙන්, ජලයෙන් විනාශ නොවීම උතුම් කෙනකු වීම, නැතැයි කියා දෙයක් නොමැති බව සැපසේ විසීම දෙවන ශික්ෂා පදයෙහි අනුසස් ය.

## සතුරු බිය නැතිවීම

තුන්වන ශික්ෂාපදය රැකීම නිසා සතුරුබිය නොමැතිවීම බොහෝ දෙනාට ප්‍රියවීම, අන්‍ය භය සන්සිඳීම, ස්ත්‍රී භාවයට හෝ නපුංසක භාවයට පත් නොවීම, පිරිපුන් ඉන්ද්‍රියයන් ඇතිවීම, ස්ත්‍රී ලාලිත්‍යයන් පුරුෂ ලක්ෂණ මනාව පැවතීම, විකෘතීන් ඇතිනොවීම.

## ප්‍රිය මනාප ඉඳුරන්


සතරවන ශික්ෂාව රැකීම මත ප්‍රසන්න ඉන්ද්‍රියන් ඇතිබව, මිහිරිවදන් ඇතිබව, ලස්සන දත් ඇති වීම, තරබාරු නොවීම, වඩාත් කෘෂ නොවීම, වඩාත් උස් හෝ මිටි නොවීම, සුවඳවත් මුඛයක්, පිවිතුරු හඬක් ඇති බව, ඇදහිය හැකි වචන ඇතිවීම, මෘදු රතුවන් දිවක් ඇති බව, චපල සහ නො සන්සුන් නොවීම.

## නුවණ වැඩෙයි

අවසාන ශික්ෂාපදය තුළින් මදයට හෝ ප්‍රමාදයට නොයා තුන් කල්හි එළඹ සිටි සිහියෙන් යුක්තවීම, උමතු නොවීම, ඥානවන්ත බව, අලස අඥාන නොවීම, කෙළ තොලු නොවීම, මත් නොවීම, අලස නොවීම, දිවා රෑ මැලි නොවීම, සෘජු විශ්වාසනීය වීම, පවට ලජ්ජා බිය ඇතිවීම, සරු නිසරු දෑ දැන ගැනීම, මහා ප්‍රාඥයකු වීම, නුවණැත්තකු වීම, දක්ෂ වීම ආදියට හේතු වේ.

සික්ෂාපද සියල්ල ම රැකිය හැකි නම් මේ සියලු ආනිසංස ද, එසේ නොමැතිනම් රකින ලද ශික්ෂා පදයට අදාළ අනුසස් ලැබේ. එකදු ශික්ෂාවක් හෝ නොරකින අය අත එක් ශික්ෂාවක් හෝ රැකිය හැකි නම් එය ශ්‍රේෂ්ඨ ය. ලෝක මානයට සමාදන්වන අය අතර සැබෑවට ම අර්ථය දැන සමාදන් විය හැකි වීම ඉතා වැදගත් වේ.

කොළඹ මහානාම විද්‍යාලයේ ආචාර්ය
කොලොන්නාව පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ ධම්මින්ද හිමි**



බුදුසරණ



# රයිගම්පුර ඉතිහාසයේ මං සලකුණු පවසන
# කොතලාවල රාජ මහා විහාරය

ගම්පොළ සහ කෝට්ටේ යුගවල දී පරිපාලනමය සහ ආර්ථික වශයෙන් සුවිශාල වැදගත්කමක් දැක්වූ රයිගම් පුරවරයෙහි පිහිටි පෞරාණික විහාරස්ථානයක් වශයෙන් සැලකෙන කොතලාවල රාජමහා විහාරය කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම හොරණ මහා මාර්ගයේ පිහිටා ඇත.



පානදුර සහ කළුතර තොටමුණුවලට ආශ්‍රිතව පිහිටා තිබීම නිසා වැදගත් වානිජ්‍යමය වටිනාකමක් රයිගමට ලැබුණු බව නොරහසකි. ගම්පොළ යුගයේ ප්‍රභූරාජ හෙවත් මහාමාත්‍ය පදවිය හොබවන ලද අලගක්කෝනාර හෙවත් අලකේශ්වර සෙන්පති පරපුරේ පාරම්පරික නිජබිම ලෙස හඳුනා ගන්නේ රයිගමයි.

උතුරේ ආර්යචක්‍රවර්තී නම් පාලකයාගේ ආක්‍රමණ හමුවේ ගම්පොළ තුන්වන වික්‍රමබාහු රජු ආරක්ෂාව පිණිස පසුබැස පැමිණියේ රයිගමට වීම නිසා මෙහි ආරක්ෂාව ඉහළ මට්ටමක පැවතුණැයි අනුමාන කළ හැකි ය.

සිංහල සාහිත්‍යයේ ප්‍රගමනය උදෙසා අනුපමේය දායකත්වයක් ලබාදුන් වීදාගම මහා මෛත්‍රෙය මාහිමියන් වහන්සේ වැඩසිටි වීදාගම ඝනානන්ද පිරුවන පිහිටියේ ද මීට නුදුරිනි.

වීදාගම මාහිමියන්ගේ අනුග්‍රහයෙන් ළමා කල රැකවරණ ලැබූ සයවැනි පැරකුම්බා නිරිඳුන් වර්ෂ 1412දී ඔටුනු පළඳන ලද්දේ රයිගම දී ය. වර්ෂ 1415 දී කෝට්ටේ රාජධානිය පිහිටුවන තෙක් රටේ රාජධානිය වශයෙන් රයිගම පැවතුණි. මින් සියවසක් ඇවෑමෙන් විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ රාජධානිය කොටස් තුනකට බෙදී ගිය පසු ඉන් එක් කොටසක් වූයේ රයිගම් බණ්ඩාර කුමරු පාලනය කළ රයිගම රාජ්‍යයයි.

රයිගම් බණ්ඩාර කුමරුගෙන් පසු සීතාවක රාජධානියට එක් වූ වකවානුවේ සීතාවක රාජසිංහ රජු සමඟ එක්ව සටන්වලට සහභාගී වූ රයිගම පෙරුම්පුල්ලි නම් අමාත්‍යවරයකු පිළිබඳ සීතාවක හටනේ සඳහන් වෙයි.

රයිගම නගර සීමාවේ පිහිටි කොතලාවල රාජමහා විහාරය ද එම ඉතිහාසයේ කියැවෙන යුගයට අයත් විහාරස්ථානයක් යනු පිළිගැනීමයි. සංඝයා වහන්සේලා වාසය කළ යන අරුතින් ගනේවත්ත විහාරය ලෙස ද හඳුන්වා ඇත. නම්පොතේ සොරණ, විසිදාගම, කොතලාවල, රඹුක්කන, පානදුර දේවාලය...... ආදී වශයෙන් කියවෙන පරිදි කොතලාවල විහාරය නම් මෙම පුදබිමයි.

සියවස් ගණනාවක් පැරණි නා ගස් දෙකක් මින් කලකට පෙර විනාශයට පත් වූ බව කියැවේ.

ගමෙහි පිහිටි වැව කොතලයක හැඩයක් ගත් නිසා කොතල වැව වූ බවත්, කොතලවැව පිහිටි ග්‍රාමය යන අරුතින් කොතලාවල ග්‍රාම නාමය ලැබුණු බවත් ජනප්‍රවාදයේ එයි. රයිගමට නුදුරු වෙහෙරකැටියෙහි තැන වූ දාගැබක කොත් පැළඳ වූ දිනයේ ම සොරුන් විසින් ගලවා ගෙන ගිය බවත්, මෙසේ කිහිප විටක් සිදු වීමේදී රජ අණින් එක් නිර්භීත පුද්ගලයකු



විහාරාධිපති
කොතලාවල විමල මාහිමි

ඉදිරිපත්ව සොරුන් අල්ලා ගත් කල ප්‍රසාදයට පත් රජතුමා කොත ලෑ වල යනුවෙන් නම් කොට මේ ප්‍රදේශය නින්දගමක් වශයෙන් පිරිනැමූ පුවතක් ද ජනප්‍රවාදයේ කියැවෙයි.

මහනුවර යුගයේ අවසාන භාගය වන විට ගොඩගෙදර ගුණරතන සිල්වතුන් වහන්සේ ද තත්ශිෂ්‍ය කරගහමුණේ ආනන්ද හිමියන් ද

> වීදාගම මාහිමියන්ගේ අනුග්‍රහයෙන් ළමා කල රැකවරණ ලැබූ සයවැනි පැරකුම්බා නිරිඳුන් වර්ෂ 1412දී ඔටුනු පළඳන ලද්දේ රයිගම දී ය. වර්ෂ 1415 දී කෝට්ටේ රාජධානිය පිහිටුවන තෙක් රටේ රාජධානිය වශයෙන් රයිගම පැවතුණි.

මෙහි වැඩ සිටි බව සඳහන් වෙයි. වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ගේ ශිෂ්‍ය වූ ගිනිගත්පිටියේ සංඝරක්ඛිත නාහිමියන්ගේ ශිෂ්‍ය වූ මදුරාවල ධම්මදින්න මාහිමියන්ගේ ශිෂ්‍යවරයකු වූ නාරංගස්පිටියේ සුදස්සි මාහිමියන් වහන්සේ මීට නුදුරු පතහවත්ත විහාරයට වැඩම කිරීමෙන් පසු කොතලාවල දායක පිරිසගේ අයැදුම පරිදි කොතලාවල විහාරයට ද වැඩම කරවා ශාසනික සංග්‍රහය ආරම්භ කරවීය.

නාරංගස්දෙණියේ සුදස්සි මාහිමියන්ගේ ශිෂ්‍ය වූ කොතලාවල රාජමහා විහාරාධිපති රයිගම සුමංගල මාහිමියන් වහන්සේ හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් සෙවණේ ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණ කටයුතු සිදු කොට සම්භාවනීයත්වයට පත්වූහ.

විවිධ බාධක හමුවේ මහත් වෙහෙසක් ගනිමින් විහාරස්ථානය ආරක්ෂා කිරීමට රයිගම සුමංගල හිමියන් දක්වන ලද දායකත්වය සුවිශාල ය. ඉන් පසු රයිගම සංඝානන්ද මාහිමි, දීයකඩුවේ ධම්මානන්ද නාහිමිවරුන්ගෙන් පසු වර්තමානයේ දී ශාස්ත්‍රවේදී කොතලාවල විමල මාහිමියෝ විහාරාධිපති පදවිය හොබවති.

විහාරස්ථානයේ වෙහෙර වහන්සේ වර්ෂ 1922 ආරම්භ කොට 1944 වර්ෂයේ කොත් පළඳවා ඇත. මුලින් මෙහි පැවති පෞරාණික බෝධීන් වහන්සේගේ අංකුරයකින් හටගත් බෝධීන් වහන්සේ නමක් වර්තමානයේ විහාර බිමෙහි සැදැහැවතුන්ගේ වන්දනාවට පත් වෙයි.

දෙදහස් පන්සියය වන සම්බුද්ධ ජයන්ති සැමරුම් සිහිවටනයක් වශයෙන් විහාර මන්දිරය ඉදි කොට ඇත. විහාරස්ථ සීමා මන්දිරය 2019 වර්ෂයේ ඉදි කරවා ඇත.

පුරාණ රයිගම් රාජධානියේ උරුමය තහවුරු කරන, සම්භාවනීය පතහවත්ත සඟ පරපුරට අයත් පුදබිමක් ලෙස කොතලාවල රාජමහා විහාරය හඳුන්වා දිය හැකි ය.

දිමුතු පුන්සර කොළඹගේ

වර්ෂ 2021 ක් වූ ජූලි 09 සිකුරාද කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.